sinhalaebooks.com

# අවිහිංසක සිතක් ළඟ

## 01 වන දිගහැරුම

“අපිව දාලා යන්න එපා රංජි. ඇයි මේ වෙලාවේ අපිව තනි කරන්න හදන්නේ”

“මේ දරුවෝ දෙන්නා ගැනවත් ටිකක් හිතන්න රංජි. ඔයාට පිං සිද්ද වෙයි දෙයියනේ”

“මේ දරුවෝ දාලා යන්න එපා....”

රංජිත් සහ නන්දනි මීට වසර දාහතකට පෙර විවාහ බැම්මෙන් බැඳුණේ හැම ස්වාමිපුරුෂයෙක් බිරිඳක් වගේම එකිනෙකාව සදාකල් ආරක්ෂා කරන බවට පොරොන්දු වෙලා.

ඒත් අද ඒ පොරොන්දු දීපු රංජිත්, නන්දනීට මතු වුණු නිදන්ගත රෝගී තත්වයක් හේතුවෙන් ඇගෙන් ඈත් වෙන්න තීරණය කරලා.

“ඔයාට මාව එපා එක හරි. ඒත් මේ ළමයි ගැන හිතන්න රංජි”

“මොන අදෝනාවක්ද මේ. කටවහපන්කෝ ගෑණියේ”

“මං තීරණයක් අරන් ඉවරයි. ආයේ ඒක වෙනස් වෙන්නේ නෑ“

“මටත් කියලා ජීවිතයක් ඕනේ. ගෑණියෙක් ගත්තා මදැයි ලෙඩ මරගාතයක් නේ අරන් තියෙන්නේ“

“අනේ එහෙම කියන්න එපා රංජි. මේ අසනීප මම හිතලා කරගත්තු දෙයක් නෙමෙයිනේ“

“අනේ අපිව දාලා යන්න එපා රංජි පින් සිද්ධ වෙයි ඔයාට“

“එකපාරක් මම කිව්වා උඹට. වහගනින් ඔය කට“

“කෙලී ගැනවත් හිතන්න රංජි. දරුවොයි අසරණ වෙන්නේ මේ දේවල් වලින්“

නන්දනී රංජිත්ගේ අතේ එල්ලි එල්ලි කොච්චර බැගෑපත් වුණත් ඒවා තුට්ටුවකටවත් මායිම් නොකර ඔහු තිබුණු ඇඳුම් පැළඳුම් කිහිපය බෑග් එකට දාගත්තා.

“අම්මා... තාත්තා... ඇයි මේ...“

පාසල් ඇරිලා ගෙදර ආපු අමායා අම්මාගෙත් තාත්තාගෙත් මේ කතාබහට ඇහුම්කන් දීගෙන හිටියේ කාමරේ දොර රෙද්ද අසලට වෙලා.

"අනේ කෙල්ලේ උඹේ තාත්තා අපිව දාලා යන්න හදනවා"

කීප දවසක ඉඳන්ම අම්මාගෙත් තාත්තගෙත් පොඩි පොඩි අඩ අබර අමායාගේ කණට ඇහිලා තිබුණත් ඇය ඒවා ගැන අම්මාගෙන් හාර අවුස්සන්න ගියේ නැත්තේ ඇගේ අසනීප තත්වය නිසාමයි.

ජීවිතේ දිහා කවදාත් උපේක්ෂාවෙන් බලන්න පුරුදු වෙලා හිටපු අමායා ඇගේ තාත්තා ළඟට ගිහින් ඔහුගේ අතේ එල්ලුණා.

"තාත්තා අපිව දාලා යන්නේ අපිට චුට්ටක්වත් ආදරේ නැද්ද තාත්තා"

රංජිට අමායා ගැන දුක නොහිතුණාස නෙමෙයි.

"ආදරේ නැතුව නෙමෙයි මගේ දුවේ"

"එහෙනම් ඇයි අපිව දාලා යන්න හදන්නේ"

“මට උඹේ අම්මාත් එක්ක ජීවත් වෙලා දැන් තිත්ත වෙලා”

“තාත්තා අම්මාට ආදරේ කරලා නෑ නේද ඒ කියන්නේ”

“උඹ මොනවාද බං දුවේ ජීවිතේ ගැන දන්නේ”

“මටත් ජීවිතේ ගැන තේරෙනවා තාත්තා. මං පොඩි දරුවෙක් නෙමෙයි”

“තාත්තා යන්නේ ඇයි කියන්නත් අපි දන්නවා”

ඒ කතාව ඇහුවාම නම් තාත්තාට ලැජ්ජා හිතුණා තමන් ගැනම.

මවගේ ක්ෂය රෝග තත්වය එන්න එන්නම උත්සන්න වෙද්දි පියාට ඇයව කරදරයක් වුණේ වෙනත් කාන්තාවක් සමග ඔහු හාදකමක් පැවැත් වූ නිසා බව මේ තිදෙනාම දන්නවා.

“කමක් නෑ තාත්තා මං මට පුළුවන් හැටියට මගේ අම්මාවයි මල්ලිවයි බලාගන්නවා”

“තාත්තා තාත්තගේ ගමන පරිස්සමෙන් යන්න. අපි තරහා නෑ”

තාත්තාට වැඳලා සමුදුන්නු අමායා ඈගේ මවට තුරුළු වුණා.

"මම මගේ අම්මාව බලාගන්නම්. දුක් නොවී ඉන්න අම්මා"

"හහ්: ඔය ඉන්නේ මහ ලොකු ගෑණියක් බලාගන්න ඔහේලාව. මං යනවා"

තරහින්ම එහෙම කියපු රංජි මේ දුප්පත් පැලින් එළියට බැස්සේ ආපහු ගේ දිහාවත් නොබලා.

තමන්ගෙම ලෙයින් මේ ලෝකේට ජාතක කරපු දරුවෝ දෙන්නෙකුත් එක්කම තමන් ආදරේ කරපු ආදරණීය බිරිඳව මග හැරලා දාලා යන්න තරම් අමායාගේ පියා කිසිම මානුෂික හැඟීමක් නැති පුද්ගලයෙක් වුණා.

අමායා සඳමිණිතැන්න උපතින්ම දුප්පත්කම අත මිට මොලව ගත්තු පවුලක වැඩිමහල් දරුවා. අමායාත්, ඈගේ එක් කුස උපන් වසරකින් පමණ බාල වූ මල්ලි සංඛත්, අමායාගේ ලෝකයක් වටින අම්මාත් මේ දුප්පත් පැල්පතේ තනි වුණේ හිතා ගන්න බැරි විදියට.

"අනේ දුවේ...."

නන්දනී හොඳටම අඬනවා.

"අම්මා දුක්වෙන්න එපා අම්මේ. අපි මේ ජීවිතේ කොහොම හරි දරා ගමු. මට පුළුවන් අම්මාට සලකන්න"

"ඒත් මගේ දුවේ....."

"මම ඉක්මණට රස්සාවක් හොයා ගන්නම් අම්මා"

"අනේ දරුවෝ තව අවුරුද්දයි තියෙන්නේ ඉගෙන ගන්න"

"පස්සේ ඉගෙන ගන්න පුළුවන් අම්මා"

අම්මාට තවත් මුකුත් කියන්න ඉඩ නොතියා අමායා ඇස් වල කඳුළු පුරවගෙන නිවසේ තිබුණු එකම කාමරයට ගියේ පොත් ටිකත් තුරුළු කරගෙනමයි.

### *02 වන දිගහැරුම*

එකම ජීවනෝපාය ලෙස පියා කල කුලී රැකියාවෙන් එදිනෙදා වේල සරිකර ගත් මොවුන්ට මේ වෙනවිට, තමන්ගේ පියාව තිබුණු වගේම ආදායම් මාර්ගයත් අහිමි වෙලා.

මේ දවස් ටිකේම වටපිටින් හොයා ගත්තු මඤ්ඤොක්කා අලයක්, කොස් ගෙඩියක් කාලා ජීවිතේ ගැට ගහගන්න පුළුවන් වුණත් නන්දනීගේ බෙහෙත් මිලදී ගන්න නම් විදියක් අමායාට තිබුනේම නෑ.

පාසල් නිල ඇඳුම අතේ තියාගෙන ඒ දිහා ඔහේ බලාගෙන හිටපු අමායා තීරණයක් ගත්තා. ඉගෙනීමට කොතරම් දක්ෂ වුණත් අම්මාගෙත් මල්ලිගෙත් අනාගතය වෙනුවෙන් ඒ ඉගෙනීම එතනම නතර කරන්න ඇය හිත හදා ගත්තා.

අමායාගේ අසනීපයෙන් පෙළෙන අහිංසක මවගේ බෙහෙත් හේත් වෙනුවෙන් වගේම උසස් පෙල පලමු වසරේ අධ්‍යාපනය ලබන තම මල්ලිගේ ඉදිරි අධ්‍යාපන කටයුතු වෙනුවෙනුත්

තමන්ගේ ජීවිත බලාපොරොත්තු වලට තිත තියන්න අමායා දුකින් වුවත් තීරණය කළා.

"මගේ දුවේ...."

කාමරයට ආපු නන්දනී දැක්කේ පාසල් නිල ඇඳුම දිහාම බලාගෙන ඉන්න තමන්ගේ දරුවාව.

"අම්මා..."

"මේ හැමදේම මගේ පව්කාරකම නිසා දරුවෝ"

අමායා ළඟින්ම වාඩි වුණු නන්දනී ඇගේ ඔළුව අතගෑවේ සැබෑ මව් සෙනෙහසින්මයි.

මේ වගේ දුප්පත් ජීවිත ගත කරන අයගේ එකම බලාපොරොත්තුව තමන්ගේ දරුවන්ට හොඳින් උගන්වන්න. මොකද ඒක තමයි දුප්පත්කමින් ගොඩ යන්න තියෙන එකම අවස්ථාව බව ඒ හැමකෙනෙක්ම දන්න නිසා.

"එහෙම කියන්න එපා අම්මා. මට ඉගෙන ගන්න බැරි වුණාට අපි මල්ලිට කොහොම හරි උගන්නමු"

"අපි කොහොම හරි අම්මාගේ අසනීපේ ඉක්මණට හොඳ කරගන්න බලමුකෝ අම්මා"

“ඒත් මගේ හිත හරි නෑ දරුවෝ”

“දරුවාගෙන් හම්බකරගෙන කන තත්ත්වෙට මම වැටුණේ මගේ පව්කාරකමට“

“එහෙම කියන්න එපා අම්මා. අම්මාට සලකන එක කොහොමද හම්බකරගෙන කනවා කියන්නේ. ඒක වැරදිනේ අම්මා“

“මයේ දුවට වරදින්නේ නෑ කවදාවත් මේ කරන දේවල් වලට දරුවෝ”

නන්දනීට මතක් වුණේ අමායාගේ මූණ මුලින්ම දැකපු දවසේ වුණු සිද්ධිය.

රංජිත්ගෙත් නන්දනීගෙත් පළවෙනි දරුවා නිසාම හැම අම්මා තාත්තෙක් වගේම ඒ දෙන්නාත් ගොඩක් පරිස්සම් වුණා. අමායා ලැබෙන්න ආසන්න වෙලා රෝහල් ගත කරපු වෙලාවේ සාමාන්‍ය දරු උපතක් බලාපොරොත්තු වුණත් දරු ගැබේ කිසිඳු හැල හොල්මනක් නොතිබුණු නිසාම සිසේරියන් සැත්කමකට යොමු වෙන්න නන්දනීට සිදු වුණා.

සැත්කමෙන් පසු සිහිය ආපු සැණින් නන්දනී දරුවාව හෙව්වාත් ඇය ළඟ දරුවා හිටියේ නෑ.

“මිසී නෝනා මගේ දරුවා...“

මිසී මුකුත් කිව්වේ නෑ වාට්ටුවෙන් එළියට ගියා.

‘අනේ මගේ දරුවා‘

රෝහල් වෛද්‍යවරුන් පවා දරුවා පසෙකට කර තිබුණේ දරුවාගේ හැලහොල්මනක් නොතිබුණු නිසා.

“අම්මා.. කොහොමද අම්මාට දැන්“

මේ මාතෘ වාට්ටුව භාර වෛද්‍යවරිය නන්දනී ළඟට ආවා.

“අනේ නෝනා මගේ දරුවා“

“මෙහෙමයි අම්මා... හැමෝටම වාසනාවක් නෑ මේ ලෝකෙට......“

ඩොක්ටර්ගේ කතාවට බාධා කරගෙන කෑගහගෙන ආවේ රෝහල් කාර්ය මණ්ඩලයේ හෙදියක්.

“මැඩම් ඉක්මණට එන්න. ලොකු ඩොක්ටර් කතා කරනවා“

“අම්මා ටිකක් ඉන්න මම එන්නම්“

වෛද්‍යවරිය ඉක්මණින් ඒ පැත්තට ගියා.

ළදරු ඒකකයේ ඒ වෙලාවේ රැඳී හිටපු හැම කාර්ය මණ්ඩලයේ කෙනෙක්ම පුදුමයට පත් කරමින් නන්දනීගේ දරුවාගේ හෘදස්පන්ධනය පටන් ගත්තා. ඇය මහ හඬින් අඬන්න පටන් ගත්තේ කාගේත් හිතට සැනසුමක් දීලා.

නන්දනී බලාපොරොත්තු අතහැරගෙන හිටපු දරුවා ආයේමත් බලාපොරොත්තුවක් දීලා තමන්ගේ තුරුලට ආවා.

ඉතිං එහෙම හාස්කමකින් මේ ලෝකෙට ආපු දරුවාට කවදාම හරි දවසක මේ දුකින් ගොඩයන්න ලැබේවි කියන විශ්වාසය නන්දනීට තිබුණා.

"අම්මේ..."

"අම්මේ..."

අමායා නන්දනීගේ කල්පනා ලෝකේ බිඳලා දැම්මා.

"දුවේ.."

"මොනවාද කල්පනා කරන්නේ අම්මා"

"මුකුත් නෑ දරුවෝ"

"ඒක නෙමෙයි අම්මා මම ජේම්ස් මාමාට කිව්වා මොකක් හරි රස්සාවක් හොයලා දෙන්න කියලා ඊයේ හම්බුණ වෙලාවේ"

"අම්මාට තව දවස් කීයකට විතර බෙහෙත් තියෙනවාද අම්මා"

"දවස් දහයකට විතර සෑහෙන්න තියෙනවා දරුවෝ"

"ඉක්මණට රස්සාවක් හම්බුණොත් නම් හොඳයි අම්මා"

නන්දනීගේ ඇස් වලට උනපු කඳුළු ඇය ඇඳගෙන හිටපු චීත්තෙන් පිහලා දැම්මේ පිටකරනවාට වඩා හොඳයි කියලා හිතුණු නිසා.

.......................................................

"ළමයෝ....."

"අමායා.... වරෙන්කෝ එළියට"

"ජේම්ස් මාමේ..."

“යකෝ මෙච්චර කතා කරනවා ඇහෙන්නේ නැද්ද බං“

“අනේ ඇහුණේ නෑ මාමේ“

අමායාගේ නිවසට ආසන්න නිවසක ජීවත් වන බ්‍රෝකර් වැඩ කරන ජේම්ස් අමායාගේ නිවසට ආවේ ඇයට රැකියාවක් හොයාගෙන.

“උඹේ වැඩේ හරි ඔන්න“

“රස්සාවද?“

“නැතුව ඉතිං උඹ මට කසාද හොයන්න කිව්වේ නෑනේ“

“අනේ ඇත්තද මාමේ. කොහේද? මොකද කරන්න තියෙන්නේ“

“උඹ ඉතිං ගෙදර වැඩපලට දස්සයානේ. කොලඹ ගෙදරක වැඩ කරන්න තියෙන්නේ. සැපට හිටියහැකි බං. ලොකු වැඩ නෑ. ඒ ගෙදර නෝනාට පොඩ්ඩක් උදව් කරගෙන ඉන්නයි තියෙන්නේ. හොඳ ගාණකුත් ගෙවන්නම් කිව්වා“

“අනේ ජේම්ස් අයියේ අපේ කෙලී වැඩකාරකමට දෙන්නද කියන්නේ“

“අනේ මේ නන්දනී මගෙන් මුකුත් නාහා හිටපන්. තාම දහඅටක්වත් නෑ. රස්සාවල් හොයන්න කියන්නේ එහෙම එකීටද. මේ වගේ එකක්වත් හොයාගත්තාම සතුටු වෙයන්“

“ඒත් ජේම්ස් අයියේ“

“නන්දනී මේ කීයක් හරි අතට අරගෙන උඹට බෙහෙත් ටිකවත් ගන්න පුළුවන් බං. කෙල්ලට සැපට ජීවත් වෙන්න පුළුවන්. ඒ ගැන හිතපන්. කාලා බීලාවත් ඉදී. මේ ගුබ්බෑයමේම වයසට යනවාට වඩා ඒක හොඳ නැද්ද“

“අපිට මෙහෙම හරි රස්සාවක් හම්බුණානේ අම්මා. අපි ඒ ගැන සතුටු වෙමු“

“උඹට මොලේ කලදක් නැති වුණාට දුවට නම් යන්තම් මොලේ තියෙනවා“

“ඒ නෝනලා තව දවස් දෙක තුනකින් මෙහේ ඒවි මේකිව එක්ක යන්නම. ලෑස්තිවෙලා හිටපන්. නහයෙන් අඬන්න තියාගන්න එහෙම එපා“

“මං මහා ලොකු පවක් කරගන්නවාද මන්දා ජේම්ස් අයියේ. මේ කෙලීගේ ඉගෙනීමත් නතර කරලා“

“එහෙනම් ඉතිං නෝ පලයන් එහේ වැඩට ඔය අසනීපත් එක්කම. උඹලා මගේ කේන්ති අවුස්සනවා බං. මෝඩ යක්කු“

ජේම්ස්ට හොඳටම කේන්ති ගියා.

“ජේම්ස් මාමේ මං එහේ යන්න කැමතියි. මාමා ඒ නෝනලාට කියන්න ඒක“

ජේම්ස්ගේ හිත හොඳ නැති වුණාදෝ කියලා හිතුණු අමායා ඔහුගේ තරහාව යන්තම් නිවලා දැම්මා.

“මොලේ ඇති එකයි මේ ගෙදර ඉන්නේ ඉතිං. මං යනවා කෙල්ලේ“

## *03 වන දිගහැරුම*

"ලොක්කියේ අමායා...."

"මෙන්න මේ නෝනලා ඇවිත්"

"ඉක්මණට මෙහාට වරෙන්කෝ දුවේ..."

ක්හැ ක්හැ ක්හැ

"මේ එනවා අම්මා"

අම්මාගේ කැගැහිල්ලට ගවුමට උඩින් ඇඳගෙන හිටපු රෙද්දෙන් අත පිහ දමමින්ම අමායා මිදුලට ආවා.

කොළඹ පුරවරයේ සුපිරි නිවසක මෙහෙකාරියක් විදියට යන්න අමායා ඇගේ හිත හදා ගත්තා. තවමත් වයස දහ අටක් වත් නොවුණත් නීත්‍යානුකූල නොවන අයුරින් මෙම ගණුදෙනුව ගෙනියන්න ජේම්ස් දෙපැත්තම කතා කරගෙන තිබුණා.

මිදුලේ අයිනට වෙන්න පාරේ නවත්තලා තිබුණු කළු පාට බෙන්ස් රථයෙන් බැහැලා එන තේජවන්ත පෙනුමින් යුතු කාන්තාව නිලීමා

අලහකෝන් වගේම කොණ්ඩය බෙල්ල ළඟට වවපු උස මහත එක් කණක කරාබුවක් පැලඳි සෙල්ලක්කාර පෙනුමින් යුතු ශානු අලහකෝන් අමායාගේ නෙත ගැටුණේ හිතේ තිගැස්මක් ඇති කරලා.

“ජේම්ස්...”

“ලොකු නෝනා මේ තමා මම කියපු කෙලී. වැඩට හරි දක්සයා”

“හ්ම්.. මේ ළමයාගේ වයස කීයද කිව්වේ?”

“දාහතයි නෝනේ”

“අවුරුදු දහ අටක්වත් නැතුව මම මේ ළමයව ගෙනියන්නේ මේ පවුලට උදව් කරන්න හිතපු නිසයි තේරුණාද”

“එහෙමයි ලොකු නෝනා. මගේ නම් ඒ හැටි කැමැත්තක් නෑ. ඒත් මොනවා කරන්නද මේවා මගේ කරුම. මේ ලෙඩ මරගාතේ මට කඩයප්පමක්වත් හදා ගන්න බැහැ නේ. මගේ දරුවා වැඩකාරකමට දෙන්නේ හිතකින් නෙමෙයි නෝනේ”

“උඹ බය නොවී හිටපන්. අපි ළමයා හොදට බලාගන්නම්. අපි නරක නපුරු මිනිස්සු නෙමෙයි නේද ජේම්ස්”

“ඒක හැබෑව. හරිම ගුණ යහපත් මිනිස්සු. ඒකේ ආයේ සැකයක් තියාගන්න එපා. පුදුම කරුණාවන්තයි. අර ඉන්නේ මේ නෝනගේ පුතා. ලොකු මහත්තයා රට. මේ කෙලිට අඩු පාඩුවක් වෙන්නේ නෑ බං”

මවගේ ඇස් වල පිරිලා තියෙන කඳුළු දැකපු අමායාගේ ඇස් වලට කඳුළු පිරෙන්න ආවත් ඇය ඒවා ආයාසයෙන්ම නවත්තගත්තේ මවට තවත් දුක් දෙන්න ඕන කමක් නැති නිසා.

අද මේ අලහකෝන් පවුලේ අය එනවා කියලා ජේම්ස් දැනුම් දීලා තිබුණු නිසාම තමන් සතු එකම ගවුම් කෑලි තුනත් පොලිතින් බෑගයකට දාලා අමායා සූදානම් කරගෙන තිබුණා.

“මගේ අම්මා අඩන්න එපා. මේ නෝනලා මාව හොදට බලාගනී. මම සල්ලි එවන්නම්. අම්මා බෙහෙත් ගන්න ඒවගෙන්. අපි මල්ලිටත් කොහොම හරි උගන්නමු අම්මා. එයා දවසක අපි දෙන්නාව බලා ගනී”

"අනේ මයේ දුවේ..."

අමායාව තුරුල් කරගත්තු නන්දනීගේ ඇස්වල පිරිලා තිබුණු කඳුළු එකපාරම නිදහස් වෙන්න ගත්තේ මව් සෙනෙහස දෝරේ ගලද්දි.

"අපි යමු නේද එහෙනම්"

"යමු නෝනා"

"ජේම්ස් මෙන්න උඹේ ගාණ මෙතන ඇති"

ජේම්ස්ගේ හිනාව මූණෙන් එකයි සල්ලි ටික අතට ලැබුණාම.

තමන් ජීවත් වුණු පැල්පත පුරා දෙඇස් හෙලපු අමායා, මවගේ දෙපතුල් සිප ගත්තේ අවුරුදු ගාණක් පුරාවට එකට තුරුල්ව ගත කරලා අද ඉඳන් තනිව ජීවත් වෙන්න හිත හදාගෙන.

"මල්ලිටත් මම ගියා කියන්න අම්මා. එයාට හොඳට ඉගෙන ගන්න කියන්න"

"මම ගිහින් එන්නම් බුදුසරණයි"

"අනේ මගේ දුවේ පරිස්සමින් හිටපන්. පුළුවන් වෙලාවට ජේම්ස් මාමාට කතා කරපන්"

“හරි අම්මා. අම්මා පරිස්සමෙන් ඉන්න. බෙහෙත් වෙලාවට බොන්න”

වාහනයේ පිටිපස්සට ගොඩ වුණු අමායා ඇගේ මව නොපෙනී යන තුරුම බෙල්ල හරවාගෙන බලාගෙන හිටියා.

ජීවිතේ කියන්නෙම හැලහැප්පීම් මැදින් ගලාගෙන යන දියපහරක්.

මෙතෙක් වෙලා බිම බලාගෙනම ගියපු අමායා හෙමින් ඔළුව ඔසවද්දි දැක්කේ වාහනයේ පිටුපස පේන කණ්නාඩියෙන් තමන් දෙස බලමින් වාහනය පදවන ඒ පිරිමි ඇස් දෙක. නිවසට එන අතරතුර කිහිප වතාවක්ම තමන් දෙසට යොමු වෙන මේ ඇස් අමායා මග හැරියේ වාහනයේ ජනෙල් වීදුරුවට ඔළුව ගහගෙන.

එහෙම හිටපු අමායා එන මග දිගටම හිතුවේ තමන්ගේ ජීවිතේ ගැන නෙමෙයි තමන්ගේ අම්මාගෙත් මල්ලිගෙත් ජීවිත සැපවත් කරන්නේ කොහොමද කියලයි.

ඒ කල්පනාවෙන්ම ආපු අමායා දෙපසට විවර වුණු සුවිසල් කළු ගේට්ටු පළු තුලින් විරාජමානව බැබලෙන සුදු පැහැ ආලේපිත විශාල නිවස දෙස

වාහනය තුල ඉඳගෙනම බොහෝ වේලා බලාගෙන හිටියා.

"බහින්න"

"හොඳයි ලොකු නෝනා"

"සැම්සන්.... මේ ළමයාට එයාගේ කාමරේ පෙන්නනවා"

"හොඳයි මැඩම්"

"මේ ළමයා ඇහුණද?"

සැම්සන් පස්සෙන් යන්න ගියපු අමායා අයේමත් හැරිලා බැලුවා.

"මට මැඩම් කියලා කතා කරනවා තේරුණාද?

"හොඳයි මැඩම්"

ඇයට මෙම නිවසේ වෙන් කරලා තිබුණේ නිවස පිටුපසට වන්නට පිහිටලා තිබුණු සේවකයන් වෙනුවෙන්ම වෙන් වුණු කාමරයක්. කුඩා ඇඳක්, බිත්තියට සවි කරපු කණ්ණාඩියක් වගේම, ඇඳුම් පැලඳුම් අසුරා ගැනීමට තිබුණු කුඩා කබඩයත් හැරුණු කොට වෙනත් කිසිවක් කාමරයේ තිබුණේ නෑ.

ඇඳුම් කෑලි තුනක් පමණ තියෙන ඇයට නම් මේ කබඩය වැඩකුත් නැති තරම්. මෙතෙක් කල් පාසැල් සුදු ගවුමට ආදරේ කරපු ඇය අද ඉඳන් චීත්ත ගවුමට ආදරේ කරන්න පටන් ගන්න හිත හදා ගත්තා.

දුප්පත් කමින් පෙළුණත් පිරිසිදුව, පිළිවෙලට ඉන්න එක අමායාගේ පොඩි කාලේ ඉඳලාම පුරුද්දක්. තියෙන එක ගවුම දෙක වුණත් පිරිසිදුව පාවිච්චි කළා. දිගම කොණ්ඩයක් නොවුණත් පිට මැදට වන්නට තිබුණු කෙටි කොණ්ඩේ පිලිවෙලට පීරුවා.

අමායා ඇඳගෙන හිටපු මල් වැටුණු රෝස පාට චීත්ත ගවුම දිහා කණ්නාඩියෙන් බලාගෙන හිටියේ තමන්ගේ හැඩ. දුප්පත් පවුලක ඉපදුණත් ඇය ලස්සන අහිංසක පෙනුමැති තරුණියක්. ජීවන බර කරට ගත්තත් ඇයත් සොඳුරු වයසේ පසුවන යෞවනියක්.

“අමායා....”

අමායාගේ කල්පනාව බිඳුණේ මහ සද්දෙන් ඇහුණු මේ ගෙදර මැඩම්ගේ හඬින්.

“මැඩම්...”

“මෙහේ වරෙන්. උඹ මොනවා කරනවාද කාමරේ අස්සේ”

කාමරෙන් එළියට ආපු අමායා බිම බලාගෙන හිටියා මිස මුකුත් කිව්වේ නෑ.

“මේ කුස්සිය අස් කරපන්. ඔක්කොම බඩු ටික පිහලා දාපන්. කලින් හිටපු එකී මේවා විනාස කරලා ගිහින් තියෙන්නේ”

උයන පිහන වැඩ වලට සැම්සන්ගේ බිරිඳ මාලනී උදේ ඇවිත් හවස යනවා. ඒ නිසා අමායාට කරන්න තිබුණේ මේ ගෙදර අස්පස් කරන වැඩයි මාලනීට අත් උදව් දෙන එකයි.

ජේම්ස් කියපු තරම් නම් අනුකම්පාවක් මේ නිවස හිමිකාරියගේ නැති බව අමායා මේ ගෙවුණු විනාඩි ගණනට දැන ගත්තා.

“මෙතන තොදොල් වෙවී ඉන්නේ නැතුව ඉක්මණේ කරපන් තේරුණාද. හුරතල් කරන්න ගෙනාවේ නෑ උඹව”

“හොඳයි මැඩම් මම කරන්නම්”

තමන්ගේ දුප්පත් ගෙදර තියෙන පුංචිම පුංචි කුස්සිය වගේ නෙමෙයි තමන්ගේ මුළු ගෙදරම

වගේ තුන් හතර ගුණයක් විශාල මේ කුස්සියේ වැඩ ටික ඉවර කරන්න දවසත් මදි වෙයි කියලා ඇයට හිතුණා.

දහඩිය හලාගෙන වැඩ කරලා, ටිකක් මහන්සියට අමායා එළියේ තිබුණු පුටුවක ඉඳගත්තා.

"උඹ මේ ගෙදර නෝනා කියලාද හිතාගෙන ඉන්නේ"

එකපාරම අමායා හිටපු තැනට ආපු නිලීමා අමායාගේ කොණ්ඩෙන් ඇදලා පුටුවෙන් බිමට තල්ලු කලේ හදවතේ කිසිම තෙතමනයක් නැති ගාණට.

"අනේ ... මැඩම්.... මං.... මං..."

"පලයන් වැඩ කරපන්. ඒවාට තමා ගෙවන්නේ"

පළමු දිනයේදීම, අමායාට මේ දුක්බර අත්දැකීම් සහ සිතුවිලි පිරුණු කාලයක් අද ඉඳන් හැම දවසකම මීටත් වඩා වැඩියෙන් විඳවන්න වෙන බව නම් ඒ අහිංසක හිතට දැණුනා.

sinhalaebooks.com

### *04 වන දිගහැරුම*

"අමායා...."

"මේ තේ එක ගිහින් දෙනවා බේබිට. දීලා එනවා ඉක්මණට"

නිලීමා කවදාත් එයාගේ පුතාගේ තේ එක ඇය අතින්ම සූදානම් කළා.

"හොඳයි මැඩම්"

දෙවනි මහලේ පිහිටලා තියෙන ශානුගේ කාමරයට අමායා තේ එකත් අරගෙන ගියේ ටිකක් බයෙන්. ඔහුගේ පෙනුම දැකපු පලවෙනි දවසෙම ඇගේ හිතේ ඔහු ගැන ඇති වුණේ බියක් මිස හොඳක් නම් නෙමෙයි.

"ශානු බේබි.....

"බේබි මහත්තයා...."

අමායා දොරට තට්ටු කළා.

"දොර ඇරලා තියෙන්නේ එනවා"

දොරෙන් ඇතුල් වුණු අමායා දැක්කේ ෂර්ට් එකවත් නැතුව ඇඳට වෙලා ඉන්න ශානු.

"බේබි තේ එක"

ඇය ඔහු දිහා නොබලාම එහෙම කිව්වා.

"මෙතනින් තියනවා"

තේ එක මේසේ උඩින් තියපු අමායා හැරුණේ කාමරෙන් එළියට යන්න.

"ඔහොම ඉන්නවා"

"බේබි මහත්තයා..."

"මොකද්ද තමුන්ගේ නම කිව්වේ"

තමන් දිහා බලාගෙන නිකට අතගාමින් ඉන්න ශානුව දැකලා ඇය අහක බලාගත්තා.

"අමායා"

"හ්ම්.. දොර වහගෙන පලයන්"

මේ අතරේ තේ එක දෙන්න ගියපු අමායා මෙච්චර වෙලාවක් නැති නිසා නිලීමාට හොඳටම කේන්ති ගිහින්.

“උඹ මෙච්චර වෙලා මොනවා කළාද. තේ එක ගිහින් දීලා එන්න මෙච්චර වෙලා යනවාද“

“අනේ මැඩම්... බේබි...“

“පලයන් ගිහින් කාමර ටික මොබ් කරලා දාපන්“

අමායාගේ ඇස් වල කඳුළු පිරිලා. ඒත් ඒ කඳුළු වලට මේ ගෙදර කිසිම වටිනාකමක් නැති විත්තිය අමායා දන්නවා.

අත් රතු වෙනකම්ම අමායා කාමර වල බිම පිහදැම්මා. දාඩිය දාලා.

දොර හඩින් විවර වූණු කාමරයකින් එඹුණේ නිලීමා. මුළු කාමරේ පුරාම ඇස් යවපු ඇය සුපුරුදු නපුරු පෙනුමින් අමායා දිහා බැලුවේ තරහින්.

"තාම ඉවර නැද්ද? උඹ ඕක කීය වෙනකන් කරනවාද? ඉක්මණ් කරපන්. තව වැඩ තියෙනවා“

"මට සමාවෙන්න මැඩම්. මම පුළුවන් උපරිමෙන් කරනවා"

“මෙහෙට එන්නේ නිකම් උඹලා වගේ උන් නෙමෙයි. හොඳ තැන් වල අය. ඒ හින්දා හරියට වැඩ කරපන්. නැත්තම් ආයෙත් ගෙදර යන්න ලෑස්ති වෙයන්“

“අනේ මැඩම් එහෙම කියන්න එපා. මම ඉක්මණට කරන්නම්“

නිලීමා ගස්සගෙන යන්න ගියා.

අමායා හැම වෙලාවකම වෙහෙස මහන්සි වෙලා වැඩ කළත්, පුළුවන් හැමවෙලාවෙම හිනාවකින් සැරසිලා ඉන්න උත්සාහ කලා. ඉවුම් පිහුම් කටයුතු වෙනුවෙන් ඉන්න මාලනී වුණත් අමායාට වැඩි කැමැත්තක් දැක්වුනේ නැත්තේ ඇය පරණ සේවිකාවක් නිසාම වෙන්නත් ඇති.

මුළු රෑය පුරාම වැඩ කරන අමායා රාත්‍රියේ නින්දට වැටෙන්නේ පැය තුනකටත් වඩා අඩු කාලයක්. ජීවිතේ මෙතරම්ම විඳවන්න සිද්ධ වුණත් තමන්ගේ අම්මාගෙත් මල්ලිගෙත් අනාගතය වෙනුවෙන් ඇය මේ හැමදේම දරාගත්තා.

අමායා ඇයට වෙලාවක් ලැබෙන හැම වෙලාවකම අම්මාට කතා කලා. ඒත් මැඩම් ඉන්න වෙලාවට නම් කතා කරන්නේ නෑ.

"අම්මා..."

"අනේ මගේ දුවේ"

"අම්මා හොඳින් නේද. බෙහෙත් බොනවා නේද"

"ඔව් දුවේ. දුවට පින් සිද්ධ වෙන්න බෙහෙත් ටික බොනවා"

"මගේ දුවට කොහොමද. ඔහේ නෝනලා හොඳයි නේද කරදරයක් නෑනේ"

"අනේ නෑ අම්මේ. මේ නෝනා හරිම හොඳයි. මට හරි ආදරෙයි"

"එහෙනම් කමක් නෑ පුතේ"

"අම්මා මම පස්සේ වෙලාවක ගන්නම්"

"හොඳයි පුතේ. තුණුරුවන් සරණයි"

අමායා මහා බර සුසුමක් හෙලලා මාලනී බෙදලා දීපු බත් දංකුඩ පිඟාන අතට ගත්තා.

### *05 වන දිගහැරුම*

දෑත් වල කරගැට ඇවිත්. අත් ගොරෝසු වෙලා.

කවදා හරි දවසක තමන්ගේ ජීවිතෙත් වෙනස් වෙයි කියන බලාපොරොත්තුවක් හිතේ කොණක තැන්පත් කරගෙන අමායා පුරුදු ගෙදර වැඩ ටික පටන් ගත්තා.

'මල්ලි කවදා හරි දවසක අම්මාවයි මාවයි බලා ගනිවි'

වත්ත පුරා ඇති මල් වලට වතුර දමමින් හිටපු අමායා දැක්කේ උඩ මහලේ ඉඳන් තමන්ගේ දිහාම බලාගෙන ඉන්න ශානු. දින ගණනක්ම තමන් දිහා අමුතු විදියට ඔහු බලනවා අමායා දැක්කා.

වතුර දාන එක නවත්තපු ඇය නිවස ඇතුලට ගියේ ඒ බැල්ම දරා ගන්න බැරි වුණ නිසා.

ඒ කල්පනාවෙන්ම නිවස අතුගාන්න පටන් ගත්තු අමායා අතින් මල් බඳුනක් ගිලිහුණේ නොසිතූ වෙලාවක.

“අමායා... උඹ මොකද්ද ඒ කලේ ගෑණියේ“

“තමුසේ හිතාගෙන ඉන්නේ මේවා රුපියලයි දෙකයි කියලාද. මේවා වටින දේවල්“

“මං ආසම වාස් එක“

යක්ෂණියක් වගේ නිලීමා ඇයට කෑගැහුවා.

“අනේ මැඩම්... මං... හිතලා කලා නෙමෙයි“

“හිටපන් මං අද උඹට හොඳ වැඩක් කරනවා“

අමායා අතේ තිබුණු කොස්ස උදුර ගත්තු නිලීමා ඇයට හොඳටම ගැහුවා.

“අනේ මැඩම් එපා. රිදෙනවා අනේ ගහන්න එපා. අනේ මැඩම්....“

“අස්කරපන් මෙතන මැරුම් කන්නේ නැතුව මගෙන්“

නොන්ඩි ගගහා ගිහින් එතන අස් කරලා දාපු අමායා කුස්සියට ගිහින් ඉඳගත්තා. ඇගේ තැන් තැන් වල නිල් පාට රතු පාට පැල්ලම්.

ගෙදර වැඩට ඉන්න මාලනී ඇහැක් ඇරලා අමායා දිහා බැලුවේ නෑ.

'ජීවිතේ මෙහෙම තමා. මොනවා කරන්නද'

අමායා කාටවත් හිතෙන් වත් දොස් කිව්වේ නෑ. හැමදෙයක්ම උපේක්ෂාවෙන් බාර ගත්තා.

....................................................

"මැඩම්.."

"මොකද?"

"මැඩම් මම ගෙදර වැඩ ටික ඉවර කළා"

"ඉතිං.."

"මැඩම් මං ගෙදර ගිහින් එන්නද. අම්මාට බෙහෙත් ටික අරන් දීලා අදම එන්නම්"

"උඹට වැඩ කරන්නයි ගෙදර යන්නයි ඔක්කොම පිළිවෙලට ඕනේ නේද"

"අනේ එහෙම නෙමෙයි මැඩම්. මං මේ හැමදේම කරන්නේ අම්මා වෙනුවෙන්."

"උඹ මාත් එක්ක එකට එක කියන්නත් එනවාද දැන්"

"අනේ මැඩම් නෑ. සමාවෙන්න"

අමායා බිම බලාගෙනම එතනින් එන්න ආවා.

අමායා කුස්සියට වෙලා කල්පනා කළේ අම්මාගේ බෙහෙත් ටික අරන් දෙන්නේ කොහොමද කියලා.

'දැන් බෙහෙත් ඉවරත් ඇති'

'සල්ලිත් නැතුව ඇති බෙහෙත් ගන්න'

'අනේ මට අද යන්න තිබුණා නම්'

"අමායා..."

"මැඩම්..."

"ගිහින් ඉක්මණට එනවා. රෑ වෙන්න බෑ තේරුණාද"

"හොඳයි මැඩම් ගොඩක් පින්"

අමායාගේ ඉහේ මලක් පිපුණා වගේ. ඉක්මණට ඇඳුමක් දාගෙන නිවසින් පිටත් වුණු ඇය පිළියන්දල බසයකට ගොඩ වුණේ ඇගේ මවට අවශ්‍ය බෙහෙත් හේත් වගේම අනිත් දේවලුත් අරගෙන. පැයකට ආසන්න ගමනකින් පසුව ඇය එදා නිවසින් පිටවුණාට පස්සේ අද ඒ දුප්පත් පැලට ආවා.

“අනේ මගේ දරුවෝ.. දෙයියෝ දැක්කා වගේ රත්තරනේ“

“අම්මා හොඳින් නේද අම්මා“

“ඔව් මගේ පුතේ. පුතා නම් කෙට්ටු වෙලා“

අමායාගේ මුළු මූණ පුරාම දෑත් ගෙන ගියපු ඒ අම්මා ඇයව තුරුල් කර ගත්තා.

“මල්ලි කෝ අම්මා“

“පන්ති ගිහින් පුතේ. විභාගෙත් ළඟයිනේ“

“දැන්ම එයිද. දකින්නත් ආසයි මට“

“දැන් නම් එනවාත් ඇති මගේ හිතේ“

“ආ ඔය එන්නේ කියනකොටම“

“මල්ලි...“

“අක්කේ.. දැන්ද ආවේ“

“දැන් ආවේ මල්ලි... පාඩම් වැඩ හොඳට කරනවා නේද. කොහොම හරි එක පාරම කැම්පස් යන්න පාස් වෙන්න“

“කැම්පස් යන්න? සල්ලි ගස් වලින් කඩනවාද අනේ අපි“

“ඇයි ඔයා එහෙම කියන්නේ. මම මේ දේවල් කරන්නේ ඔයාට උගන්නන්නත් එක්ක තමා මල්ලියේ. ඒ හින්දා වෙන දේවල් නොහිතා ඔයා කැම්පස් යන්න. මම සල්ලි හොයලා දෙන්නම්“

“හ්ම්“

මල්ලි වැඩි කතා බහක් නැතුවම ඇතුලට ගියා.

“දුවේ දැන් යනවාද“

“ඔව් අම්මේ. යන්න ඕනේ. රෑ නොවී එන්න කිව්වා. මැඩම් බයයි මාව රෑට තනියම එහේ මෙහේ යවන්න“

“අනේ පුතේ එහෙමද? ඒ නෝනා උඹව අම්මා කෙනෙක් වගේ බලාගන්නවා නේද“

“අනේ ඔව් අම්මේ“

‘මම කොහොම කියන්නද ඒ ගෙදර මට වෙන දේවල් අම්මා. මට සමාවෙන්න බොරු කියනවාට’

### *06 වන දිගහැරුම*

අශේන්, නිම්සර, ශෙවෝන්, මතීෂ ශානුගේ ළඟම මිතුරන්. ගොඩක් දවසකින් කට්ටියට එකතු වෙන්නත් බැරි වුණු නිසාම අද දවස යොදා ගත්තේ ශානුගේ ගෙදර යන්න.

හැමෝම සාලයේ බරටම කතාව.

අමායා මේ හැමෝටම කේක් බිස්කට් දාපු බන්දේසියක් අරගෙන ඇවිත් එතනින් තියලා ගියා.

"වාහ් වාහ් කව්ද බං ඒ"

"අළුතින් වැඩට ආපු කෙල්ල"

"ලොකු දෙයක් බං"

"ඒ මොකෝ ශෙවෝ"

"නෑ බං උඹලාගේ ගෙදර හිටියේම නාකි සෙට් එකක්නේ"

හැමෝම හිනා වුණා.

"යන්තම් ඇති දැන්වත් කෙල්ලක් ගෙනවා"

“මේකයි ගේනකොට කෙල්ලෙක් වෙන්න ඇති. හැබැයි දැන් නම් නැතුව ඇති“

අශේන් එහෙම කිව්වේ ශානු දිහා බලලා.

“ඒකත් ඇත්තනේ මචං“

“උඹ මොකද ඒක මහා අමුතුවට කිව්වේ“

“මේකනේ මචාං.. අපි උඹ කව්ද කියන්න දන්නවානේ. ඒකයි එහෙම කිව්වේ“

“ඔන්න ඇත්තම කිව්වා තාම නම් මං මුකුත් කලේ නෑ“

ශානු ඔළුව පිටිපස්සෙන් අත් දෙකත් තියාගෙන සෙටි එකේ පිටිපස්සට හේත්තු වුණේ හිතට අමුතු හැඟීමක් දැනෙද්දි.

අමායාව ඔහුගේ කරගන්න හැඟීමක් යටි හිතේ ඇති වෙද්දි.

“ශානු, ඒකි අහිංසක පාටයි බං. අනික පොඩි කෙල්ලෙක් වගේ. පව්“

ඒ නිම්සර. මේ යාළුවන්ගෙන් මනුස්සකමක් කියලා දෙයක් තියෙනවා නම් ඒ නිම්සර විතරයි.

ඇත්තටම නිම්සරට අමායා දැකපු වෙලාවෙම ඇය ගැන අමුතු හැඟීමක් දැණුනා.

ශානු කියන්නේ සෙල්ලක්කාර කොල්ලෙක්. කෙල්ල පොඩිද ලොකුද, පව්ද පින්ද එයාට අදාලම නෑ. හිතුණොද කෙල්ලව ගත්තා. සාමාන්‍ය ආශාවන් වලට එහා ගිය ආශාවන් තියෙන කෙනෙක් කියන්න යාළුවෝ සෙට් එකම දන්නවා. මොකද කෙල්ලෝ වගේ කොල්ලේ හිතේ දේවල් හංගගෙන ඉන්නේ නෑ. කොල්ලෝ සෙට් වුණොම ඕන එකයි එපා එකයි හැමදෙයක්ම කියවනවා.

“වයස පොඩි වුණාට පෙනුම පොඩිමත් නෑ ඉතිං ශානුට නම්. නැද්ද මචං“

එහෙම කිව්වේ අශේන්.

“ඒත් බං පව්...“

“මේ බලපංකෝ මූ. අනේ මේ නිමා... ඒකි ආවේ වැඩකාරකමට මිසක් වෙන මගුලකට නෙමෙයි. උඹ පව් පින් දෙන්නේ නැතුව හිටපන් මේ හිඟන කෙල්ලන්ට“

“මම ශානු හරිද මල්ලි ශානු. මේ ශානු කියන්නේ කව්ද කියන්න කලම්බු ඒරියා එකම දන්නවා“

නොකිව්වාට නිම්සරට ඇත්තටම අමායා ගැන පොඩි බයක් නෙමෙයි ලොකු බයක් දැණුනා. අමායා නැතුව වෙන කෙනෙක් එතන හිටියාත් නිම්සරට හිතෙන්නේත් ඒ දේම තමා. ඒත් අමායා ගැන දැණුන බය ඊට වඩා ගොඩක් වෙනස්.

"අමායා මේ තේ ටික ගිහින් දීපන්"

"හා මාලනී ඇන්ටි"

අමායා තේ කෝප්ප ටිකත් එක්ක ආවේ ශානුලා හිටපු තැනට.

"ආ නංගී. කොහොමද ඉතිං. ශානු විතරක් නෙමෙයි අපිත් කැමති අඳුනගන්න"

අමායා අහිංසක හිනාවක් පාලා එතනින් ඉක්මණට එන්න ආවා.

"හා හා මේ උඹලා අඳුරගන්න යන්න ඕනේ නෑ. ඒවා මං කරගන්නම්"

"බීලා හිටපන් දැන් ඕක. ආවා මෙතන විකාර කියවන්න"

..............................................

අමායා නිවසට ආපු මුල් සති කීපයේ ශානු පේන්න නොහිටියත් දැන් අමායා ගෙදර වැඩ කරන හැම වෙලාවකම ශානු ඇය පේන මානේ ඉඳගෙන ඇයව රස වින්දා. අමායා නම් ඒ දේවල් විඳගත්තේ බොහොම අපහසුවෙන්.

අමායා සාලයේ වැඩ කරද්දි ශානු බොරුවට පත්තරයක් බල බලා හිටියා.

ගේ බිම පිහදානකොට ශානු බොරුවට එහෙට මෙහෙට ගියා.

ඒත් අමායා ඒ දේවල් ඉවසගෙන තමන්ගේ පාඩුවේ වැඩ කරගත්තා.

නිලීමාත් අමායාට වැඩක් නොකියන වෙලාවක් නෑ.

"ඉක්මණට ඔය ටික ඉවර කරපන්. මේ කර්ටන් ටික හෝදන්න තියෙනවා. තව වැඩ තියෙනවා"

"නෙක්ස්ට් වීක් මගේ හොඳම යාළුවෝ ටිකක් එනවා. ගේ ලස්සනට තියෙන්න ඕනේ"

"ඉක්මණ් කරපන්"

"හොඳයි මැඩම් මම ඉක්මණට කරන්නම්"

### *07 වන දිගහැරුම*

මේ සුවිසල් නිවසේ අද රාත්‍රීයේ පැවැත්වෙන උත්සවය නිසා මුළු නිවසම කාර්යබහුල වෙලා.

සැම්සන්, මාලනී, අමායා වගේම තව පිටතින් ගෙන්වා ගත්තු කෑම සැපයුම් ආයතනයක පිරිසකුත් එහෙට දුවනවා මෙහෙට දුවනවා. කෑම වර්ග මහා ගොඩකින් පිරිණු මේසය හරියට මගුල් ගෙදරක් වගේ අමායාට පෙණුනේ.

නිලීමාගේ යහළුවන් එයාලගේ පවුලේ අයත් එක්ක අද මේ නිවසට එන්නේ ඇගේ උපන් දිනය වෙනුවෙන්.

මාලනී ඇයගේ රාජකාරි අවසන් කරලා නිවසට ගියේ ඉතිරි වැඩ සියල්ල කෑම සැපයුම් ආයතනයේ අයට භාර දීලා.

අමායාත් ඇගේ වැඩ කටයුතු ඉවර කරලා කාමරයට ගියා. කන් දෙදරවන සද්දෙන් ඇහෙන ගායක ගායිකාවන්ගේ හඬ අමායාගේ නින්ද නම් නැති කලා.

මහ රෑ වෙලා නින්දත් නොනින්දත් අතර හිටපු අමායාට ඇහුණේ එයාගේ කාමරේ දොරට තට්ටු කරනවා වගේ හඬක්.

පිටත සද්ද නිසා යන්තමට ඇහුණු දොරට ගහන හඬට අමායා දොර ඇරියා.

"බේ... බි මහත්ත...යා"

කාමරේ දොර තල්ලු කරගෙන ඇතුලට ආපු ශානු අමායා දිහා බලාගෙන හිටියේ බීමතින් මත් වුණු ඇස් දෙකෙන්.

ශානු ඇගේ කාමරේ දොර වහලා ඇතුලතින් අගුළු දැම්මේ අමායාගේ හිතේ අනතුරක සේයාවක් ඇඳී යද්දි.

"බේබි මහත්තයා.. ඇ.. යි ... මේ.."

ශානු මහ හඬින් හිනා වුණා.

අමායාගේ හිතට දැණුන බය ගැන කොහොම තේරුම් කරන්නද.

පස්සෙන් පස්සට ගියපු ඇය බිත්තියටම හේත්තු වුණේ තමන් ඉස්සරහට එන ශානු දිහා බලාගෙන.

"කොහොමද කෙල්ලේ...."

"බේබි හොඳටම බීලානේ..."

"ඔව් ඇයි උඹට ප්‍රශ්නයක්ද"

"නෑ.... මං..."

ශානු අමායාගේ ළඟටම ආවා.

"බේබි මහත්තයා... අනේ...."

අමායා බයටම ඇඳ උඩට නැගලා ගුලි වුණා.

ඒත් ශානු අමායාව ඇදලා ගත්තා.

අත් දෙකත් පපුවට ගුලි කරගෙන උගුර ඇතුලෙන් දැනෙන වේදනාවත් එක්කම කෑගහගෙන ශානු ළඟට එන එක වලක්වගන්න අමායා සෑහෙන වෙහෙසක් දැරුවා.

ඒත් ශානු අමායාගේ අත් දෙක ඇදලා අරගෙන එක අතට ගුලි කරගත්තා.

ශානු අමායාගේ කම්මුලට අත තිබ්බා.

"අනේ බේබි එපා... වදින්නම් එපා.."

අමායා හොඳටම බය වෙලා. වතුරෙන් ගොඩට දාපු මාළුවෙක් වගේ ගැහෙන්න ගත්තා.

ශානුගේ අත බලෙන්ම ඇගේ බෙල්ල දිගේ එනවා දැනෙද්දි අමායා ශානුව පුළුවන් වීරිය දාලා තල්ලු කරලා දුවගෙන ඇවිත් දොරේ අගුල ඇරගන්න උත්සාහ කළා.

ඒත් ඒක කරගන්න අමායාට පුළුවන් වුණේ නැත්තේ ඇගේ දෛවය ඇගේ ජීවිතය තීරණය කරලා ඉවර නිසා වෙන්න ඇති.

අමායා ශානුව තල්ලු කරපු පාරට ඔහුව ඇඳට වැටුණු තරහාට ආයේමත් අමායා ළඟට ඇවිත් කොණ්ඩෙන් අල්ල ගත්තා.

"බැල්ලි මට අත උස්සන්න උඹ කව්ද ආ"

"අනේ බේබි මාව අත අරින්න පින් සිද්ධ වෙයි..."

"අනේ මාව බේරගන්න"

අමායා කෑගහනවා දඟලනවා. ශානුගෙන් ගැලවෙන්න හදනවා. ඒත් වැඩක් නෑ.

හහ් හහ් හහ්....

"උඹේ සද්දේ මේ කාටවත් ඇහෙන්නේ නෑ කෙල්ලේ. අද මගේ දවස"

අමායාගේ කෑගැහිල්ල එන්න එන්නම වැඩි වුණා.

ශානු එයාගේ ඉනේ ගහගෙන හිටපු පිස්තෝලේ ඇදලා අරගෙන අමායාගේ ඔළුවට තිබ්බා.

"කට වහගෙන හිටපන්. නැත්තම් මෙතනම මරලා දානවා. එතකොට උඹේ අම්මාත් ඒ දුකටම මැරිලා යයි. කැමති නම් කෑගහපන්"

අමායාගේ කෑගැහිල්ල එතනම නතර වුණා.

"අනේ බේබි මට යන්න දෙන්න. පින් සිද්ධ වෙයි මහත්තයෝ"

අමායා ශානුගේ කකුල් ළඟ වැටිලා ආයාචනා කළා.

"පලයන් ඇඳට"

"අනේ බේබි මහත්තයා... අනේ මට කරදර කරන්න එපා.."

අමායා තාමත් අත් දෙක එකතු කරලා වැඳගෙන ඉල්ලනවා.

"පලයන් ඇඳට"

පිස්තෝලේ අමායාගේ ඔළුවට තියලා ගිරිය යටින් කෑගහපු ශානුගේ සද්දෙට අමායා හොඳටම බය වුණා.

හිමින් හිමින් ඇඳ ළඟට ගියපු අමායා ඇඳෙන් වාඩි වුණා.

පිස්තෝලේ පැත්තකින් තියපු ශානු අමායා කෑගහද්දි දඟලද්දි ඇයව ඇඳට පෙරලගත්තා. ඇගේ දෙතොල් හැපුවා. ඔළුව දෙපැත්තට හරවා හරවා ඒක වලක්වගන්න අමායා උත්සාහ කළත් වැඩක් වුණේ නෑ. ශානුගේ ඇගේ ප්‍රමාණෙත් එක්ක හෙලවෙන්නවත් අමායාට බැරි වුණා.

ශානු එයාගේ ආසාව ඉෂ්ට කරගන්න පටන් ගත්තා. ශානුගේ වත අමායාගේ මුළු සිරුර පුරාම දුවද්දි අමායා දැඟළුවේ ගැලවෙන්න. දඟලලා දඟලලා අමායා හෙම්බත් වෙලා. ශානු එක්ක ඔට්ටු වෙන්න තවත් ශක්තිය අමායාට ඉතුරු වෙලා නෑ. අමායා ඇඳගෙන හිටපු ගවුම කෑලි කෑලි වලට ඉරිලා යද්දිත් ඇයට පුළුවන් වුණේ බලාගෙන ඉන්න විතරයි.

දවසක ජීවිතේ ආදරණීයව විඳින්න හිටපු ඒ හැඟීම්, ආසාවෙන් ඒ මොහොත විඳගන්න දැකපු හීන, බොඳවෙලා යන හැටි අමායාට දැණුනා.

අමායාගේ ඇඬීම සත පහකට මායිම් නොකර වේදනාව ගණනකටවත් නොගෙන කිසිම ඉවසීමක් නැතුව ශානු එයාගේ මේ මොහොත විඳගත්තා.

ශානු බලහත්කාරෙන්ම අමායාව ඔහුගේ ගොදුරක් කරගත්තා.

අහිංසක මල් පොහොට්ටුවක් පිපෙන්නත් කලින්ම හෙමින් හෙමින් පොඩි වෙලා ගියා.

යටි බඩ දිහායින් දැනෙන අධික වේදනාවත් එක්කම ඇගේ කකුල් දිගේ ගලාගෙන ගියපු ලේ පාර ගැන කිසිදු තැකීමක් ශානුට නම් තිබුණේ නෑ. හැම කෙල්ලෙක් වගේම අනාගතේ ගැන මවපු හීනයක් තමන්ගේ ඇස් ඉස්සරහම දියවෙලා යනවා අමායාට දැනුණේ ඒ කකුල් දිගේ ගලාගෙන ගියපු ලේ පාරත් එක්කමයි.

ශානුගේ මේ රිද්දීම් වල වේදනාව දරා ගන්න බැරිතරම් වෙද්දි අමායාට සිහිය තිබුණේ අඩමානෙට. අමායා කළේම කෙදිරි ගාපු එක

විතරමයි. ඒ තරමට ශානු අමායාට වද දුන්නා. පැයක් දෙකක් පුරාවට කෙරුණු මේ හිත්පිත් නැති ගණුදෙනුව අවසානයේ ශානු පන්දහසේ මුදල් නෝට්ටු කිහිපයක් අමායාගේ ඇඟ මතට විසි කරලා කාමරෙන් යන්න ගියා.

නැගිටගන්නවත් පණ නැතුව ඉන්න අමායා අමාරුවෙන් අමාරුවෙන් ඇඳ රෙද්ද ඇඟට අරගෙන දාගත්තේ තමන්ගේ නිරුවත වහගන්න.

'දැන් ඉතිං මොනවා වහන්නද'

තවමත් එළියෙන් ඇහෙන මහා සද්දෙට වඩා සද්දයක් තමන්ගේ හිත ඇතුලෙන් ඇහෙද්දි අමායා කළේ මුළු රෑ පුරාම අඬපු එක.

ජීවිතයේ කුණාටු නොවැළැක්විය හැකිය. ඒවාට මුහුණ දිය යුතුමයි.

'දෙවියෝ මාව පරීක්ෂා කරනවා නම් මට තවත් දේවල් දරාගන්න පුළුවන් මගේ පවුල වෙනුවෙන්'

'ඒ දෙන්නාට හොඳක් වෙනවා නම් මට මොනවා වුණත් කමක් නෑ'

'ශානු බේබි මට මෙහෙම කළාට කමක් නෑ. මම නාමත් ජීවත් වෙනවානේ'

'ඒත් දෙයියනේ මගේ අනාගතේ'

'මනමාලියෙක් වෙලා යන්න හීන දැකපු මට දැන් ඉතිං කොහේ යන්නද'

'මගේ දෛවය මේක වෙන්න ඇති'

අමායාට එයා ගැනම දැණුනේ මහා ලොකු කලකිරීමක්.

### *08 වන දිගහැරුම*

“නිම්සරගේ අර අහිංසකාවි තාම හොඳින් ඉන්නවාද ශානුවා“

අශේන්, නිම්සර, ශෙවෝන්, මතීෂ, ශානු අද එළියට ගියේ හුඟක් දවසකින් යන්න බැරි වුණු නිසා.

හහ් හහ් හහ් හහ්...

ශානුට ආපු හිනාව දිහා යාළුවෝ හැමෝම බලාගෙන හිටියා.

“ඒ කියන්නේ උඹ වැඩේ දුන්නාද ඒකීට?“

ශානු කිසිම දෙයක් නොකියා සිගරට්ටුවක් දල්වා ගත්තා.

“හැසිරීමෙන් පෙනී යන්නේ බිලී කොක්ක මාළුවා ඩැහැගත් බවයි.... ටන්ටනා.... මම හරිනේ...“

ශෙවෝන්ට කවදත් තිබුණේ ඉතිං ඒ වගේ කටක් නේ.

“හරි හරි උඹ හරි“

නිම්සර බිබී හිටපු බීම ටික පිට උගුරේ ගියා.

"ශානු උඹ නම්... කතා කරලා වැඩක් නෑ බං"

නිම්සරට ඇත්තටම අමායා ගැන දුක හිතුණා.

"මේකාට මොකද බං මේ වෙලා තියෙන්නේ. කොහේවත් යන එකියක් ගැන මොකද මෙච්චර අනුකම්පාවක්"

"අනුකම්පාවක් නැද්ද බං ඒකි තාම පොඩියි. අනික මෙහේ උන් වගේ නෙමෙයි. මෙහේ උන්ට නම් මොකක් වුණත් ගාණක් නෑ. ඒත් ඒ කෙල්ලන්ට එහෙම නෑ"

"ඉතිං මට මොකද?. මගේ කව්රුවත් නෙමෙයිනේ. අනික මොන පොඩියක්ද බං. දැන් අපේ ගෙදර ඇවිල්ලාත් කොච්චර කල්ද. දහ අට පැන්නම නීතියෙන් වුණත් බඳින්න අවසර දෙන්නේ පොඩි හින්දා නෙමෙයිනේ"

"උඹේ කව්රුවත් නොවෙන්න පුළුවන්. ඒත් උඹේ අම්මා වගේම ඒත් ගෑණියෙක්"

"අනේ මේ නිමා වහගනින් උඹේ කට. උඹටත් ඕනේ නම් මම ඒකිව දෙන්නම් හැබැයි තාම මම වැඩ අරගෙන ඉවර නෑ. ඉවර වුණාම දෙන්නම්"

"බලු කතා කියන්න එපා ශානු"

නිම්සරට ඇත්තටම කලකිරුණේ ශානුගේ කතාවට. ශානුට කෙල්ලෙක් කියන්නේ උං දෙන වද ඉවසගන්න පුළුවන් රූකඩයක්.

"මූට මොකක් වෙලාද මේ"

"පිස්සු බං. මහණ වෙන්නනේ ඉන්නේ මූ"

නිම්සර ඒ කතා වලට උත්තර දෙන්න ගියේ නැත්තේ උත්තර දීලා වැඩක් නැති නිසා.

"කොහොමද කෙල්ල උඹට හරියනවාද ආ..."

"මෙහේ කෙල්ලෝ වගේ කිසිම සප් එකක් නම් නෑ. ඒ වුණාට ඉතිං බලෙන් කර ගද්දිත් ඒකේ පොඩි ආතල් එකක් තියෙනවානේ බං"

"ගන් එක ඇඳ ළඟින් තිබ්බාම අඬ අඬ හරි ඉතිං මට ඉඩ දීලා ඉන්නවා. මට නම් ඉතිං වෙන මුකුත් ඕනේ නෑ"

කිසිම ගාණක් නැතුව ශානු මේ කියන දේවල් වලට නිම්සර ඇරෙන්න අනිත් හැමෝම හිනා වෙවී හිටියා.

..................................................

අමායාගේ සහෝදරයා උසස් පෙළ සමත්වීමෙන් විශ්ව විද්‍යාල වරම් ලද බව අහපු අමායාට එයාගේ ජීවිතේ ඊටත් වඩා සතුටුදායක ආරංචියක් තිබුණේ නෑ. ඇය මේ හැමදෙයක්ම කරන්නේ මල්ලිගේත් අනාගතය වෙනුවෙන්. ඉතිං ඇගේ කැප කිරීම අපතේ නොගිය එක ගැන ඇයට ලොකු සතුටක් දැණුනා.

"බේබි මේ තේ එක..."

"ඔහෙන් තියනවා"

"රෑට දොර ඇරලා තියනවා"

අමායා එහෙම ඇහෙනකොට ගැස්සෙනවා වගේම බර සුසුමක් හෙලනවා ඇරෙන්න වෙන කරන්න දෙයක් නෑ.

ශානු සතියකට වතාවක් දෙවතාවක් විතරම අමායාව හොයා ගෙන ආවා.

එහෙම ඕනේ වෙන දවසට ඔහු "රෑට දොර ඇරලා තියනවා" කියලා කියන නිසාම එදාට මුහුණ දෙන්න වෙන දේවල් ගැන අමායාගේ හිතේ ඇතිවෙන හැඟීම එයාටම හිතාගන්න බෑ.

හැමෝම නිදාගන්න කල් ඉඳලා මහ රෑට ශානු අමායාව හොයාගෙන එන්නේ ඇයගේ නින්ද නැති කරලා. දවස පුරාම ගේ වැඩ වෙනුවෙන් මහන්සි වෙලා හරියට කෑමක්වත් නැතුව දවස අවසානයේ නින්දට එන අමායාට ශානුගේ හිරිහැරත් විඳගන්න වෙලා.

"අනේ බේබි මහත්තයා රිද්දන්න එපා"

"ඒක තීරණය කරන්නේ මම. උඹ නෙමෙයි. මම උඹට සල්ලි දෙන්නේ ඒවා ඉවසගෙන ඉන්නවාටත් එක්ක තමයි"

සමහර දවසට අමායාගේ අත්දෙක ඇඳේ ගැට ගහලා ශානු එයාගේ ආසාවල් සම්පූර්ණ කර ගත්තා. ඉණේ තිබුණු පටියෙන් පහර දුන්නා. කට ගැට ගහලා තිබ්බා. සිගරට් වලින් පිච්චුවා. අමායාගේ වේදනාව ශානුගේ සතුට වුණු නිසාම හිතා ගන්න බැරි තරමේ වද වේදනාවන් ශානු අමායාට දුන්නේ කිසිම හිතක් පපුවක් නැති මනුස්සයෙක් ගාණට.

"ආ මේවා හරියට බොනවා. පස්සේ උරුමක්කාරයෝ ආවා කියාගෙන එන්න ලෑස්ති වෙන්න එපා. මොකද මට ඒකට උඹව ඕනේ නෑ.

එහෙම වෙලා මං නරකයි කියන්නත් එපා. එදාට උඹව මරලා දානවා මම තේරුණාද"

"ම් බොනවා මේක ඉතිං"

ශානු එයාගේ ආසාවල් සම්පූර්ණ කරගෙන ඒ හැම දවසකම ඇයට ගැබ් ගැනීම් වලක්වන බෙහෙත් ලබා දුන්නා. මොකද මේ දේවල් සිද්ධ වෙන්නේ සල්ලාලකමට මිසක් ආදරේට නොවෙන නිසා.

ඒ වගේම ඒ හැමදවසකම ඇයට මුදල් ලබා දුන්නා. ඇත්තටම ඇයට මේ වෙලාවේ ඒ මුදල් ලොකු  උදව්වක් වුණේ මල්ලිගේ විශ්ව විද්‍යාල වියදම් එන්න එන්නම වැඩි වෙන නිසා වගේම මවගේ අසනීප තත්වයත් එන්න එන්නම වැඩි වෙන නිසා ලබා ගත යුතු බෙහෙත් වර්ග වල මිලද අධික නිසා. ඇගේ සහෝදරයා නම් උපාධිය අවසන් කරන්න ආසන්නයි.

වේදනාවන් එක්කම ජීවිතේ අවුරුදු ගණන් ඔහේ ගෙවිලා ගියා. දැන් ඒ දේවල් වලට ජීවිතේ පුරුදු වෙලා. නිලීමාගේ වගේම ශානුගේ හිරිහැරත් ඉවසගෙන දරාගෙන අමායා ජීවිතේ ගෙවනවා.

මවගේ අසනීප තත්වයත් වැඩි නිසාම අමායාගේ හිත නම් හරිම නොසන්සුන්.

එදා දවස අමායාගේ ජීවිතේ අමතක නොවෙන දවසක් වුණේ හැමදෙයක්ම එකපාරම කඩාගෙන වැටුණු නිසා.

නිලීමා ගෙදරින් පිටව හිටපු නිසා වගේම සැම්සන්ගේ බිරිඳ මාලනීද අසනීප නිසාවෙන් මෙම නිවසට නොපැමිණි නිසාම ශානු අමායාව ඔහුගේ කාමරයට ගෙන්නා ගත්තේ දහවල්වරුවේ.

ශානු දීපු සල්ලිත් අරගෙන කාමරෙන් එළියට ආපු අමායා දැක්කේ නපුරු පෙනුමින් බලාගෙන ඉන්න නිලීමාව.

නිලීමාට හිතාගන්න බැරුව ගියා දැකපු දේ. ගෙදර වැඩකාරි තමන්ගේ පුතාගේ කාමරේ ඉඳලා ඇඳුමත් හද හද එළියට එද්දි මොනවා හිතන්නද?

"මැ... ඩ..ම්..."

"තෝ වගේ එකියක් මේ ගෙදරට වද්දගත්තු එකයි වැරැද්ද"

"පාහර බැල්ලි"

"මගේ දරුවා එක්ක බුදිය ගන්න පටන් ගත්තාද?"

අමායාගේ කොණ්ඩෙන් අල්ලගෙන නිලීමා බෙරිහන් දෙනවා.

"අනේ මැඩම්... අතඅරින්නකෝ.. අනේ මං..."

ශානු නම් කාමරේ දොරට හේත්තු වෙලා හිනා වෙවී බලාගෙන ඉන්නවා.

"පලයන් දැහට නොපෙනී පලයන්. මේ දැන්ම එළියට බැහැපන්. තවත් පේන්න හිටියොත් තෝව මම පොලිසියට බාර දෙනවා"

"අනේ මැඩම් එහෙම කරන්න එපා"

"පලයන් මේ හොඳින් කියන්නේ"

අමායා නිලීමාගේ කකුල් ළඟ වැටුණා.

"අනේ මැඩම් මාව එළවන්න එපා මැඩම්. මැඩම්ට පින් සිද්ධ වෙයි. අනේ මැඩම්"

"පලයන් බැල්ලි....."

"සැම්සන්...."

"සැම්සන්...."

නිලීමා බෙරිහන් දෙනවා.

"මෙන්න මේකිව එළියට ඇදලා දාපන්"

## *09 වන දිගහැරුම*

අමායා මෙච්චර කාලයක් ඇගේ බලාපොරොත්තු ඉටු කර ගත්තු තැන දාලා ඇය එතනින් පිට වුණේ තවත් එතන ඉන්න පුළුවන්කමක් නැති නිසා.

කොළඹින් පිළියන්දල බසයට නැගුණු අමායා ජනේලයට හිස තියාගත්තා.

සුපුරුදු පරිසරයෙන් බසයෙන් බැහැගත්තු අමායා නිවසට ආවේ හිතේ බරකුත් එක්කමයි.

"අම්මා..."

"මගේ පුතේ... ක්හැ ක්හැ.."

"කතා කරන්න එපා අම්මා"

"ඇයි මේ... හදිස්..සියේ"

අමායා ඇගේ මව තුරුල් කරගෙන ගොඩක් වෙලා ඇඬුවා.

ඇයත් ඇති තරම් අඬන්න ඉඩ දුන්නා මිසක් මුකුත් ඇහුවේ නෑ.

"කමක් නෑ මගේ පුතේ. ආයේමත් එහේ යන්න ඕනේ නෑ"

"උඹ දැන් මට සැලකුවා ඇති මගේ පුතේ. උඹ ගැන හිතපන් දැන්"

'මගේ ගැන මොනවා හිතන්නද අම්මා. හිතන්න තරම් දෙයක් මගේ ළඟ දැන් නෑ'

අමායා එහෙම හිතුවත් කියන්න ගියේ නෑ.

.......................................................

හැම කරදරයක්ම එන්නේ එකපිටට.

අමායා උපයා ගත්තු මුදල් වලින් ඉතුරුව තිබුණු අන්තිම රුපියලත් ඉවර වුණේ නොහිතපු විදියට. මවගේ අසනීපය එන්න එන්නම වැඩි වෙලා. සහෝදරයා දැන් ඔහුගේ වියදම් සොයා ගැනීම සඳහා අමතර රැකියාවක් කරන්න පටන් අරන්. විශ්ව විද්‍යාලයේ අවසන් කාල සීමාවේ ඉන්න නිසාම එය ඔහුට පහසුවක් වෙලා. ඔහු ටික ටික පවුලෙන් ඈත් වෙන්න පටන් අරන්.

මල්ලිට නම් දැන් අමායාව දකින්වත් ආසාවක් නෑ. ඊටත් වඩා හොයා ගන්න හැම සතේම මල්ලි

එයාගේ වැඩ වලට විතරක්ම නිකරුණේ වියදම් කරන වෙලාවළුත් නැතුව නෙමේ.

“මල්ලි... අම්මාගේ බෙහෙත් ඉවර වෙලා. ඔයා ළඟ නැද්ද කීයක්වත් ගන්න“

“අනේ මේ අක්කේ මගේ ඒවාටවත් වියදම් කරන්න මේ සල්ලි මදි“

“මේ මාසෙට විතරක් දෙන්නකෝ මල්ලි“

“අක්කේ මේ මම එකපාරක් කිව්වානේ මගේ ළඟ සල්ලි නෑ. මේ මොන මල වදයක්ද“

හ්ම්ම්ම්ම්ම්

අමායා මහා බර සුසුමක් හෙළුවා.

මල්ලි මෙහෙම වෙනස් වෙයි කියලා අමායා නම් පොඩ්ඩක්වත් හිතුවේ නෑ. තමන්ට නැතත් අම්මාටවත් සලකයි කියලායි ඇය හිතුවේ. ඒත් ඒක වැරදියි.

අමායා අද දවසේ කෙහොම හරි බෙහෙත් ගන්න මුදල් හොයාගත යුතුමයි.

අමායා ආයේමත් කොළඹට ආවේ මොන විදියෙන් හරි මවගේ බෙහෙත් වලට මුදල් හොයා

ගන්න. අමායාගේ ජීවිතේ ඉතුරු වෙලා ඉන්නේ ඇය විතරයි. අමායාගේ මුළු ජීවිතයම ඇගේ මව. නන්දනී මෙතෙක් කල් ජීවත් වුණේ බෙහෙත් නිසාමයි.

කොළඹ නගරයේ සංඥා කණු අසල රැඳුණු අමායා එතන නතර වන වාහනයක් වාහනයක් ගාණේ ගිහින් අතපෑවේ තමන්ගේ මව වෙනුවෙන්.

"මහත්තයා අනේ අම්මාට බෙහෙත් ගන්න කීයක් හරි දීලා යන්න"

"පින් සිද්ධවෙයි මහත්තයා"

"මහත්තයා මහත්තයා අනේ අහක බලා ගන්න එපා මහත්තයා"

"කීයක් හරි දීලා යන්න මහත්තයා"

"මගේ අම්මාට බෙහෙත් ගන්න කීයක් හරි දෙන්න මහත්තයා"

වාහන සීයක විතර ජනේලයට තට්ටු කලත් ජනේලයක් පහත් වුණේ වාහන කීයෙන් කීයකද?

එකතු වුණු සල්ලි දිහා බලලා අමායාට සුසුමක් හෙළුණා.

එකතුවෙලා තිබුණේ රු. 1200/- ක් විතර. බෙහෙත් ගන්න ඒ මුදල කොහොමටවත් ප්‍රමාණවත් නෑ.

ඒත් සටන අතඅරින්න ඇය සූදානම් නෑ. ඇගේ මවගේ ජීවිතය රැඳිලා තියෙන්නේ බෙහෙත් නිසාමයි.

ඇය දිගින් දිගටම වාහනයෙන් වාහනයට ගිහින් හිඟමන් යැද්දා.

එක වාහනයකින් නම් කෑම පාර්සලයක් ලැබුණා.

"අනේ නෝනා ගොඩක් පින් නෝනා"

මේ අතරේ සංඥා කණුවට දුරින් ඉඳන්ම මේ පුරුදු ඡායාව දිහා කෙනෙක් බලාගෙන හිටියා.

"ශානු..."

"මොකෝ බං"

"අර ඉස්සරහා ඉන්නේ අමායා නේද"

"මොන අමායාද?"

“ඇයි උඹලාගේ ගෙදර වැඩ කළේ“

“ආ මගේ ෆේවරිට් කෑල්ල“

“විකාර කියවන්න එපා බං“

“හරි හරි කොහේද කියපන්කෝ?“

“අර සිග්නල් එක ළඟ ක්‍රීම් පාට ගවුමක් ඇඳලා“

“ආ.. ඒකි තමා“

ශානුත් නිම්සරත් කළුතරට යන ගමන්. සංඥා කණුව අසල ඔවුන්ගේ වාහනයත් නතර වෙන අවස්ථාව ආවා.

“මහත්තයා මහත්තයා අනේ කීයක් හරි දෙනවාද? අනේ මහත්තයා. අම්මාට බෙහෙත් ගන්න කීයක් හරි“

අමායාට වාහනය අඳුන ගන්න පුළුවන් වුණේ නෑ. වෙන වාහන වලට වගේම මේ වාහනේ වීදුරු වලටත් තට්ටු කරලා කතා කලේ වාහනයේ වීදුරු කළු කරලා තිබ්බාම ඇතුලේ ඉන්නේ කව්ද කියන්න පේන්නේ නැති නිසා.

ශානුත් වීදුරුව පහත් නොකරම නෝන්ජලයට හිනා වෙවී ඉන්නවා නිම්සර දැක්කා.

“ශානු ඔය වීදුරුව ඇරපන්”

“මොකටද”

“ඕක ඇරපන් බං”

“අනේ මහත්..... තයා”

වීදුරුව පහත් වුණත් එක්කම අමායා දැක්කේ ශානුගේ මුහුණ. පෙනුණු ඒ මුහුණ දැක්කාම අමායා ගැස්සුණා.

“ආ මේක ගන්න”

අමායා නිම්සරව දැක්කේ ඒ වෙලාවේ.

නිම්සර ඉක්මණට පසුම්බියෙන් ගත්තු පන්දහසේ නෝට්ටුවක් ශානුගේ පැත්තේ වීදුරුවෙන් අමායා අතට දුන්නා. ඒත් ඇය ඒක ගත්තේ නෑ.

“අනේ එපා මහත්තයා.. එපා.. බොහොම පින්”

“මේක ගන්න ඉක්මණට”

අමායා අහිංසක විදියට නිම්සර දිහා වගේම ශානු දිහාත් බැලුවා.

“ගන්න”

අමායා ඒත් ගත්තේම නෑ.

නිම්සර ඉක්මණට වාහනෙන් බැහැලා නෝට්ටුව අමායාගේ අතේ ගුලි කරලා ආවා.

අමායා නිම්සර දිහා බලාගෙන හිටියේ මොනවා කියන්නද කියලා හිතාගන්න බැරුව

'ගොඩක් පින් මහත්තයා'

අමායා හිතෙන් මුමුණ ගත්තා.

ආලෝක සංඥා පහු කරගෙන ශානුගේ වාහනය ඉදිරියට ඇදෙනකල්ම අමායා ඒ දිහා බලාගෙන හිටියා.

"පව් බං ශානුවා ඒ කෙල්ල"

ශානු ආව පාරේම වාහනේ අයිනකට කරලා නතර කරලා නිම්සරගේ පැත්තට හැරුණා.

"උඹ මට කියපන් නිමා මොකද්ද මේ හැමවෙලේම ඒකිට පව් පව් කියන්නේ. උඹ ඒකි එහේ ඉද්දිත් එහෙමයි. දැන් අද දැකලාත් එහෙමයි"

"ඒ උන්ගේ ජීවිතේ. මේ අපේ ජීවිතේ නිමා"

"නෑ ශානු නෑ. උඹයි ඒකිගේ ජීවිතේ විනාස කළේ"

“ඒකි උඹේ ගෙදර පාඩුවේ හිටියා නම් අදටත් ඒ කෙල්ලට කීයක් හරි හම්බෙනවා“

“අර අහිංසක අම්මාට බෙහෙත් ටික හම්බෙනවා“

“ඒත් උඹ ඒකිව පාරටම ඇදලා දැම්මා. ඒක පවක් නෙමෙයිද කියපන්“

“උඹ පිපෙන්න හිටපු මලක් පොඩි කරලා දැම්මා“

“ඒකි උඹේ කරදර ඉවසගෙන ඒ ගෙදර කී කාලයක් හිටියාද බලපන්. එහෙම හිටියේ අසාවාට කියලා උඹ හිතනවාද? නෑ. උඹ දෙන සල්ලි වලින් ඒ කෙල්ල මල්ලිට ඉගැන්නුවා ශානු“

“මම උඹ ගැන හොඳටම දන්නවා. උඹට ගෑණියෙක් අහු වුණොත් ඒකිව නොමරා මරනවා කියලාත් මම දන්නවා ශානු“

“උඹ ඒ වගේ රිදෙව්වේ ඒ අහිංසක ජීවිතේට. තමන්ගේ අම්මාට බේත් ටිකක් අරන් දෙන්න ඒ කෙල්ල හිඟා කනවා“

“මට නම් මාරම දුකයි ශානු ඇත්තටම“

නිම්සරගේ ඇස් දිලිසෙනවා.

“නිමා මේ උඹට මොකක් වෙලාද කියපන්. මට තේරෙන්නේ නෑ බං“

ශානුත් පුදුම වෙලා.

“මට මුකුත් වෙලා නෑ බං. ඒත් මේ සමාජේ ගැන කලකිරීමයි ඇත්තටම“

“උඹ මහණ වෙන්නද ඉන්නේ නිමා“

“මේවා දැක්කාම මහණ වෙන්න තමා හිතිලා තියෙන්නේ“

“විහිළුවට ගන්න එපා හැමදේම ශානු“

“අපිට සල්ලි තියෙනවා. ඒක ඇත්ත. ඒත් හැම මනුස්සයෙක්ටම සල්ලි නෑ. ඒ මිනිස්සු ඒවා හොයන්නේ අමාරුවෙන්“

“යමන් දැන්“

## *10 වන දිගහැරුම*

අමායාව වෙනදා දකින සංඥා කණුව ළඟ දින ගාණක්ම දකින්න හිටියේ නැති නිසා නිම්සර එදා ශානුට නොදැනෙන්න අහගත්තු අමායාගේ ගෙදර හොයා ගෙන ගියා.

'කියපු විදියට නම් තැන මේක තමා'

'බලමු ගිහින්'

කවදාවත් නොදැකපු අති සුඛෝපභෝගී වාහනයක් අමායාගේ ගෙදර ඉස්සරහා පාරේ නවත්තලා තියෙනවා දැකපු වටපිටාවේ මිනිස්සු ගෙවල් වලින් එළියට ඇවිත් හොරෙන් එහෙන් මෙහෙන් බලනවා නිම්සර දැකලා ඔහුට කට කොණින් හිනාත් ගියා.

පාර අයිනෙන් වාහනය නවත්තපු ඔහු හෙමින් හෙමින් අඩි පාර දිගේ අමායාගේ ගෙදර මිදුලට ගියා.

"ගෙදර කව්ද"

"ගෙදර කව්ද"

අමායා හිටියේ වත්තෙන් හොයා ගත්තු මඤ්ඤොක්කා අලයක් තම්බන ගමන්. අම්මාට පොඩ්ඩක්වත් මහන්සි වෙන්න නොදී උණු වතුර රත් කරලා පුළුවන් විදියට එහෙන් මෙහෙන් හොයා ගත්තු අල වර්ගයක් කාලා තමා ඔවුන් ජීවත් වෙන්නේ.

බෙහෙත් වල මිල ගණන් අධික නිසාම අමායාට රැකියාවක් වත් නැති නිසාම අතපාලා හොයා ගන්න කීයක් හරි පොඩි මුදලකින් ජීවත් වෙන්නේ කියා ගන්න බැරි තරම් අපහසුවෙන්.

ඇඳගෙන හිටපු රෙද්දෙන් අත පිහදාගෙන ඉක්මණට ඉස්සරහා පැත්තට ආවේ කතා කරනවා ඇහුණු හඬට.

අමායාගේ ඇස් පුදුමෙන් ලොකු වුණා.

“මහත්... තයා...”

“මහත්... තයා... මේ පැත්තේ”

“මම මේ ළඟකට ආව ගමන්”

“ගේ හොයා ගත්තේ කොහොමද මහත්තයා. මීට කලින් ඇවිත් නෑනේ”

"ශානුගෙන් අහගත්තේ"

ශානුගේ නම කිව්වා විතරයි අමායා ගැස්සුණ විදිය නිම්සරත් දැක්කා.

'පව් නම ඇහුණත් බය වෙනවා'

"මහත්තයාට ඉඳගන්න දෙන්න හොඳ පුටුවක්වත් නෑ මහත්තයා. මේකේවත් ඉඳගන්න"

අමායා ඉක්මණට අබලන් වෙලා තිබුණු පුටුව, ගවුමට උඩින් ඇඳගෙන හිටපු රෙද්දෙන්ම පිහදාලා නිම්සරට ඉඳගන්න දුන්නා.

නිම්සර කෝටිපති ව්‍යාපාරිකයෙක් වුණත් කවදාත් දුප්පත්කම් පොහොසත්කම් සලකපු කෙනෙක් නෙමෙයි. ඒ මනුස්සකම් නිසාම වෙන්න ඇති මේ අඩු වයසින්ම ඔහු මේ තත්වයෙන් ජීවත් වෙන්නේ.

නිම්සර වාඩි වුණේ අමායාගේ කුඩා නිවහන දිහා බලාගෙනමයි. දුප්පත්කමින් මිරිකිලා ඉන්න අමායාගේ මේ ජීවිතේ ගැන ඔහුට ලොකු අනුකම්පාවක් දැණුනා.

“මහත්තයාට බොන්න තැඹිලි ගෙඩියක් ගේන්නද?”

අමායා බිම බලාගෙන එහෙම කිව්වේ ගේ හරියේ තේ එකක් දෙන්න තේ කොළ ඩිංගක්වත් නැති නිසා.

“තැඹිලි බොමු”

“ඒක නෙමෙයි අමායා අම්මාට දැන් කොහොමද?”

“අඩුවක් නෑ මහත්තයා. එන්න එන්නම වැඩියි”

“හොඳ ඩොක්ටර් කෙනෙකුට පෙන්නුවේ නැද්ද”

අමායා බිම බලාගත්තා.

“එක පාරක් නම් පෙන්න ගත්තා මහත්තයා ශානු මහත්තයාගේ ගෙදර හිටපු කාලේ. ඒකත් නැති වුණායින් ලොකු සල්ලියක් හම්බුණේ නෑ”

“අම්මාගේ බෙහෙත් ගොඩක් ගණන්. මං හිඟා කාලා හොයා ගන්න කීයෙන් හරි තමා බෙහෙත් ගන්නේ. එදා මහත්තයාට පින් සිද්ධ වෙන්න බෙහෙත් ටික ගත්තා”

අමායා අඩ අඩ මේ කියන දේවල් නිම්සර අහගෙන හිටියා.

“අර කොළඹ වැවක් ළඟ තියෙන ඉස්පිරිතාලේ ඒකට පෙන්නගන්න යන්න ඕනේ. ඒත් මේ ටිකේ මට හොයාගන්න පුළුවන් වුණේ සල්ලි පොඩ්ඩයි මහත්තයා“

“දැන් කෝ අම්මා... මට බලන්න පුළුවන්ද“

“කාමරේ ඉන්නවා මහත්තයා. මං අම්මාව එක්ක එන්නම්“

“එපා එපා මම එන්නම්“

“ඒත් මහත්තයා“

“ඇයි ඒත් කියන්නේ“

“මහත්තයා ලොකු මහත්තයෙක්. අපි....“

නිම්සර කතාවක් නැතුවම නැගිට්ටේ අමායාගේ මව නන්දනී ඉන්න කාමරයට යන්න.

“අම්මේ...“

“අම්මේ.... මේ නිම්සර මහත්තයා. මං අර වැඩ කරපු ගෙදර බේබි මහත්තයාගේ යාළුවෙක්“

"අනේ මහත්තයෝ...."

අම්මාටත් නිම්සරටත් කතා කරන්න ඉඩ දීලා අමායා නිම්සරට තැඹිලි ගෙඩියක් ගේන්න ගියා.

"මගේ දරුවා මම නිසා හරියට දුක් විදිනවා මහත්තයෝ"

"මගේ පව්කාරකම් මේ කෙල්ලට ගෙවන්න වුණේ මොන කරුමෙකටද මන්දා මහත්තයෝ"

"ඉගෙන ගන්න හරි දක්සයි. ඒත් ඉගෙනිල්ලත් නැවැත්තුවා මං නිසා"

නන්දනී කියාගෙන කියාගෙන ගියා.

"අමායා හිත හයිය කෙල්ලෙක් අම්මේ"

"අම්මා සනීප වෙන එක තමා අමායාගේ එකම බලාපොරොත්තුව"

"අපි අම්මාව පෙන්නමු කොළඹ ඩොක්ටර් කෙනෙකුට"

"අනේ මහත්තයා ඕවා කොහොම කරන්නද"

"මේ කෙල්ල මේ සල්ලි ටික හොයාගන්නෙත් ළඟ ගෙදරක වැඩ කරලාඑ"

'ඒ කියන්නේ අමායා කොළඹ කරන දේ මේ අම්මා දන්නේ නැද්ද'

'පව් දෙයියනේ'

"ආ මහත්තයා මේක බොන්න"

අමායා තැඹිලි වතුර වීදුරුව අත් දෙකෙන්ම නිම්සරට පිළිගැන්නුවා.

"මහත්තයා... අම්මාට දවල් බෙහෙත් ටික දෙන්න වෙලාව හරි. මහත්තයා ඉද්දි කැව්වාට කමක් නැද්ද"

"මම ඉන්නම් ඔයා කවන්න"

"උඹට තියෙනවා නේද මයේ පුතේ"

"මට තියෙනවා අම්මා. අම්මා කන්න.

අමායා බෙදාගෙන ආව මඤ්ඤොක්කා අල පිඟාන නන්දනීට කවලා බෙහෙත් ටිකත් පෙව්වා.

'බත් නැතුව ඇති. අපිට කොච්චර සල්ලිද.. ඒත් මේ මිනිස්සුන්ට බත් කටක් කන්න සල්ලි නෑ'

නිම්සරට අමායා ගැන ගොඩක් දුක හිතුණා.

අමායාගේ අම්මාට කවලා බෙහෙත් ටික දීලා නිම්සරත් එක්කම ආයේමත් එළිමහනට ආවේ ටිකක් කතා කරන්න.

“මහත්තයාට කෑම ටිකක්....“

අමායා එහෙම ඇහුවාට නිම්සරට දැනුනා මේ ගේ හරියේ කිසිම දෙයක් නැති විත්තිය.

“මම කාලා ආවේ අමායා. ඔයාට කෑම තියෙනවාද?“

“ඔව් මහත්තයා“

“අමායා...“

“මහත්තයා...“

“අපි හෙට අම්මාව කොළඹ ඩොක්ටර්ට පෙන්නමු“

අමායා නිම්සරගේ මූණ දිහා බැලුවා.

“සල්ලි ගැන හිතන්න එපා. මං ඒ දේවල් බලාගන්නම්. ඔයා හෙට ලෑස්ති වෙන්න. මං එන්නම් එක්කගෙන යන්න“

“ඒත් මහත්තයා...“

"මට මගේ අම්මා කියලා හිතලා ඒ දේ කරන්න ඉඩ දෙන්න අමායා"

අමායාගේ ඇස් වලින් කඳුළු ගලාගෙන ගියා. තවමත් මේ සමාජේ මේ වගේ මිනිස්සු ඉන්නවා නේද කියලා ඇයට හිතුණා.

මේ වෙලාවේ නන්දනී ඉන්න තත්ත්වෙත් එක්ක ඇගේ ජීවිතේ බේරගන්න නම් මේක කරන්නම වෙනවා.

"අඩන්න එපා අමායා. අපි පුළුවන් තරම් උත්සාහ කරමු. බැරි වෙන්නේ නෑ හොඳද"

"මහත්තයාට ගොඩක් පින් මහත්තයා. ඒ මගේ ජීවිතේ"

"මම ඒක දන්නවා. ඒ නිසාම තමා මම උදව් කරන්නේ"

"එහෙනම් මම ගිහින් එන්නම්"

"ආ මේක තියාගන්න. ගෙදරට ඕන කරන බඩු ටිකක් ගන්න"

"අනේ එපා මහත්තයා. එදත් මට මහත්තයා ගොඩක් සල්ලි දුන්නා"

“අමායා මේ මගේ තරහා අවුස්සන්න එපා. මේක තියාගන්න“

“ආයේමත් කොළඹ ටවුන් එකේ මට ජේන්න ඉන්න එපා. ඒ වැඩේ ඔයා වගේ කෙනෙක්ට ගැලපෙන්නේ නෑ අමායා“

නිම්සර ඒක කිව්වේ තරවටුවක් වගේ.

“ඒත් මහත්තයා...“

“ඒත් මේත් නෙමෙයි.. තමුන්ට ඒ වගේ වැඩක් හරියන්නේ නෑ කියන්න තේරෙන්නේ නැද්ද“

“නොදන්නකමට එකෙක්ගෙන් විනාස වුණා. දැන් දැන දැනම විනාස වෙන්නද හදන්නේ ආ“

“මම මේ දේවල් හිතලා කළා නෙමෙයි මහත්තයා“

නිම්සර මෙච්චර වෙලා තරහෙන් කතා කළත් ඔහුට අමායා ගැන දුක හිතුණා.

“මම දන්නවා අමායා. ඒත් ඔයා ආයේමත් කොළඹ යන්න එපා“

“ආයේමත් ගිහින් එක එකාට අතපාලා අහු වුණොත් කඩනවා කකුල් දෙක“

අමායාගේ කඳුළු නතර වෙලා මූණට හිනාවක් ආවා.

අමායාගේ ඒ සුන්දර අහිංසක මූණට වැටුණු හිනාව නිම්සරට දරා ගන්න බැරි වුණේ නිම්සරගේ හිතේ තිබුණු ආදරේ තව තවත් වැඩි වුණු හින්දා.

"අම්මාත් එක්ක පරිස්සමෙන් ඉන්න. මම හෙට එන්නම්"

"මහත්තයාත් පරිස්සමෙන්"

නිම්සර අමායාගේ ඔළුව ළඟටම අත ගෙනිච්චත් ස්පර්ශ කරන්න තරම් හයියක් නිම්සරට තිබුණේ නෑ.

ඒ වේගෙන්ම හැරුණු නිම්සර වාහනේට නැගලා දොර වහගත්තා.

## *11 වන දිගහැරුම*

නිම්සර අමායාගේ මව සති දෙකකට වරක් කොළඹ එක්කගෙන ගිහින් වෛද්‍යවරයාට පෙන්නලා බෙහෙත් අරගෙන දෙන එක ඇත්තටම අමායාටත් නන්දනීටත් ඔළුවට ලොකු බරක් වුණා.

"අනේ මහත්තයාට අපි නිසා නොසෑහෙන්න කරදරයි"

"ඔව් මහත්තයා. මහත්තයා මෙහෙම අපිට වියදම් කරන එක මට නම් දරා ගන්න බෑ.

"මට මොන කරදරයක්වත් නෑ අම්මා.. අම්මා සනීප වෙන්නකෝ"

නිම්සර අමායාගේ මවට අම්මා කියලා කතා කරද්දි අමායාගේ ඇස් පුදුමෙන් විසාල වුණා.

අමායා එයාගේ ජීවිතේ බිල්ලට දීලා හම්බකරපු සල්ලි වලින් වියදම් කරලා උගන්වපු එකම මල්ලිත් අමායාව වගේම අම්මාවත් අතඇරලා දාලා.

තමන්ගේ දරුවාවත් තමන්ට නොසලකද්දි, පිට කෙනෙක් තමන්ට මෙහෙම සලකද්දි, තමන්ගේ අම්මාට සලකද්දි, ඒ දැනෙන හැඟීම....

.......................................

අමායා මල්ලිව හොයාගෙන කොළඹට ආවේ හැමදාමත් මෙහෙම නිම්සර එයාලා වෙනුවෙන් කරදර වෙනවා බලන් ඉන්න බැරි නිසා.

අම්මාත් විස්තර කියපු විදියට මල්ලි වැඩ කලේ කොළඹ තිබුණු උසම ගොඩනැගිල්ලේ. මේ ගොඩනැගිල්ලේ තරමට මල්ලිව කොහේ කියලා හොයන්නද?

අමායා ඒ ගොඩනැගිල්ලෙන් එළියට එන හැම කෙනෙක් දිහාම එළියට වෙලා බල බල හිටියේ අද කොහොම හරි මල්ලිව මුණ ගැහෙන්න ඕන නිසා.

දහසක් රූප මැද්දේ ඇස් එහාට මෙහාට ගිහින් ගිහින් අමායාගේ ඇස් වේදනාවට පත් වෙලා. ඒත් ආපු කාර්යය අතඅරින්න ඇය කැමති වුණේ නෑ.

ඒ රූප අතරින් තද නිල්පාට කලිසමට ලා නිල් පාට අත් දිග ෂර්ට් එක ඇඳලා ලස්සන ටයි

පටියක් පැළඳගත්තු රූපේ දැකලා අමායාට ලෝබ හිතුණා.

පුංචියට කලිසම් කොටයකුත් ගහගෙන ගේ එහේ මෙහේ දුව දුව හිටපු තමන්ගේ මල්ලි අද මේ ඉන්න විදිය ගැන අමායා නම් ගොඩක් සතුටු වුණා.

තමන්ගේ මහන්සිය පොඩ්ඩක්වත් අපතේ නොයෑම ගැන, ඇය විඳපු පීඩාවන් වලට අසාධාරණයක් නොකරපු එක ගැන, ඇය දෙවියන්ට බුදුන්ට ස්තූති කළා.

"මල්ලි...."

"මල්ලි..."

අමායා ගිහින් සංඛගේ අතේ එල්ලුණා.

"මොන මල්ලියෙක්ද?"

"අනේ මල්ලි ඇයි ඔහොම කතා කරන්නේ"

"නැතුව වෙන කොහොම කතා කරන්නද?. මට මෙතන ලැජ්ජා නොකර යනවා යන්න"

හයියෙන් බනින්න බැරි කමට දත් අතරින් මල්ලි කතා කළා.

“අනේ මල්ලි එහෙම කියන්න එපා. මම ගැන බලන්න එපා. අම්මා ගැන බලන්න“

“මේ අහනවා. මට මෙහේ කව්රුවත් නෑ. තවත් මට මෙතන ලැජ්ජා කරන්න එපා ප්ලීස්“

අමායාගේ මල්ලි සංඛ එහෙම කියලා යන්න ගියේ අමායාගේ මූණවත් නොබලා.

තවත් මොකට කතා කරනවාද?

‘කමක් නෑ මල්ලි. ඔයාවත් ඔහොම සැපට ඉන්නවනේ. ඒ ගැන මට සතුටුයි‘

‘අපි කොහොම හරි ජීවත් වෙන්නම්‘

...............................................

අමායා, නිම්සර සමග ඇගේ මව මේ වතාවේ වෛද්‍යවරයාට පෙන්වන්න එක්කගෙන ගිය වෙලාවේ වෛද්‍යවරුන් පැවසුවේ ඉතා අසුබ ආරංචියක්.

අමායා ඇගේ මව නන්දනීව එළියෙන් ඉන්දවලා වෛද්‍යවරයාගේ පෙර දැනුම්දීමක් මත නැවත ඔහු ළඟට ආවා.

sinhalaebooks.com

“මෙහෙමයි. ජීවිතේ වුණත් හැමෝම එනකොට අරගෙන එන ආයුෂ ප්‍රමාණයක් තියෙනවා. අපි මොන වර්ගෙන් කොච්චර හොඳ බෙහෙත් දුන්නත් එයාලා එයාලගේ ජීවිතේ අරගෙන ආපු ආයුෂ ඉවර වෙනකොට යන්න යනවා තේරුණාද”

“ඒ... ඒ.... කිව්වේ ඩොක්ටර්”

අමායාට ගොත ගැහුණා.

“අපි බෙහෙත් දුන්නාට එයාගේ ඇඟ ගොඩක් දුර්වලයි. මුලදිම හරි ප්‍රතිකාර ලැබිලා නැති නිසා අපේ බෙහෙත් වලින් හරි ප්‍රතිකාර ගන්න එක අමාරු වැඩක්”

“වෙන කරන්න දෙයක් ඇත්තෙම නැද්ද ඩොක්ටර්”

නිම්සරටත් එහෙම ඇහුවේ ලොකු මුදලක් වියදම් කරලා හරි ඇයව ජීවත් කරන්න පුළුවන් නම් කියලා.

“මේ බෙහෙත් ටිකත් දෙන්න. ඒත් මට ලොකු බලාපොරොත්තු දෙන්න බෑ ඔයාලට”

“නිම්සර මහත්තයා..... මගේ අම්මා...”

නිම්සර අමායාත් එක්කම එළියට ඇවිත් අම්මාට නොපෙනෙන තැනකට අමායාව එක්කගෙන ගියේ අමායා මෙහෙම අඩනවා දැක්කොත් නන්දනීගේ හිත කලබල වෙන නිසා.

“මේ අහන්න අමායා. ඩොක්ටර්ස්ලා කියන විදියට ලෙඩ්ඩු හැම කෙනාම මැරෙන්නේ නෑ.”

“අපි අම්මාව හොඳට බලාගමු තේරුණාද”

“අම්මාට මුකුත් වෙන්නේ නෑ”

“දැන් අඩන්න එපා. අම්මා දැක්කොත් අහන ප්‍රශ්න වලට උත්තර නැති වෙයි. අනික අම්මා හිතයි මම ඔයාට මොනවා හරි කරලා ඔයා අඩනවා කියලා”

අමායාගේ ඇඩිල්ල නැවතිලා මූණට හිනාවක් ආවා.

‘ඔයාගේ හිත ගොඩක් ශක්තිමත් කෙල්ලේ’

නිම්සර හිතුවා.

අමායාගේ හිත ඇතුලේ තිබුණු දුක අමායා ඇගේ මවට පෙන්නුවේ නෑ.

..............................................

“අම්මා..“

“අම්මා....“

“මේ බෙහෙත් ටික බොන්න දැන් නැගිටින්නකෝ“

“අම්මා...“

අමායාගේ හිතට අමුත්තක් දැණුනා.

බෙහෙත් ටිකත් වතුර වීදුරුවත් පැත්තකින් තියපු අමායා අම්මා ළඟට ආවේ හිතේ කැලඹීමෙන්.

“අනේ අම්මා කතා කරන්නකෝ“

“අම්මා....“

“අම්මා...“

අමායා ගිරිය යටින් කෑගැහුවා.

නොහිතපු මොහොතක අමායාගේ අම්මා නන්දනී මේ ලෝකේ දාලා ගියේ අමායාව තනි කරලා.

නිම්සරගේ මැදිහත් වීමෙන් ඉතා චාම්ව වුණත් නන්දනීගේ අවසන් කටයුතු හොඳින් කරගන්න අවස්ථාව අමායාට ලැබුණා.

“මහත්තයා මට මේ කරපු උදව් මට කවදාවත් අමතක කරන්න බෑ මහත්තයා“

“මගේ අම්මා වුණත් මහත්තයාට මේ වෙලාවෙත් කොහේ හරි ඉඳන් පින් දෙනවා ඇති“

“මේ අහන්න අමායා. මේවා කලේ පින් බලාගෙන නෙමෙයි මම. ඔයාලට බැරි වෙලාවේ මම උදව් කළා“

“දැන් හිත හදාගෙන ජීවිතේට මූණ දෙන්න අමායා“

“ඔයා අම්මාට ගොඩක් හොඳට සැලකුවා. කිසිම අඩුවක් නොකර හැමදේම ඔයාගේ අත්දෙකෙන්ම ඔයා කළා“

“ඉතිං අම්මා මේ ලෝකෙන් ගියේ ගොඩක් සතුටින්. ඒ නිසා අම්මාට සතුටින් ඒ ගමන යන්න දෙන්න“

## *12 වන දිගහැරුම*

අම්මාත් නැතුව තනිවම ජීවිතේ ගෙවන අමායා ගැන නිම්සර හොයලා බැලුවේ නිම්සරගේ හිතේ තිබුණු ආදරේ නිසා. ඒත් අමායාට ඒ වගක් ඇගෙව්වේ නැත්තේ ඇගෙන් ප්‍රයෝජන ගන්න හදනවා කියලා හිතාවිදෝ කියලා හිතුණු නිසා.

"අමායා..."

"මහත්තයා...."

"අපි ටිකක් එළියට යමුද ඔයාට ප්‍රශ්නයක් නැත්තම් විතරක්? මට ඔයත් එක්ක ටිකක් කතා කරන්න ඕනේ"

"මම මහත්තයා එක්ක ගියා කියලා මට මොනවා වෙන්නද මහත්තයා. මහත්තයාට තමා ප්‍රශ්නයක් වෙන්නේ"

"මට ප්‍රශ්නයක් නෑ ඔයා ඒ ගැන හිතන්න එපා. යමුද"

"හා මහත්තයා යමු"

අමායා නිම්සරත් එක්ක එළියට යන්න කැමති වුණා.

නිම්සර අමායාව එක්කගෙන ආවේ ටිකක් නිදහස් තැනකට.

"ඉතිං අමායා... ඔයා මොනවාද කන්නේ"

"අනේ මහත්තයා එහෙම විශේෂයක් නෑ. මට වතුර වීදුරුවක් තිබුණොත් ඇති"

"වතුර කන්න බෑනේ ළමයෝ බොනවා මිසක්"

නිම්සර හිනා වුණා.

"මම වතුර බීලා ජීවත් වුණ කෙනෙක් මහත්තයා"

නිම්සරගේ හිනාව නැතුව ගියේ ක්ෂණිකව.

"අමායා...."

"ඔව් මහත්තයා. මගේ ජීවිතේ ගැන මටම හිතාගන්න බෑ මහත්තයා"

"මහත්තයාට මතකද අර මහත්තයලා ඔක්කොම ශානු බේබිගේ ගෙදර ආව දවසේ කෑම ගොඩක් හදලා තිබුණේ"

"ඔව් මතකයි"

අමායාට එදා දවස මතක් වුණා.

අහම්බෙන් කුස්සියට ආපු නිලීමා දැක්කේ අමායා අමුත්තන්ට හදපු කෑම පිඟානකින් පැටිස් එකක් අතට ගන්නවා.

“තමුසේ මොනවාද ඔය කරන්නේ“

අමායාගේ කොණ්ඩෙන් අල්ල ගත්තු නිලීමා හොඳටම කෑගැහුවා.

“කියනවා තමුසේ කොහොමද ඒ මිනිස්සුන්ට හදපු කෑම කන්නේ. කතා කරනවා“

“අනේ නෝනා ඉතුරු වෙලා තිබුණු නිසා මම ගත්තේ“

ළඟ තිබුණු වතුර වීදුරුවක් අතට ගත්තු නිලීමා අමායාගේ මූණට වතුර ගැහුවා.

“ආයේ උඹට කෑම නෑ තේරුණාද“

“ආයේ මේකිට කෑම දෙන්න බෑ මේ ගෙදර. මං උඹට කියන්නේ මාලනී“

“මට පේන්න ආයේ මේකි කෑම කෑවොත් උඹවත් එළවනවා මේ ගෙදරින් දැනගනින්“

ළඟ හිටපු මාලනීටකත් කෑගහලා තමා නිලීමා යන්න ගියේ.

“එදා මම කුස්සියේ ඉතුරු වෙලා තිබුණු පැටිස් එකක් කනවා ලොකු මැඩම් දැකලා මට අතේ තිබුණු වතුර වීදුරුව ඇඟට හැලුවා“

“එදා ඉඳන් මට කෑම දුන්නේ නෑ මහත්තයා. මම වතුර බීලා තමා හිටියේ“

“මොනවා..? ඔයා ඇත්තමද කියන්නේ“

“මම බොරු කියලා මහත්තයාගෙන් මොනවා ගන්නද මහත්තයා“

“මහත්තයාට පින් සිද්ධ වෙන්න එදා මහත්තයා අපේ ගෙදර ආව දවසේ ඉඳන් තමා මම කෑවේ“

“අනිත් දවස්වල අම්මාට කන්න දෙන්න මොනවා හරි හදුවා මිසක් මම කෑවේ නෑ මහත්තයා. එහෙම කන්න දේවල් තිබුණෙත් නෑ. සල්ලි තිබුණෙත් නෑ“

නිම්සරගේ පපුවේ ඇති වුණ දැවිල්ල ගතිය ඇඟ පුරාම විහිදෙනවා එයාට දැණුනා.

නිම්සර මේ අතරේ කෑම ඇණවුම් කළා.

වේටර්වරයෙක් ඇවිත් හැඳි ගෑරුප්පු තියද්දි අමායාගේ මූණ අමුතු වුණේ ඒවගෙන් කන්න දන්නේ නැති හින්දා.

නිම්සරම අමායාගේ පිඟානට කෑම බෙදුවා.

“අතින් කන්න. අත හොදන්න තැනක් තියෙනවා“

අමායාගේ කඳුළු පිරුණු ඇස් නිම්සරගේ දෙනෙතට අහු වුණත් එය නොදැකපු ගාණට ඔහු හිටියා.

“මහත්තයා බෙදා ගන්නකෝ“

“මම ගන්නම් ඔයා කන්නකෝ. තව මොනවා හරි ඕනේද“

“අනේ එපා මහත්තයා. මේ වැඩිත් තරම්“

“මහත්තයාට මම හින්දා ලැජ්ජායි නේද“

“ඒ මොකටද ලැජ්ජා වෙන්නේ“

“මම මේවගෙන් කන්න දන්නේ නෑනේ. මෙතන ඉන්න ඔක්කොම කන්නේ හැන්දෙන්නේ“

අමායා වටපිට බලලා කිව්වා.

“කව්රුත් කරන ඒවා කරන්න යන්න ඕනේ නෑ. තමන්ට පුළුවන් දේ කළාම ඇති. තේරුණාද“

“තේරුණා“

අමායා හිනා වුණා.

“ඉතිං..... ඔයාට මල්ලි  කෙනෙක් හිටියා නේද අමායා“

“ඔව් මහත්තයා. එයා කොළඹ විශ්ව විද්‍යාලේ ඉගෙන ගත්තේ. දැන් ලොකු රස්සාවක් කරනවා“

“එයා ඔයාගේ ගෙදර නෑනේ නේද“

“අනේ නෑ මහත්තයා. දැන් මල්ලිගේ සමාජෙට මාව ගැලපෙන්නේ නෑ. එයා දැන් මහත්තයා වගේ ලොකු මහත්තයෙක්“

“වැඩ කරන්නේ අර ලොකු උස බිල්ඩින් දෙකක් තියෙන්නේ අන්න ඒකේ“

“WTC එකේද“

“අනේ මන්දා මහත්තයා වෙන්න ඇති“

අමායා එයාගේ මල්ලි ගැන කතා කරද්දි ඒ අහිංසක ඇස් දිලිසෙනවා නිම්සර බලාගෙන හිටියා.

"ඔයාට මල්ලිව හම්බෙන්නේ නැද්ද? ඔයාව බලන්න එනවානේ"

"අනේ නෑ මහත්තයා. එක දවසක් මම ඒ බිල්ඩිම ළඟට ගියා මල්ලිව හම්බෙන්න. තව දවසක් මල්ලි බඳින්න ඉන්න ගෑණු ළමයා එක්ක වෙන්න ඇති කොළඹදී හම්බුණා"

"ඒ දවස් දෙකේම මං කතා කළාට එයා මාව අඳුරන්නේ නෑ කියලා යන්න ගියා"

අමායාගේ හිත කොණකවත් මල්ලි ගැන තරහක් තිබුණේ නෑ. ඔහු අමායාට සලකන්නේ නෑ කියලා කියද්දි වත් මුහුණේ කිසිම තරහක් නැතුව කතා කරනවා නිම්සර බලාගෙන හිටියේ පුදුමෙන්.

'කෙල්ලට කොච්චර දුක ඇද්ද. තමන්ගේ ජීවිතේ විනාස කරගෙන මල්ලිට සල්ලි වියදම් කරලා කරලා උගන්නලා මෙහෙම නොසලකා යද්දි'

"මං මගේ අම්මාට මට පුළුවන් විදියට සැලකුවා. මල්ලිටත් කැම්පස් යනකම්ම වියදම් ඔක්කොම

හොයලා මට පුළුවන් දේවල් කළා මහත්තයා. ඉතිං මට සතුටුයි“

“කන්නකෝ අමායා ඔයා මේවාට ආස නැද්ද“

කෑම එක අත ගගා ඉන්නවා දැකපු නිම්සර ඇහුවා.

“අනේ එහෙම නෑ මහත්තයා. මල්ලි කාලාද දන්නෙත් නෑ කියලා මතක් වුණා. එයාත් ගොඩක් මහන්සි වෙනවා ඇති රස්සාව නිසා“

“අමායා ඔයා මේ වගේ කෙනෙක් වුණේ කොහොමද? මට තේරෙන්නේ නෑ“

“ඒ කිව්වේ මහත්තයා?“

අමායා පුදුම වුණා.

“ඔයාට නොසලකන අය ගැනත් ඔයා වද වෙනවා“

“මම ආයේමත් දෙයක් බලාපොරොත්තු වෙලා කිසි දෙයක් කලේ නෑ මහත්තයා. ඒ මගේ මල්ලි. එක කුස උපන් සහෝදරයා. එයාට වෛර කරන්න මට බෑ“

“මම මෙහෙම අහනවාට මාත් එක්ක තරහා වෙන්න එපා අමායා“

“ඕන දෙයක් අහන්න මහත්තයා. මං මොකටද තරහා වෙන්නේ“

“ඔයා ශානුට....“

අමායා ගැස්සෙනවා නිම්සර බලාගෙන හිටියා.

“ශානු කියද්දිත් ඔයා හැමවෙලේම ගැස්සෙනවා අමායා. ඔයා ඒ තරමට එයාට බය වුණේ කොහොමද?“

“ශානු කියන්නේ මහත්තයාගේ යාළුවා නේද“

“එයා යාළුවා වුණාට ඔයාට කරපු දේවල් වලට මම එයත් එක්ක රණ්ඩු කලා අමායා. මාව විශ්වාස කරන්න“

අමායා පුදුම වෙලා බලාගෙන හිටියා.

“ඔයා ඇයි පරිස්සම් වුණේ නැත්තේ අමායා“

“මහත්තයා මට විහිළු කරනවාද මහත්තයා“

"ශානු කියන්නේ කව්ද කියලා මම දන්නවා. ඔයා වගේ පොඩි කෙල්ලෙක් උඹට අහු වුණා කියන්නේ ඒ ගැන කතා කරලා වැඩක් නෑ"

"ශානු බේබි එක්ක මම හිතාමතා හිටියා කියලා මහත්තයා හිතුවාද? හිතුවාත් වැරැද්දකුත් නෑ නේද මහත්තයා අපි දුප්පත්නේ"

"අමායා මම එහෙම දෙයක් හිතලා කිව්වේ නෑ. සොරි"

"අනේ මොකට සමාව ඉල්ලනවාද මහත්තයා. මම හිතන්නේ නෑ මම තරම් ඒ වේදනාවල් විඳපු කෙනෙක් තවත් ඇති කියලා. ශානු බේබි ඒ තරම් මට වද දුන්නා"

"ශානු බේබි ළඟට ආපු හැම දවසකම මම බේරෙන්න හැදුවත් මට ඒ එක දවසකවත් බේරෙන්න ලැබුණේ නෑ මහත්තයා"

"මට ඒ දවස් මතක් වෙනකොටත් ඇඟ හිරිවැටෙනවා මහත්තයා. මම ඒ තරම් දුක් වින්දා. ඒ දේවල් මම විඳගත්තේ මගේ අම්මාගේ අසනීපේ, මල්ලිගේ ඉගෙනීම ගැන හිතලා"

“ඒ ඇරෙන්න කිසිම කැමැත්තකින් නෙමෙයි. ඒ දෙන්නාව ජීවත් කරවන්නයි මම ඒ දේවල් ඉවසගත්තේ”

“මම ඒ දේවල් වින්දේ නැති වුණා නම් අද මගේ මල්ලි ඉන්න තැන නෑනේ මහත්තයා. එහෙනම් ඉගෙනීම අතරමග නතර වෙලා එක්කෝ රස්තියාදු ගහනවා”

“මම ශානු බේබිට වැරැද්දක් කියන්නේ නෑ මහත්තයා. මගේ පව්කාරකමත් නිසා වෙන්න ඇති මෙහෙම වුණේ”

“මගේ ජීවිතේ මමත් ලස්සනට විඳින්න හිතාගෙන හිටියා. ඒත් ඒක නැති වුණා. ඒකට කමක් නෑ. මගේ අනිත් බලාපොරොත්තු ඉෂ්ට වුණානේ”

“ඉතිං මට සතුටුයි”

ඔළුවත් දෙපැත්තට වනලා අමායා එහෙම කිව්වේ කටපුරා හිනාවෙලා.

නිම්සර බලාගෙන හිටියේ අමායාගේ ලස්සන අහිංසක මූණ දිහා.

“මගේ අම්මා දැනගෙන හිටියේ නෑ මං හිඟා කාපු බවක්. මට එදා බයත් හිතුණා මහත්තයා මොනවා කියයිද දන්නේ නෑ කියලා”

“මම දැනගත්තා අම්මා දන්නේ නෑ කියලා. මොකද අම්මා කෙනෙක් ඒ දේ දැන ගත්තා නම් මැරෙන එක හොඳයි කියලා හිතයි දරුවා හිඟා කනවාට වඩා”

“ඇත්ත මහත්තයා”

“ඔයාට තනියම ඔය ගෙදර ඉන්න පුළුවන්ද අමායා”

“අනේ මහත්තයා මට මොකද බැරි”

“ඒත් ඔයා ගෑණු ළමයෙක්”

අමායාට මහ සද්දෙන් හිනා ගියා.

“මහත්තයා දැන් හරියට විහිළු කරනවානේ”

“මොකද්ද දැන් මං කරපු විහිළුව”

“වැරදි වචන පාවිච්චි කරන්න එපා. මම ගෑණියෙක් මහත්තයා. හිත හයිය ගෑණියෙක්. මට මගේ ජීවිතේ තනියම ගෙවා ගන්න බැරිකමක් නෑනේ”

## *13 වන දිගහැරුම*

අමායාගේ හිතේ නිම්සර ගැන මොක්ද්දෝ කියාගන්න බැරි හැඟීමක් ඇති වෙලා කියලා ඇයට දැණුනා.

එදා ගමනින් පස්සේ ඒ හැඟීම තවත් වැඩි වෙලා.

ඒත් එහෙම හිතන්නවත් බැරි බව හිතිලා අමායා තමන්ටම ටොක්කක් ඇන ගත්තේ රිදෙන්නම.

'මටත් පිස්සු. නිම්සර මහත්තයාට පිස්සු නෑ මං වගේ දුප්පත් කෙල්ලෙකුට ආදරේ කරන්න'

'ඇරත් ඒ මහත්තයා මට කරන්නේ අනුකම්පාවක්'

'අම්මා අප්පා නැති වැඩකාර සල්ලං වෙච්ච කෙල්ලෙකුට මොන ආදරයක්ද'

'ඒ මහත්තයාට ලස්සන නෝනා කෙනෙක් ඇති'

'මහත්තයාත් ලස්සනයිනේ'

අමායා තමන් එක්කම හිනා වුණා.

..............................................

ජීවිතේ කොහොම හරි ඉදිරියට ගෙවා ගන්න ඕන නිසාම අමායා නිම්සරටවත් නොකියා පිරිසිදු කිරීමේ ආයතනයක රැකියාවකට බැඳුණා. අද ඒ රැකියාවේ පළවෙනි දවස.

එදා ඇය ඇගේ මල්ලිව මුණ ගැහෙන්න ගියපු පිට්ටු බම්බු ගොඩනැගිල්ලට තමා රැකියාවට ගියේ.

අමායාට පැවරිලා තිබුණේ මෙම ආයතනයේ ප්‍රධානියාගේ කාර්යාල කාමරය පිරිසිදු කිරීමට.

අමායා මුලින්ම මේ කාර්යාල කාමරේ දැක්කාම ඇස් පුදුමෙන් ලොකු වුණේ ඒකේ තිබුණු දේවල් දැකලා. මොප් එක, කොස්ස, වයිපර් ඔක්කොම අතේ තියාගෙන ඇස් ලොකු කරන් අමායා ඒ දිහා බලන් හිටියා.

ලස්සන ක්‍රීම් පාට කුෂන් කරපු ලොකු පුටුවක්, ඒකටම ගැලපෙන දුඹුරු පාට ලොකු මේසයක්, ඒක උඩ තියෙන ලැප් ටොප් එකක් තව තව මහා ගොඩක් ජාති. හරිම ලස්සනයි.

අමායා මුලින්ම කළේ කාර්යාල කාමරේ තිබුණු මේසය, පුටුව පිහිදාලා, කාර්යාල කාමරයෙන්ම හොයාගත්තු වීදුරු භාජනයකට වතුර පුරවලා

ඉක්මණට එළියට ගිහින් කඩාගෙන ආපු මල් කිහිපයක් ඒකට දාලා කාර්යාල කාමරය සකස් කරපු එක.

ඊට පස්සේ හිමින් හිමින් බිම පිරිසිදු කරන්න පටන් ගත්තා.

"ලීලා ඇන්ටි ගුඩ් මොර්නින්"

කාමරේ දොර ඇරගෙන එහෙම කියාගෙන ආපු කෙනා දිහා අමායා බැලුවා.

දෙන්නාට දෙන්නා මූණ බලාගෙන හිටියේ පුදුම වෙලා.

"අමායා..."

"නිම්සර මහත්තයා"

"ඔයා මෙහේ"

"ඔව් මහත්තයා අද ඉඳන් මම වැඩ"

"මට කිව්වෙත් නෑ"

අමායා හිනා වුණා.

කාමරය පුරාම නිම්සර ඇස් ගෙනිච්චා.

කලින් හිටපු කෙනාට වඩා ගොඩක් පිරිසිදුව තමන්ගේ කාමරේ පිළිවෙල කරලා තියෙනවා දැකලා නිම්සරට ඇත්තටම සතුටු හිතුණා.

ස්භාවික මල් වලින් පිරුණු මල් බඳුන අතට ගත්තු නිම්සර ඒකේ සුවඳ වින්දේ මුළු දවසම ප්‍රබෝධමත්ව ගත කරන්න.

"ඔයාද මේ මල් දැම්මේ අමායා"

"ඔව් මහත්තයා"

"ලස්සනයි"

අමායා අහිංසකව හිනා වුණා.

"ඔයාගේ වැඩ ඉවර වෙලා මට තේ එකක් හදලා දෙනවාද අමායා"

තේ හදන්න වෙනම සේවක පිරිසක් හිටියාත් නිම්සරට හිතුණා අමායා හදන තේ එකක් බොන්න.

"හොඳයි මහත්තයා"

අමායා නිම්සරගේ කාර්යාල කාමරයටම යාබදව තියෙන ඔහුගේ කාර්යාල පැන්ට්‍රියට ගිහින් තේ හදන්න වතුර උණු කළා. ඒ අතරේම ඇය දවල්

ආහාරයට ගෙනාපු පුංචි බිස්කට් පැකට් එකත් කඩලා ඒකත් පීරිසියකට තිබ්බා.

තේ එකත් හදාගෙන නිම්සර ළඟට ගියා.

“බිස්කට් කොහොන්ද“

“මම එනකොට ගෙනාවා මහත්තයා“

“එතකොට ඔයාට“

“මට තියෙනවා. මහත්තයා කන්න“

“ඕනේ වුණොත් මහත්තයා මට කතා කරන්නකෝ“

නිම්සරට තේ සමග බිස්කට් පිළිගන්වපු අමායා එළියට එන්න ආවා.

..............................................

හරියටම දවල් දොළහා වෙනකොට නිම්සර පවරපු විදියට නිම්සර ගෙදරින් ගෙනත් තිබුණු කෑම එකත් පිඟානකට තියලා වතුර වීදුරුවකුත් තියලා අමායා ඔහුගේ කෑම කන තැන සූදානම් කළේ ඔහු උදේ දැනුම් දීපු විදියට.

“මහත්තයා... කෑම එක ලෑස්ති කළා“

“අමායා කන්නේ කොහොමද“

“මම පහළ කැන්ටිමට යනවා සර්“

“හරි එහෙනම් කාලා එන්න“

අමායා දොරත් වහගෙන නිම්සරට එහෙම කියලා පහළට ආවාත් එයාගේ අතේ කන්න සල්ලි තිබුණේ නෑ. තිබුණු සල්ලි වලින් අරන් ආපු බිස්කට් පැකට් එකත් නිම්සරට දුන්නු නිසා කන්න දෙයක් නෑ.

නිම්සරටත් අමායා කනවදෝ කියන සැකය හිතට ආපු නිසාම පහල ආපන ශාලාව පැත්තට ආවේ කාටවත් සැක නොහිතෙන්න වගේම නොපෙනෙන්න. ආයතන කිහිපයකම පිරිස් මෙම ගොඩනැගිල්ල තුල ඉන්න නිසාම නිම්සර ගැන සැලකිල්ලක් කව්රුවත් දැක්වුයේ නෑ.

අමායා කෙලවරේම මේසෙකට වෙලා වතුර වීදුරුවක් බොනවා නිම්සර බලාගෙන හිටියා.

‘මේ කෙල්ල බිස්කට් එක ගෙනාවේ දවල්ට කන්නවත්ද’

‘සල්ලි නැතුව ඇති. පව්’

නිම්සර කාර්යාල සේවකයෙකුට කියලා ඉක්මණට පිටතින් කෑම එකක් ගෙන්වා ගත්තා.

නිම්සරගේ කෑම එක අස් කරන්න අමායා එනකල් ඔහු බලාගෙන හිටියා.

"අමායා කෑවද?"

"ඔව් මහත්තයා"

අමායා එහෙම්මම ගියේ නිම්සරගේ පැන්ට්‍රි එකට. නිම්සරත් ඇයට නොදැනෙන්න ඒ පස්සෙන්ම ආවා.

අමායා දැක්කේ නිම්සරගේ කෑම එක තාමත් ඒ විදියටම තියෙනවා.

නිම්සර හෙමිහිට දොර අගුල් දැම්මා.

අමායා හැරිලා බැලුවේ දොර අගුල දාන සද්දෙට.

"නිම්සර මහත්තයා"

අමායාගේ ඇස් ලොකු වුණේ නිම්සර අමායාගේ ළඟටම ආපු නිසා.

ඒත් අමායාට විශ්වාසයි නිම්සර කවදාවත් ශානු වගේ බලහත්කාරකමක් කරන්නේ නෑ කියලා.

“මහත්තයා කාලා නෑනේ“

“ඇයි බොරු කියන්නේ අමායා ඔයා“

“මං... මං මොකද්ද.. බොරු කිව්වේ“

“කෑවා කියලා කිව්වේ“

“ඉතිං මම කෑවනේ“

“කෑවේ මෙහෙමද“

නිම්සර අමායා දිහා බලාගෙන හිටපු වෙලාවේ හොරෙන්ම ඔහුගේ ජංගම දුරකතනයෙන් ඇය කෑම නොගෙන වතුර බොනවා වීඩියෝ කරගෙන තිබුණා.

අමායා හිනා වුණා.

“ඔයා උදේ මට දුන්නේ ඔයා කන්න ගෙනාපු බිස්කට් එක නේද“

අමායා මුකුත් කිව්වේ නෑ.

නිම්සර අමායාගේ ඔළුව අතගෑවා. ඒ දැණුන ස්පර්ශයට අමායාගේ ඇස් පුදුමෙන් ලොකු වෙන්න වැඩි වෙලාවක් ගියේ නෑ වගේම පපුවට දැණුනු හැඟීම අමායාගේ හිත විසිරුවලා දැම්මා.

“ආ මේ කෑම එක කන්න”

නිම්සර ගෙන්වාගෙන තිබුණු කෑම එක අමායා අතට දුන්නා.

“මට බඩගිනි නෑ මහත්තයා”

“එහෙනම් මගේ කෑම එකත් විසි කරන්න”

“අනේ මහත්තයා බඩගින්නේනේ එතකොට”

“එහෙනම් ඔයා බඩගින්නේ ඉන්නේ?”

“මට ඒක පුරුදුයිනේ මහත්තයා”

“එහෙනම් මාත් පුරුදු වෙන්නම්”

“නිම්සර මහත්තයා මොකද්ද මේ වෙලා තියෙන්නේ”

අමායාගේ හිත ඇතුලට තව තවත් රිංගන්න හදන නිම්සර නිසා අමායාට තරහාත් ගියා.

තමන් වගේ වැඩකට නැති ගෑණියෙක් වෙනුවෙන් ඔහු මෙහෙම කරන එක ගැන ඇයට දුකක් දැණුනා.

“මට මුකුත් වෙලා නෑ අමායා. ඔයා කනවා නම් මම කන්නම්”

නිම්සර ආපහු යන්න හැරුණා.

"මම කන්නම්. මහත්තයා කාලා ඉන්නකෝ"

"ඔයත් කන්න මමත් කන්නම්"

ඊට වඩා කතා කරලා වැඩක් නැති නිසාම අමායා නිම්සර එක්කම කෑම ගත්තා.

sinhalaebooks.com

### *14 වන දිගහැරුම*

අමායා වගේම නිම්සරත් හරිම ආසාවෙන් රැකියාව කළා.

නිම්සර උදේම කාර්යාලයට ආවේ අමායාව දකින බලාපොරොත්තුවෙන්.

අමායා උදේම කාර්යාලයට ආවේ නිම්සරගේ කාමරේ පිරිසිදු කරලා ලස්සන කරන්න තිබුණු ආසාවෙන්.

හැම දවසකම නිම්සරගේ මේසේ උඩ තියෙන බඳුණේ ස්භාවික මල් වලින් එන සුවඳ විඳින්න ඔහු පුරුදු වුණා.

"ගුඩ් මෝර්නින් මහත්තයා"

"ගුඩ් මෝර්නින් අමායා"

"හරිම ලස්සනයි මල් වාස් එක. කොහෙන්ද මේ මල්"

"මම එනකොට ඉතිං කඩාගෙන එනවා"

"හැමදාම මල් අරගෙන එන්න. මම ආසයි ඒකට"

අමායා හිනා වුණා.

ඒත් අද දවස අමායාගේ දෛවයේ කණගාටුම දවසක් වුණේ නොහිතපු විදියට.

උදෑසන තේ වෙලාවේ අමායා නිම්සරට හදපු තේ එකත් අරගෙන කාමරේට ඇතුල් වෙන්න හදනකොටම ඇතුලේ ඉඳන් ආපු කෙනෙකුගේ ඇගේ තේ කෝප්ප බන්දේසිය හැප්පුණේ නොහිතපු වෙලාවක ඔහු එළියට එන්න ආපු නිසා.

තේ කෝප්පපය ඔහුගේ ඇඟ පුරාම විසිරිලා ගියා. බිම වැටුණු තේ කෝප්පය කෑලි කෑලි වලට විසිරිලා ගියා.

"පොට්ට වෙලාද ඕයි තමුසෙගේ ඇස්"

"උඩ බලාගෙනද එන්නේ"

"දවසම ඉවරයි. බලනවා ඇඳුමේ හැටි. කෑවා"

ඔහු අමායාව තල්ලු කරලා දැම්මා.

"අනේ මහත්....."

දෙන්නාට දෙන්නා විනාඩි ගාණක් මූණ බලාගෙන ඉන්න ඇති.

නිම්සර එතෙන්ට ඇවිත් කතා කලේ නැත්නම් තාමත් දෙන්නාම පුදුම වෙලා බලාගෙන ඉන්නවා.

“සංඛ මොක්ද්ද ඒ කරපු කැත වැඩේ”

“එයා දැක්කේ නෑනේ ඔයා එළියට එනවා. ඇයි බොරුවට කෑගහන්නේ”

එතන හිටගෙන හිටියේ වෙන කව්රුවත් නෙමෙයි තමන්ගේම මල්ලි.

“බොස්ටත් පිස්සු මේ වගේ උන්ට කියලා මොකට තේ හදාගන්නවාද. මෙහේ ඒකට තමා වෙනම ස්ටාෆ් එකක් ඉන්නේ”

“මට ඕන දේ මම කරන්නේ තේරුණාද. තමුන් මෙතන සේවකයෙක් මිසක් මගේ බොස් නෙමෙයි”

“අනේ මහත්තයා මගේනේ වැරැද්ද. මේ මහත්තයාගේ වැරැද්දක් නෑ”

“මට සමාවෙන්න සංඛ මහත්තයා”

අමායා තමන්ගේම මල්ලිට අත්දෙක එකතු කරලා සමාව ගත්තා.

“යනවා යන්න අහකට“

“සංඛ තමුන්ට අයිතියක් නෑ ඔහොම මිනිස්සුන්ට කෑගහන්න. මේක මගේ ඔෆිස් එක තේරුණාද“

“අනේ නිම්සර මහත්තයා මගේනේ වැරැද්ද මේ මහත්තයා වැරදි නෑනේ“

“ඔයා මොකටද මෙයාව බේරගන්න හදන්නේ?“

“අනේ මහත්තයා ඉතිං මමනේ වැරැද්ද කළේ“

“සංඛ දැන් යන්න“

සංඛ අමායාටත් ගස්සගෙන යන්න ගියා.

“අනේ නිම්සර මහත්තයා මට විනාඩියක් දෙන්න මම ඉක්මණට අස් කරන්නම්“

අමායා බිම විසිරිලා තිබුණු වීදුරු කටු ඇහිදින්න පටන් ගත්තා.

“අමායා...“

“මහත්තයා“

“මට ඇත්ත කියන්න. ඒ ඔයා දන්න කෙනෙක්ද“

“ක... කව්ද...“

“සංඛ“

“නෑ...මං.... දන්නේ නෑ මහත්තයා. මම ඉතිං මහත්තුරු අඳුරන්නේ නෑනේ“

නිම්සර අමායා දිහා ඇස් හීනි කරගෙන බලාගෙන හිටියේ හිත යට සැකයක් ඇති වුණු නිසා.

“බොරු කියන්න එපා අමායා“

“නෑ සර් ඇත්තමයි. මම දන්නේ නෑ. අනික මම ඉතිං ඔය ලොකු මහත්තුරු අඳුරන්නේ නෑනේ මහත්තයා“

‘මේ දෙන්නා හොඳදට අඳුරනවා වෙන්න ඕනේ. මොකද ඒ විදියට බලාගෙන හිටියේ දන්න නිසා තමයි‘

නිම්සර හිතුවා.

sinhalaebooks.com

## *15 වන දිගහැරුම*

දින ගණන් ගත වුණේ අමායාගේ හිතේ නිම්සර ගැන තේරුම් ගන්න බැරි හැඟීමක් දළුලා වැඩෙද්දි.

හීනෙකින්වත් කරන්න බැරි ප්‍රාර්ථනාවක් හිත ඇතුලට රිංගන්න හදනවා අමායාට දැණුනා.

නිම්සරගේ කරුණාවන්ත හිත අමායාගේ ජීවිතේ අළුත් පිටුවක් පෙරලනවා කියලා ඇයට දැණුනා.

නිම්සර අමායාට ආදරේ කරන්නේ දැන් ගොඩක් කාලෙක ඉඳලා. ඒත් ඒක කියාගන්න තරම් ශක්තියක් ඇත්තටම ඔහුට නෑ.

අමායා ඒක මොන විදියට තේරුම් ගනිවිද කියන්න ඔහුට බයයි.

ශානු තමන්ගේ යාළුවා වුණ එක වගේම ඔහුගෙන් විනාශ වුණ ජීවිතය අමායාගේ ජීවිතේට කොහොම බලපෑම් කරයිද කියන්න ඔහුටම නොතේරුණු දෙයක්.

'නිම්සර මහත්තයා මට ආදරේ කරනවාද?'

අමායාගේ හිත කිව්වේ;

'පිස්සුද උඹට නිම්සර කියන්නේ මේ සමාජේ පිලිගත්තු කෙනෙක්'

'කෝටිපති ව්‍යාපාරිකයෙක්'

'උඹ දුප්පත් හිඟන්නියක්'

'නිම්සර මහත්තයා මට අනුකම්පා කරනවා. එයාගේ යාළුවා මාව විනාශ කරපු නිසා, මට කාත් කව්රුවත් නැති නිසා'

අමායා බර සුසුමක් හෙළුවා.

'මහත්තයා කියන්නේ මට ලං වෙන්නවත් බැරි චරිතයක්'

'ඒත් මහත්තයා වගේ කෙනෙක් කෙල්ලෙක්ට ලැබෙන්න ඒ කෙල්ල මහා ගොඩක් පිං කරලා තියෙන්න ඕනේ'

.................................................

මේ අතරේ නිම්සර තීරණයක් ගත්තා. ඔහුගේ ආදරය ඇයට කියන්න තීරණය කළා.

'අමායා මොනවා හිතයිද'

'මමත් ශානු වගේ එයාගෙන් ප්‍රයෝජන ගන්න හදනවා කියලා හිතයිද'

'ඒත් මට මේක කියන්න තවත් පරක්කු කරන්න බෑ'

එහෙම හිතපු නිම්සර අමායාට කතා කළා.

"අමායා...."

"මහත්තයා...."

"අද හවසට මාත් එක්ක ටිකකට එළියට යමුද. මට ටිකක් කතා කරන්න ඕනේ ඔයත් එක්ක"

අමායා ටිකක් කල්පනා කලේ හිතට අමුත්තක් දැණුනු නිසා.

"මොකද අනේ මේ කල්පනා කරන්නේ"

"අනේ එහෙම මුකුත් නෑ මහත්තයා"

"මම අද වේලාසන වැඩ ඉවර වෙනවා. එතකොට යමු"

"හොඳයි මහත්තයා"

අමායා කැමති වුණා.

කතා කරගත්තු විදියටම අමායාත් නිම්සරත් එළියේදි මුණ ගැහුණා.

“අමායා....“

“මහත්තයා...“

“මම කෙලින්ම කතා කරන්නම්කෝ“

“අමායා ඉස්සරහාට මොනවාද කරන්න හිතාගෙන ඉන්නේ දැන්“

“ඒ කිව්වේ මහත්තයා“

“දැන් ඔයාට විසි තුනක් විසි හතරක් වගේනේ“

“විසි හතරයි මහත්තයා“

“මට මහත්තයා නොකියා කතා කරන්නම බැරිද ඔයාට“

“අනේ මහත්තයා එහෙම කරන්නේ කොහොමද“

“ඇයි එහෙම කරන්න බැරි“

“මහත්තයලා අපි වගේ නෙමෙයිනේ. කොහොමද එහෙම නොකියා කතා කරන්නේ“

"නම කියලා කතා කරන්න"

"අනේ ඒක නම් කරන්න බෑ මහත්තයා. කරන්න බැරි දේවල් කියන්න එපා"

"හරි හරි"

නිම්සරට කේන්ති ගියා.

"හරි දැන් මොනවාද කරන්න හිතාගෙන ඉන්නේ කියන්නකෝ"

"මේ රස්සාව කරගෙන ඉන්නවා ඉතිං"

"ඔයාට කරගන්න බැරිවුණ දේවල් ටික අපි කරමු අමායා"

"මම කැමතියි ඔයා නවත්තපු තැනින් ඉගෙනීම ආයේත් පටන් ගන්නවා නම්"

"මම ඔයාට උදව් කරන්නම්"

අමායාට ඉගෙන ගන්න ලොකු ආසාවක් තිබුණත් කෝ ඒකට සල්ලි. නිම්සරගෙන් සල්ලි ඉල්ල ගෙන කොහොමද ඉගෙන ගන්නේ. ඊටත් වඩා තමන්ගේ මව වෙනුවෙන් ඔහු කොච්චර නම් වියදම් කළාද? තවත් කරදරයක් වෙන්න අමායාට ඕන වුණේ නෑ.

"අමායා ඇයි කතා නැත්තේ"

"නෑ මහත්තයා මුකුත් නෑ"

"අපි ආයේමත් ඉගෙන ගමු අමායා"

අමායාගේ හිතේ ආයේත් ඉගෙන ගන්න යටි හිතේ අසාවක් තිබුණත් ඒකට මුදල් තිබුණේ නෑ.

"හා මහත්තයා"

එහෙම කියලා අමායා ඒ කතාව නතර කලේ ආසාවන් වලට එළියට එන්න ඉඩ දීලා ඒවා නොකෙරුණ දවසට ආයේමත් හිතෙන් දුක් වෙන්න වෙන නිසා.

"ශානු......"

පුරුදු විදියටම අමායාගේ ගැස්ම නිම්සර දැක්කා.

නිම්සර දැක්කේ තමන් දිහාවට එන තමන්ගේ මිතුරා ශානු.

"හලෝ මචාං... කොහොමද ඉතිං"

නිම්සර ඉස්සරහින් ඉඳගෙන ඉන්න රූපේ ශානු හරියටම දැක්කේ දැන්.

"අම්මාට සිරි නිමා උඹත් දැන් සබ්ජෙක්ට් එකට බැහැලා වගේ නේද"

අමායාගේ නැතිගැන්ම ඇගේ ඇස් වලින් නිම්සර දැක්කා.

"එල මචෝ එල මුහුදේ නැව් ගියාට ඉතින් පාරවල් හිටින්නේ නෑනේ"

"පැදපන් පැදපන් ඕක සුපිරි ඉතිං. හැබැයි ඉතිං මං පැදපු විදියට පැදපන්. නැත්තම් ආතල් එකක් නෑ"

"ශානු කටවහපන්"

මෙච්චර වෙලා කටවහගෙන හිටපු නිම්සරට කෙන්ති ගියා. නිම්සර ඒ කේන්තියෙන්ම නැගිට්ටේ ඉදගෙන හිටපු පුටුවත් පස්සට කරලා.

"ඕ....හෝ...... උඹට දැන් ඔච්චර කේන්ති ගන්න මම මොනවාද කිව්වේ ආ"

"පලයන් ශානු මෙතනින් ප්ලීස්"

"යකෝ උඹ දැන් උඹේ යාළුවාව එළවනවා මේ දෙකයි පනහේ ගෑණියෙක් හින්දා. හරිහමන් එකියක් ගනින්කෝ බං"

නිම්සර ශානුගේ කොලර් එකෙන් අල්ල ගත්තා.

"උඹ මතක තියාගනින් උඹත් ඒ දෙකයි පනහේ ගෑණිගෙන් සතුටු වුණා කියලා. ඒ කාලේ උඹට හොයා ගන්න තිබුණානේ හොඳ එකියක් මේ කෙල්ලව විනාස කරපු වෙලාවේ"

"මේ වගේ උන්ගෙන් සතුටු වුණා කියලා මොනවා වෙනවාද බං"

"ශානු නිකම් බලු කතා කියන්න එපා මිනිහෝ"

"උඹට ඒ කාලේ ඉඳන් මහා ලොකු කැක්කුමක් තිබුණානේ ඉතිං මේකි ගැන"

"ඔව් තිබුණා තමයි. ඇයි මොකද?"

අමායාට කර කියාගන්න දෙයක් නැති වුණා.

තමන් නිසා වෙන දෙයක්.

"අනේ මහත්තයා පින් සිද්ධ වෙයි මෙතන රණ්ඩු කරන්න එපා මහත්තයා. අනේ නිම්සර මහත්තයා, ශානු බේබි දැන් ඕක නතර කරන්නකෝ"

අමායා බැගෑපත් වුණා.

තමන් නිසා වුණ දෙයක්. අමායාට කලකිරුණා.

"පලයන් ශානු මට පව් නොදී පලයන්"

ශානු තවත් විනාඩියක්වත් ඉන්නේ නැතුව එතනින් යන්න ගියේ දත්මිටි කාගෙන ඒ වුණ ලැජ්ජාවට.

නිම්සර නළල පිරිමැදගත්තේ මේ නොහිතපු වෙලාවක වුණ දේට.

"මහත්තයා.... අපි මෙතනින් යමු..."

අමායා බයෙන් බයෙන් ඇහුවා.

"ඒ මොකටද"

නිම්සරගේ තරහා ගියපු මූණ දැක්කාම අමායාට හිනාත් ගියා.

"මොකද හිනා වෙන්නේ"

"මහත්තයාගේ මූණ දැකලා"

"ඇයි බලන්න බැරි තරම් කැතයිද"

"මූණ ඇද වෙලා කට පැත්තට ගිහින් ඇස් දෙක ලොකු වෙලා හරිම ලස්සනයි"

රණ්ඩුව අමතක වෙලා නිම්සරට හිනා ගියා.

නිම්සර හෙමිහිට මේසේ උඩ තිබුණු අමායාගේ අතැඟිලි අල්ල ගත්තා.

අමායාගේ හිනාව එතනම නතර වුණා.

"අමායා"

"ම්ම්ම්ම්ම්"

"ඔයා කැමති නැද්ද ආදරේ කරන්න"

"ශානු කිව්වේ ඇත්ත අමායා"

"මම ඔයා ගැන හිතුවේ ඔයා එහේ ඉන්න දවස්වල ඉඳලාමයි"

"මම ඔයාට ආදරේ කළා"

"ඒත් මට සමාවෙන්න ඔයාව බේරගන්න මට බැරි වුණා"

අමායා බොහොම හෙමිහිට ඇගේ අත නිම්සරගේ ග්‍රහණයෙන් මුදා ගත්තා.

"අමායා... කතා කරන්න. මම ඔයාත් එක්ක කතා කරන්නේ"

“ඔයාගේ හිතේ මම නැද්ද අමායා“

“මහත්තයා ඇයි මහත්තයාගේ ජීවිතේ කවදාවත් මකාගන්න බැරි වැරැද්දක් කරන්න හදන්නේ“

“මම දෙකයි පනහේ ගෑණියෙක්. මහත්තයාගෙම යාළුවා විනාශ කරපු ගෑණියෙක්“

“මහත්තයාගේ වටින කිරි හැලියක් වගේ තියෙන ජීවිතේට ගොම හලාගන්න එපා මහත්තයා“

“මේ රටේ ලෝකේ මිනිස්සු මහත්තයාව දන්නවා“

“මෙතනම කී දෙනෙක් මහත්තයා දිහා අමුතු විදියට බැලුවාද කියලා දැක්කද“

“මම වගේ දුප්පත් ගෑණියෙක් මහත්තයාගේ ජීවිතේට හරියන්නේ නෑ මහත්තයා“

“මහත්තයා මට ගොඩක් උදව් කරලා තියෙනවා. ඒකට ගොඩක් පින්. ඒත් මීට පස්සේ එපා මහත්තයා“

“මට සමාවෙන්න...“

අමායාට ඊට පස්සේ නිම්සර කියපු දේවල් ඇහුණේ නැත්තේ අඩ අඩම එළියට ඇවිත් ගෙදර එන්න ආපු නිසා.

අමායා මහ රෑ පුරාම නින්දක් නැතුව කල්පනා කළා. ගොඩක් දවසක ඉඳන්ම අමායාට නිම්සරගේ හිතේ තියෙන අදහස ගැන දැණුනත් ඇය ඒකට ඉඩක් දුන්නේ නෑ.

ඒත් තවත් මෙහෙම හිටියොත් නිම්සරට එයාගේ ජීවිතෙත් ලැජ්ජා විඳින්න සිද්ධ වෙනවා නේද කියලා අමායා කල්පනා කළා.

පරණ පොතකින් කොළයක් කඩා ගත්තු අමායා නිම්සර වෙනුවෙන් ඇගේ පළවෙනි වගේම අන්තිම ලිපියත් ලියන්න පටන් ගත්තා.

### *16 වන දිගහැරුම*

නිම්සර කාර්යාලයට ආවේ කිසිම හිනා මූණක් නැතුව. මොකද ඊයේ වුණු සිද්ධිය නිසා ඔහුට කිසිම සතුටක් තිබුණේ නෑ.

ඒත් මේසේ උඩ තියෙන ලස්සන මල් පොකුර දැක්කාම නිම්සරගේ මුවේ ලස්සන හිනාවක් ඇඳුණා.

ඒත් ඒ හිනාව නැති වුණේ ඔහුගේ පැන්ට්‍රියේ ඉඳලා පුරුදු රූපේ වෙනුවට එළියට ආපු නොදන්නා රුව දැකලා.

"අද අමායා නැද්ද ඇන්ටි"

"අද උදේ ආවා. මෙතෙන්ට ඇවිත් එයා ආයේ මෙහේ වැඩට එන්නේ නෑ කියලා අපේ මැඩම්ට කියලා ගියා සර්"

"මොනවා?"

පුටුවත් පස්සට තල්ලු කරගෙන නිම්සර නැගිට්ටේ හිතාගන්න බැරි වේගෙන්.

"ඔව් මහත්තයා... ඇයි මුකුත්...."

"නෑ නෑ ඇන්ටි මුකුත් නෑ"

නිම්සර සිකියුරිටි එකටත් කතා කරලා බැලුවා. එතනින් කිව්වෙත් දැන් ගොඩක් වෙලාවකට කලින් ඇය යන්න ගියපු බවයි.

නිම්සර වැඩ හැමදෙයක්ම පැත්තකට දාලා අමායාගේ ගෙදර ගියා.

ගෙදර දොර වහලා දාලා. කව්රුවත්ම හිටියේ නෑ. අහන්න අහල පහල කෙනෙක්වත් පේන්න හිටියේ නෑ.

නිම්සරට මොනවා කරන්නද හිතාගන්න බැරි වුණා.

ඔහු ආයේමත් කාර්යාලයට ආවේ ඔළුව හොඳටම අවුල් වෙලා.

නිම්සර අතට ගත්තේ අමායා මල් දාපු බඳුන.

මල් බඳුන යට තිබුණ දෙකට තුනට නවපු කොලයක් නිම්සරගේ ඇස ගැටුණා.

නිම්සර හෙමිහිට ඒ කොලේ දිග ඇරියා.

'අමායාගෙන් ලියුමක්'

නිම්සරට පුදුම හිතුණා වගේම හිත යට ලොකු බයක් දැණුනා.

නිම්සර මහත්තයා,

මුලින්ම මම මහත්තයාගෙන් සමාව ඉල්ලනවා.

මහත්තයාට මේ ලියුම ලැබෙනකොටත් මම මේ ජීවිතෙන් ගිහින් තියේවි. ඒ නිසා මාව හොයන්න මහන්සි වෙන්න එපා මහත්තයා.

මම මේ තීරණේ ගත්තේ මහත්තයාගේ ජීවිතේ ගැන හිතලා. මහත්තයාව මම මුලින්ම දැක්කේ ශානු බේබිගේ ගෙදරදි. එදා හැමෝම මට විහිළු කරද්දිත් මහත්තයා මට එක වචනයක්වත් කිව්වේ නෑ කියලා මම දැක්කා. ඒ හැමෝම අතරින් මහත්තයාගේ තරම් අවංක ඇස් දෙකක් මම දැකලා නෑ මහත්තයා.

මහත්තයා අපේ තත්ත්වේ ගැනවත් නොහිතා මගේ අම්මාට උදව් කළා. මහත්තයාට පින් සිද්ධ වෙන්න මගේ අම්මා වැඩි කාලයක් ජීවත් වුණා. ඒකට දස දහස් වතාවක් පින්. ඒ ණය කවදාවත් මට ගෙවලා ඉවර කරන්න බැහැ.

මහත්තයා නිසා අම්මාට කන්න දෙන්න පුළුවන් වුණා. බෙහෙත් ටික දෙන්න පුළුවන් වුණා. මගේම සහෝදරයාවත් අපි ගැන නොබලද්දි ලේ බැඳීමක්වත් නැති මහත්තයා අපි ගැන බැලුවා. ඒ දේවල් වලට අත් දෙක එකතු කරලා මහත්තයාට පින් දෙනවා මම.

මහත්තයා මට ඇත්තටම ආදරේ ඇති. ඒත් මහත්තයා මට තවත් කෙනෙක් ළඟට යන්න පුළුවන්කමක් නෑ. ඒක මහත්තයා හොඳටම දන්නවා.මම එහෙම ගියොත් ඒක ඒ මනුස්සයාට මම කරන ලොකු අසාධාරණයක්.

මහත්තයාගේ වටින ජීවිතේ මම වගේ කෙනෙක් නිසා ලැජ්ජා වෙනවා දකින්න මම කැමති නෑ මහත්තයා. මගේ ජීවිතේ මට නැති වෙන්න දේවල් නෑ. ඒත් මහත්තයාට එහෙම නෑ.

මමත් හිතුවා දවසක මම බඳින කෙනාට ගොඩක් ආදරේ කරන්න. එයාගෙන් ගොඩක් ආදරේ ඉල්ල ගන්න. ඒත් ඒකට වාසනාවක් මට නෑ. කාටවත්ම අසාධාරණයක් නොකර මම මේ තීරණේ ගත්තේ ඒකයි මහත්තයා.

එදා ශානු බේබි මහත්තයාට කියපු දේවල් වලට මට ඇත්තටම දුක හිතුණා. මම නිසායි එදා ඒ දේ වුණේ. මම මහත්තයා එක්ක එදා එළියට යන්න අකමැති වුණා නම් මම නිසා මහත්තයාට අවනම්බු විඳින්න වෙන්නේ නෑ.

මහත්තයාගේ ආදරේ ලැබෙන්න ඕන මහත්තයාට, මහත්තයාගේ පවුලට ගැලපෙන කෙනෙක්ට.

මාව අමතක කරන්න. මම මේ තීරණේ ගත්තෙත් මහත්තයාගේ ජීවිතේ නිසාමයි. මට මෙච්චර දේවල් කරපු මහත්තයාගේ ජීවිතේට නරකක් වෙනවා දකින්න මම කැමති නෑ මහත්තයා.

මම වගේ දුප්පත් කෙල්ලෙකුට මහත්තයා වගේ කෙනෙක් සලකපු එකට ඇත්තටම ගොඩක් පින්.

මහත්තයාගේ අනාගතේට මම සුබ පතනවා. ඉක්මණටම මහත්තයාගේ නෝනාව ලැබෙන්න කියලාත් මම ප්‍රාර්ථනා කරනවා.

මහත්තයාට බුදු සරණයි.

මීට

අමායා

නිම්සර පපුව අල්ලගත්තේ හෘදයාබාධයක් දෝ සිතුණු නිසා. ඒ තරමට හදවත වේදනාවෙන් ඇදුම් කෑවා.

කාර්යාලයෙන් එළියට ආපු ඔහු වාහනේ පදවගෙන ආවේ පාළු තැනකට.

දුරකථනය අතට ගත්තු නිම්සර ශානුව ඇමතුවා.

එදා රණ්ඩුව ඒ දෙන්නාම දුර දිග අරගෙන ගියේ නැති නිසා අදටත් කතා කරනවා. ඒත් අද?

"නිමා"

"උඹ තරම් පච්කාරයෙක් තවත් නෑ ශානු"

"උඹ ඒ කෙල්ලව විනාස කළා. ඒකිගේ ජීවිතේ සදහටම නැති කළා"

"උඹ ඔය කව්රු ගැනද කියන්නේ කියපන්කෝ නිමා"

"ඔව් ඉතිං උඹ කී දෙනෙක්ගේ ජීවිත විනාස කළාද නේද? උඹට ඉතිං ඒවා ගාණක් නෑ තමා"

"නිමා පින් සිද්ධ වෙයි තේරේන සිංහලෙන් කියපං උඹ කතා කරන්නේ කව්රු ගැනද?"

“අමායා ගැන මම කතා කරන්නේ. වෙන කෙනෙක් ගැන නෙමෙයි”

“මම ඒකිට ආදරේ කළා ශානු ආදරේ කළා”

නිම්සර හොඳටම අඬනවා.

“උඹට පිස්සු හැදිලාද නිමා. මොනවාද මේ කියන්නේ”

“ඔව් පිස්සු හැදිලා. මට පිස්සු හැදිලා”

“තෝ මාවත් විනාස කළා. ඒකිගේ අහිංසක ජීවිතෙත් විනාස කළා”

“නිමා තොට නම් ඇත්තටම පිස්සු තමා. ඒකිව තොට ගැලපෙනවාද බලපං. ඇයි තොට මොලයක් නැත්තේ”

“අපේ ගෙදර වැඩකාරකම් කළා, අන්තිමට හිඟා කෑවා. උඹ ඒ වගේ එකියක්ටද ආදරේ කරන්නේ කියපංකෝ”

“ඒ මුකුත් ඕනේ නෑ. මාත් එක්ක නිදා ගත්තු ගෑණියක් ඒ. උඹ ආදරේ ඒ වගේ එකියක්ටද? මට නම් හිතාගන්නත් බෑ”

හඟ්හ්හ්හ් ශානුට හොඳටම හිනා.

“තෝ හිතුවාද ඒකි තොට තියෙන ආසාවට නිදාගත්තා කියලා“

“නෑ ශානු නෑ තෝ බලෙන් ඒකිව නිදි කරවගත්තා“

“තෝ හිතුවේ ඒ කෙල්ල ඒ දේවල් කළේ ආසාවට කියලාද“

“නෑ යකෝ නෑ“

“ඒකි උඹ දීපු දුක් දරාගෙන හිටියේ ගෙදර මිනිස්සු ජීවත් කරවන්න ඕන නිසා“

“තෝ ඒකිව විනාස නොකළා නම් අද ඒකි මගේ වෙලා“

“උඹ ඒ කෙල්ලව විනාශ කරපු හින්දා ඒකි මට බෑ කිව්වා. ඒකි යන්නම ගිහින්“

“උඹ ආයේ මගේ යාළුවෙක් නෙමෙයි ශානු. උඹට කවදා හරි මේවාට ගෙවන්නම වෙනවා“

නිම්සර හොඳටම ඇඬුවා.

ජීවිතෙන් බාගයක්වත් ගෙවිලා නැති අහිංසක කෙල්ලෙක් යන්න ගියා. ඒ කෙල්ලගේ ජීවිතේ

හික්මීමක් නැති සෙල්ලක්කාරයෙක් විනාස කරලා දැම්මා.

ආදරේ විඳින්නවත් අවස්ථාවක් ඒ කෙල්ලගේ ජීවිතේට ලැබුණේ නෑ.

නිම්සර දවස් ගාණක්ම ඇය වෙනුවෙන් කඳුළු හැළුවා.

### *17 වන දිගහැරුම*

නිම්සර අමායාට දක්වපු ආදරේ වෙන කෙනෙක් වෙනුවෙන් දෙන්න ඔහුට පුළුවන් වුණේ නෑ. මේ නිසාම ඔහු තනිකඩව ජීවත් වෙන්න තීරණය කළා.

නිම්සර, අමායා වෙනුවෙන් පුළුවන් තරම් අමායාගේ වයසේ අය වෙනුවෙන් උදව් උපකාර කරන්න පෙළඹුණා. ළමා නිවාස වෙනුවෙන් උදව් කළා. මේ වෙනුවෙන් ඔහුගේ කාර්යාලයේම ඔහුගේම හිතවතෙක් වුණු ලක්ෂිත ඔහුට ලොකු සහයෝගයක් දුන්නා.

නිම්සරගේත් අමායාගෙත් කතාව ඔහු ලක්ෂිතට කිව්වේ ලක්ෂිතගේ තිබුණු අවංක බවේ විශ්වාසය නිසා. නිම්සර බලාපොරොත්තු වන ආකාරයේ ළමා නිවාස සොයා ගන්න ඔහු දවස් ගණන් වෙහෙසුණේ තමන්ගේ යාළුවාගේ බලාපොරොත්තු ඉෂ්ට කරන්න.

වසර පහකට නොඅඩු කාලයක්ම සෑම වසරක් පාසාම අමායා ජීවිතෙන් ගිය දවස වෙනුවෙන්

නිම්සර එක්ක ලක්ෂිතත් මේ කටයුත්ත කරගෙන ආවේ අමායා වෙනුවෙන්මයි.

මෙවර ඔහු තෝර්ර ගත්තේ දෙහිඅත්තකණ්ඩිය බක්මීදෙණිය ග්‍රාමයේ පිහිටි ළමා නිවාසයක්. දරුවන් 30ක පමණ සුළු පිරිසක් පමණක් නේවාසිකත්වය ලබන ළමා නිවාසයක්.

නිම්සරත් ලක්ෂිතත් ඔවුන්ගේ ආධාර ලබා දීම වෙනුවෙන් මෙම ළමා නිවාසය වෙත අද යන ගමන්.

“නිමා“

“ම්ම්ම්ම්“

“උඹ තාමත් අර කෙල්ල ගැන හිතනවාද“

නිම්සර වාහනේ පදවන ගමන් කල්පනා ලෝකේ ඈතට යන්න පටන් ගත්තා.

“මොන කෙල්ලද?“

“උඹට නෙලාගන්න බැරි වුණු මල ගැන“

“අමායාද?“

“නැතුව ඉතිං උඹට තව උන් හිටියේ නෑනේ“

sinhalaebooks.com

“හිතනවා බං අමතක කරන්න බෑ මට ඒ කෙල්ලව“

“ඒත් උඹලා ආදරේ කළේ නෑනේ“

“මම ආදරේ කළානේ ලක්ෂිත. කෙල්ලත් මට ආදරේ කරන්න ඇති. ඒත් ඒ කෙල්ල හිටපු තත්ත්වේ නිසා මගේ නමට හානියක් වෙයි කියලායි හිතුවේ“

“දැන් අවුරුදු කීයක්ද බලපංකෝ නිමා. උඹට මොනවාද අඩු. රූපෙන්ද සල්ලිද යාන වාහනද උඹට නැති දෙයක් තියෙනවාද බලපං“

“ඇයි ඒ කෙල්ල මත්තෙම නැහෙන්න හදන්නේ උඹ“

“උඹට ඔළුව වනන ක්ෂණිකෙට කෙල්ලෙක් හොයාගන්න පුළුවන්නේ බං“

“උඹ දැන් මගෙන් කන්න හදන්නේ ලක්ෂිත“

“මේ අහපන්...“

“පුරුදු තැටියම ගහන්න එපා බං. ප්ලීස්“

ලක්ෂිත හැමදාම කිව්වේ අමායාව අමතක කරලා වෙන කෙනෙක්ට ආදරේ කරන්න කියලා.

නිම්සර කියන්නේ උපතින්ම දෙමව්පියන් අහිමි දරුවෙක්. ඔහු උපදිනකොට අම්මා තාත්තා දෙන්නාම ඔහුගෙන් දුරස් වෙලා. නිම්සර හැදුණේ වැඩුණේ ඔහුගේ මිත්තණිය ළඟ. නිම්සර උසස් පෙළ හදාරන කාලයේ ඔහුගේ මිත්තණියත් ඔහුව හැර දාලා යනවා. එදා ඉඳන් නිම්සර තනිව තමන්ගේ ජීවිතේ ජයගත්තා. අද මේ තත්වයෙන් ඔහු ඉන්නේ ඔහුගේම කැපවීම, මහන්සිය නිසා.

"හරි හරි ඒක නෙමෙයි. උඹ අද යන තැන ළමා නිවාසේ නමත් නිම්සර බං"

"ඒ කියන්නේ මගේ නමත් හෙන ෆේමස් නේ"

"දාපු එකාට වෙන නමක් තිබිලා නැද්ද කොහේද"

"අනේ පල පල"

දෙන්නාම කතාවෙන් කතාවෙන් අදාල තැනට ආවා.

මෙම ළමා නිවාසය තුලම වයස් මට්ටම් අනුව ඉතා කුඩා පාසල් පරිශ්‍රයක් පවත්වගෙන යන්න මෙහි පාලිකාව කටයුතු කළේම මේ අහිංසක දරුවන්ගේ නැණ නුවණ පැහැදිය යුතු නිසාමයි. ඒ සඳහා ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වුණු ගුරුවරුන්

කිහිප දෙනෙකු සමග මැය මෙම කටයුතු කරගෙන යන්නේ හරිම විනෝදෙන්.

"තැන නම් මේක වෙන්න ඕනේ මචං. ඔතනින් නවත්තපංකෝ. මං අහලා එන්නම්"

වාහනෙන් බැහැපු ලක්ෂිත ආවේ ළමා නිවාසයේ ගේට්ටුව මුර කරන පුද්ගලයා ළඟට.

"අංකල් මේක නේද අර නිම්සර ළමා නිවාසේ"

"ඔව් මහත්තයෝ අර ගහලා තියෙන්නේ"

"අනේ අංකල් දැක්කේ නෑනේ. අපි අද එනවා කියලා මෙහෙට කියලා තිබුණේ"

"ආ එහෙමද?. ටිකක් ඉන්න බලන්න"

එතන හිටපු සුදු සරමක් සුදු කමිසයකින් සැරසුණු ගේට්ටු මුරකරු පොතක් පෙරලලා බැලුවා.

"ලක්ෂිත රත්නායක කියන්නේ මහත්තයාද"

"ආ ඔව් අංකල්"

"ඉන්න මම ගේට්ටුව අරින්නම්"

විවෘත වුණු ගේට්ටුවෙන් ඇතුල් වුණු නිම්සරත් ලක්ෂිතත් වාහන අංගනයේ ඔවුන්ගේ වාහනය ගාල් කරලා වට පිට බැලුවේ හිතා ගන්නවත් බැරි තරම් ලස්සන සුන්දර හිත නිවන වටපිටාවක් මෙම ළමා නිවාසය තුළ කෘතිමව සකස් කරලා තිබුණු නිසා.

කරන්න ආපු වැඩෙත් අමතක කරලා දෙන්නාම වටපිට බල බල ඉන්නවා.

"එක්ස්කියුස් මී සර්"

ඒ හඬට තමා නිම්සරත් ලක්ෂිතත් හැරිලා බැලුවේ.

"සර්ලා මෙතන...."

"අපි අද එනවා කියලා කලින් මෙහෙට ඉන්ෆෝර්ම් කරලා තිබුණේ"

"ලක්ෂිත සර්ද මේ"

"ඔව් ඒ මම තමයි"

"එතකොට ඔයා?"

"මම ඉසුරි"

නිම්සර කවදාවත් එයාගේ නම ඉස්සරහාට දාගත්තේ නෑ. හැම වැඩකටම ලක්ෂිත පෙනී ඉන්නේ ඒ හින්දා. නිම්සරට ඕනේ වුණේ අමායා වෙනුවෙන් පින් කරන්න මිසක් නම යවාගන්න නෙමෙයි.

"යමු සර් ඔෆිස් එකට මැඩම් ඉන්නවා"

නිම්සර, ලක්ෂිත එක්ක ඉසුරි පිටත් වුණේ මෙම ළමා නිවාසයේ පාලිකාවගේ කාර්යාලය වෙත යාමට.

.................................................

"අපි මේ ළමයින්ට කොන්සට් එක කරන්නම ඕනේ මිස්"

"ඒ හින්දා ඕන කරන දේවල් මොනවාද කියලා බලලා කියන්න"

ආවරණය කරන ලද කාර්යාල කාමරයේ පාලිකාවත් වෙනත් කාන්තාවකුත් කතාවක නිසාම නිම්සරවත් ලක්ෂිතවත් ටිකකට එළියෙන් රඳවලා ඉසුරි පමණක් පාලිකාවගේ කාමරයට ඇතුළු වුණේ මේ අමුත්තන්ගේ පැමිණීම ගැන දන්වන්න.

"සර් ඇතුළට යමු"

ඉසුරි ඇවිත් ලක්ෂිතවත් නිම්සරවත් පාලිකාවගේ කාමරයට රැගෙන ගියා.

ජීවිතේ මේ තරම් කම්පනයක් නිම්සරට කවදාවත් දැනිලා නැතුව ඇති. රුධිර ගමනාගමනය නැවතුනාදෝ කියලා නිම්සරට හිතුණා. හරියට හුස්ම වැටෙන්නේවත් නැතුව ගියා. තවත් අඩියක්වත් ඉදිරියට තියාගන්න ඔහුට පුළුවන් වුණේ නෑ.

දුවගෙන ගිහින් තුරුල් කරගන්න හිතුණු ඒ හැඟීම නිම්සර පාලනය කරගත්තේ ගොඩක් අපහසුවෙන්.

නිම්සරගේ හිතේ කේන්තියකුත් ඇති නොවුණාම නෙමෙයි. එදා අමායා මැරෙනවා කියලා රවට්ටපු එක ඔහුට ගෙනාවේ තරහවක්.

අමායාගේ ඇස් ලොකු වුණා. කවදාවත් ආයේමත් හමු නොවේවි කියලා හිතපු නිම්සර තමන්ගේ ඇස් ඉස්සරහා. එදා ඔහුගේ යෝජනාවට පිටුපාලා ආව දවසේ ඉඳලා හිතින් විඳපු වේදනාවන් එකවර සමනය වෙලා ගිහින්.

දුවගෙන ගිහින් තුරුල් කරගන්න හිතුණු ඒ හැඟීම අමායා පාලනය කරගත්තේ ගොඩක් අපහසුවෙන්.

ඉඳගෙන හිටපු පුටුවෙන් ඇය නැඟිට වුණා.

ඉසුරිත් ලක්ෂිතත් මාරුවෙන් මාරුවට නිම්සරගෙත් ඇයගෙත් මූණ දිහා බලන්න ගත්තේ වුණ දෙයක් හිතාගන්න බැරුව.

"මේ අපේ මැඩම් අමායා සඳමිණිතැන්න"

ලක්ෂිතත් පුදුමෙකින් නිම්සරගේ මූණ දිහා බැලුවා.

"මැඩම් මේ ලක්ෂිත මහත්තයා. මේ..."

ඉසුරි දැනගෙන හිටියේ නෑ ලක්ෂිත එක්ක ආපු නිම්සරගේ නම.

"නිම්සර දිද්දෙණිය"

"මැඩම් කියන නිම්...සර ඔයාද එතකොට"

ඉසුරිගේ කටට බ්‍රෙක් නැතුව ගියා.

අමායා ඉසුරිගේ අත තද කළේ තවත් මුකුත් නොකියන ලෙසට අණ කරමින්. නිම්සරත්

ලක්ෂිතත් දෙන්නාම අමායාගේ මේ ක්‍රියාව දැක්කා.

'එහෙනම් මෙයා තමා නිම්සරගේ අමායා'

'නෙලා ගන්න බැරුවුණු මල'

'මූත් ඉතිං ඇඹලයා වෙන එක අහන්න දේකුත් නෑ. හරිම ලස්සන අහිංසක පෙනුමක් තියෙන්නේ කෙල්ලට'

ලක්ෂිත හිතුවා.

අමායාත් නිම්සරත්, අමායාත් ලක්ෂිතත් අතට අත දීලා හමුවීම සනිටුහන් කළේ ජීවිත කාලේම නොදන්න දෙන්නෙක් වගේ.

"සර් ඉඳගන්න"

අමායා වචන ගලපගත්තා.

"ලක්ෂිත උඹ කියපන් විස්තරේ"

නිම්සර ලක්ෂිතගේ කණට කරලා අනිත් අයට නොඇසෙන විදියට කිව්වා.

"අමායා මිස් අපි ලංකාව පුරාම තියෙන මේ වගේ ළමා නිවාස වලට ආධාර කරනවා. අපි මේක දැන්

අවුරුදු පහක විතර ඉඳන් මේ වගේ දවසට තමා කරන්නේ“

“ඒකට ලොකු හේතුවක් තියෙනවා. නිම්සර ආදරේ කරපු කෙල්ල නැති වුණේ මීට අවුරුදු පහකට කලින් අද වගේ දවසක“

“ඉතිං නිම්සරට ඕනේ වුණේ එයා වෙනුවෙන් මේ වගේ ළමා නිවාස වලට උදව් කරන්න“

අමායාගේ අත පපුවට ගියේ ඉබේමයි.

“නිම්සර ළමයින්ට උදව් කරන්න හේතුවත් ඒ ගෑණු ළමයා එයාගේ පවුලේ අය වෙනුවෙන් තමන්ගේ අධ්‍යාපනේ අතරමග නතර කරලා ජීවිතේ බර කරට ගත්තු කෙනෙක් නිසා“

“මෙයාට ඕනේ ඊළඟ ආත්මේ හරි ඒ ගෑණු ලමයාගේ අධ්‍යාපන කටයුතු අතරමග නතර නොවෙන්න ප්‍රාර්ථනා කරන්නයි“

ලක්ෂිතට නිම්සරගේ ඇස් දෙකෙන්ම මේ ඉන්නේ එයා ආදරේ කරපු අමායාමයි කියලා තහවුරු වුණු නිසාම කියාගන්න ඕන දේවල් ඔක්කොම කියලා දැම්මා.

නිම්සරත් අමායාත් ඒ දෙන්නාට දෙන්නාම ඇස් මග අරිනවා කියලා ඉසුරිටත් ලක්ෂිතටත් තේරෙන්න වැඩි වෙලාවක් ගියේ නෑ.

"මැඩම්... මැඩම් ටිකකට එන්නකෝ"

මෙම ළමා නිවාසයේම ඉගැන්වීම් කටයුතු කරන වෙනත් ගුරුවරියක් හදිසියෙන් ඇවිත් අමායාව එක්කගෙන ගියේ මේ අතරේ.

අමායා හිර කරගෙන හිටපු හුස්ම ටික නිදහස් වුණා.

"එක්සිකියුස් මී. ප්ලීස්. ටිකක් ඉන්න මම ඉක්මණට එන්නම්"

## *18 වන දිගහැරුම*

අමායා එතනින් ඉවත් වුණ නිසාම ඉසුරිටත් මේක හොඳම වෙලාවක් වුණේ විස්තර දැනගන්න.

"සර්... සර් අපේ මැඩම්ව දන්නවාද?"

"හ්ම්ම්ම්"

නිම්සර බිම බලාගෙනම උත්තර දුන්නා.

"අපේ මැඩම් සර් ගැන හරියට කතා කරනවා. දවසකට එක වතාවක් හරි සර්ගේ නම කියනවාම තමා"

නිම්සරගේ ඉහළට එසවුණු මුහුණේ තිබුණු නපුරු පෙනුම ටික ටික අඩු වෙනවා ලක්ෂිතටත් පෙණුනා.

"අපේ මැඩම් ආදරේ කරපු කෙනාගේ නම තමා මේ ළමා නිවාසෙට දාලා තියෙන්නේ. ඒ කියන්නේ සර්ගේ නම"

"මොකක්?"

"ඔව් සර්"

"මැඩම් මට මුණ ගැහුණු දවසේ ඉඳලාම මම ඉන්නේ මැඩම් එක්ක"

"මැඩම් හරි හොඳයි"

"ඔයාගේ මැඩම් හොඳයි නම් මට මෙහෙම කරනවාද එයා"

නිම්සරට කියවුණා.

"ඒකට මැඩම්ට හේතු තිබුණා කියලා සර් දන්නවා ඇති කියලා මට හිතෙනවා සර්"

"ඔයාලගේ මැඩම් මැරි කරලා නැද්ද?"

"අනේ නෑ සර්. මැඩම් කවදාවත් බඳින්නේ නෑහැළු"

"අපේ මෙහේ කලින් හිටිය ලොකු මැඩම් අමායා මැඩම්ට යෝජනාවක් ගෙනාවා. ඒත් එයා කැමති වුණේ නෑ. එදා එයා කිව්වා එයා කවදාවත් බඳින්නේ නෑ කියලා"

"ඇයි ඒ"

"නිම්සර සර්ට මැඩම් ආදරේ නිසා"

“විකාර“

“මැඩම්ගේ කරේ තියෙන චේන් එකට දාලා තියෙන පෙන්ඩන්ට් එකේ තියෙන්නේ සර්ගේ නම“

“මොකක්ද? මොනවාද ලක්ෂිත මෙයා මේ කියවන්නේ? පිස්සුද?“

“පිස්සු නෙමෙයි සර්. මම ඇත්ත කියන්නේ. මාව විශ්වාස නැත්තම් සර්ටම පුළුවන් ඒක දැනගන්න“

“අමායා මැඩම් හැමදවසකම ඒ පෙන්ඩන්ට් එක අතට අරන් මොනවාද කියනවා“

“මොනවාද කියනවා කියන්නේ?“

“අනේ මන්දා“

“ඒත් ඒක දිහා බලාගෙන ඉන්නේ නම් දුකින් කියන්න මම දන්නවා“

අමායා ඈතින් එනවා දැකපු නිසාම ඔවුන් නිහඬ වුණා.

‘මුකුත් කිව්වේ නෑ නේද‘ අහන්න වගේ අමායා ඉසුරි දිහා බැලුවා.

ඉසුරිත් මුකුත් නොවුණ ගාණට හැසිරුණා.

“ඉතිං සර් අපි යමු ළමයිව බලලා ඉමු. එයාලාත් කැමති වෙයි එයාලාට මේ උදව් කරන කෙනාව බලාගන්න”

එහෙම කියපු අමායා ඉස්සර වුණා.

ළමයි හැමෝම එකතු වෙලා තිබුණේ මෙම ළමා නිවාසයේ තියෙන එළිමහන් ශාලාවකට.

“ආයුබෝවන් මැඩම්”

“ආයුබෝවන් මගේ ළමයි ටික”

“මේ ඉන්නේ නිම්සර දිද්දෙණිය සර්. ලංකාවේ ගොඩක් ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙක්”

“ඉතිං එයා කැමති ඔයාලට, අපිට, මේ ළමා නිවාසයට උදව් කරන්න. ඔයාලා හැමෝම මේ සර්ට ආයුබෝවන් කියන්න”

“ආයුබෝවන් සර්”

“මම කතා කරනවාට වඩා මම හිතන්නේ සර් කැමති වෙයි ඔයාලාට කතා කරන්න”

අමායා එහෙම කියලා නිම්සරට ඉඩ දුන්නා ළමයි අමතන්න.

සභාව ඉදිරියට ආවේ නිම්සර.

“ඔයාලා හැමෝටම සුබ සන්ධ්‍යාවක් කියලා මම ප්‍රාර්ථනා කරනවා“

“අද ඔයාලා එක්ක මෙහෙම ඉන්න ලැබුණ එක ගැන මට ඇත්තටම ගොඩක් සතුටුයි“

“මමත් ඔයාලා වගේම කෙනෙක්. මම ඉපදෙනකොටත් මගේ අම්මායි තාත්තයි හිටියේ නෑ“

අමායාගේ ඇස් පුදුමෙන් ලොකු වුණා.

“මාව බලාගත්තේ මගේ ආච්චි අම්මා. ආච්චි අම්මාත් හදිසියේම මාව දාලා ගියා මම ඔයාලගේ වයසේදි. මම උසස් පෙළ කරද්දි. ඉතිං එදා ඉඳන් මම තනි වුණා. මගේ නෑදෑයෝ මම දිහා බැලුවේ නෑ. මගේ යාළුවෝ මගේ ළඟ හිටියේ නෑ. ඒත් මම අධිෂ්ඨාන කරගත්තා කොහොම හරි මේ ජීවිතේ මම දිනනවා කියලා“

“ඔයාලා හැමෝටම දක්ෂතා ඇති, හීන ගොඩක් ඇති. මම හිතන්නේ ඔයාලගේ මැඩම්ගේ එකම

අධිෂ්ඨානෙන් ඔයාලට දීප්තිමත් අනාගතයක් නිර්මාණය කරන එක"

අමායා නිම්සර දිහාම බලාගෙන හිටියා. නිම්සර ඒක නෙත් කොණින් දැක්කාත් නොදැක්කා වගේ හිටියා.

"ජීවිතේ සමහර විට හරි අභියෝගාත්මකයි. හරි දුෂ්කරයි. ඒත් අපි ඒ දුෂ්කරතා වලට මුහුණ දෙන්න ඕනේ. තමන් ගැනම බලාපොරොත්තු තියාගන්න ඕනේ. තමන් ගැන විශ්වාස කරන්න ඕනේ. එහෙම වුණොත් ඔයාලා හැමෝටම ජීවිතේ ජයගන්න පුළුවන්"

"ලොකු හීන දකින්න. ඒ හීන සැබෑ කර ගන්න මහන්සි වෙලා වැඩ කරන්න. මම දන්නවා මෙතන ඉන්න හැම ළමයෙක්ම දක්ෂයි. වෛද්‍යවරයක්, ඉංජිනේරුවෙක්, ගුරුවරයක්, කලාකරුවෙක් නැත්තම් වෙන ඕනෑම කෙනෙක් වෙන්න ඔයාලට පුළුවන්"

"අධ්‍යාපනය කියන්නේ ජීවිතේ ගොඩක් වැදගත් දෙයක්"

"තේරුණා නේද ඔයාලා හැමෝටම"

"ඔව් සර්"

"මම අන්තිමට ඔයාලට දෙයක් කියන්නම්"

"ඔයාලා කොච්චර හොඳට ඉගෙන ගත්තත් කෝටිපතියෝ වුණත් මුල අමතක කරන්න එපා"

"ඔයාලාව මේ තත්වෙට ගෙනාපු ඔයාලගේ අම්මාව ඔයාලා අමතක කරන්න එපා කවදාවත්"

"මේ ඉන්නේ ඔයාලගේ ඒ අම්මා"

නිම්සර අමායාව පෙන්නුවා.

අමායා නිම්සරගේ මූණ දිහා බැලුවේ කඳුළු පිරුණු ඇස් වලින්.

"මොකද ඔයාලගේ අම්මා එයා. එයා ඔයාලා වෙනුවෙන් ගොඩක් කැපවෙනවා. එයාගේ එකම සතුටත් ඔයාලා හොඳ තැනක ඉන්නවා දකින එක නේද අමායා මැඩම්"

නිම්සර 'අමායා මැඩම්' කියද්දි අමායාගේ හිත හෙල්ලිලා ගියා.

"ඔයාලා මොන තැනක කොහොම හිටියත් ඔයාලගේ මැඩම්ව බලලා යන්න එන්න අමතක කරන්න එපා"

“තේරුණා නේද? මම කියපු දේවල් ඔළුවට ගියාද?”

“ඔව් සර්. අපි මැඩම්ට ගොඩක් ආදරෙයි”

“හොඳ ළමයි”

අමායාගේ ඇස් වලට කඳුළු පිරිලා ඒවා දිලිසෙන්න ගත්තා.

නිම්සරත් එක්ක ළමයි හරි හරියට කතාව. වෙලාව යනවා තේරුණේවත් නැති තරම්.

නිම්සර මේ ළමා නිවාසය වෙනුවෙන් කරපු ආධාර මුදලත් අමායා අතට භාර දුන්නා.

“ගොඩක් ස්තූතියි සර්. සර් කිව්වා වගේම මේකේ ඉන්න ළමයි හැමෝටම හොඳට උගන්වලා හොඳ තැන්වල ඉන්නවා දකින්නයි මට ඕනේ”

“ඒ වෙනුවෙන් මේ කරපු පරිත්‍යාගයට ගොඩක් පින්”

අමායා නිම්සරගේ ඒ ඇස් දිහා බලාගෙනම කිව්වා.

“හොඳටම හවස් වුණා. අපි යමු නේද ලක්ෂිත. ඉන්න තැනක් හොයා ගන්නත් ඕනේනේ”

"සර්ලාට ප්‍රශ්නයක් නැත්තම් මේ ළඟ මම ඉන්නේ. එහේ නවතින්න පුළුවන්"

තවමත් අමායාවත් නිම්සරවත් ඉස්සර වගේ කතා කළේ නෑ.

නිම්සරටත් ඕනේ වුණේ අමායාව තනි කරගෙන මේ වුණු දේවල් අහන්න. ඉතිං ඒකට හොඳම අවස්ථාව අමායාගේ යෝජනාවට කැමති වෙන එක. ඒත් එකපාර කැමති වුණාම ඒකත් පිරිමිකමට මදිකමක්නේ.

"එහෙනම් අපි එහේ ඉමු නිමා"

නිම්සර මුකුත් කියන්න කලින්ම ලක්ෂිත එහෙම කිව්වේ නිම්සරත් අමායාත් දෙන්නාම මේ නොදන්නවා වගේ හැසිරෙන එක නැති කරන්න ඕන නිසා.

"අපි එන එක කරදරයක්ද දන්නේ නෑ"

"අනේ නෑ නිම්සර සර්. මමයි ඉසුරි විතරයි එහේ ඉන්නේ"

"මම වාහනේ අරගෙන එන්නම්. ඉසුරි සර්ලා එක්ක ඉස්සරහාට එන්නකෝ"

නිම්සරට නම් පුදුමෙකුත් දැනුණා.

අමායා එතනින් ගියේ එයාගේ වාහනේ අරගෙන එන්න.

"අපේ මැඩම් හරි කරුණාවන්තයි වගේම හරි උත්සාහවන්තයි"

"එයා ඉස්සරත් එහෙම තමා"

කල්පනාවෙන් හිටපු නිම්සරට කියවුණේ මොකද්ද කියලා තේරෙනකොට ඉසුරිටත් ලක්ෂිතටත් ඒ දේවල් ඇහිලා ඉවරයි.

"මම දැනගත්තා නිමා මේ උඹේ අර නෙලා ගන්න බැරිවුණු මල කියලා"

"ඔව් බං ඔව් ඒ මගේ අමායා තමයි"

"හැබැයි මේ පාර මම ඒ මල නෙලාගන්නවා"

"එල මචං එල... අපේ ෆුල් සප් එක උඹට"

"අපේ නිමාට ජය වේවා... අපේ නිමාට ජය වේවා..."

ලක්ෂිත කෑගහනවා.

"උමේ ඔය හැකර කට වහගනින් ලක්ෂිත"

“මෙන්න බලපංකෝ් ඉතිං ඉසුරි නංගි දැන් අපේ කටවල් හැකර කටවල් වෙලා“

නිම්සර මුකුත් නොවුණ ගාණට හැඟීම් පාලනය කරගෙන හිටියාට හිත ඇතුළේ පුපුරන්න ඔන්න මෙන්න තියෙන හැඟීම් කන්දරාව මහා විශාලයි.

“අපි යමු. වාහනේ පස්සෙන් එන්න“

අමායා රතු පාට නවීන පන්නයේ වාහනයක් තනිවම පැදගෙන එද්දි නිම්සරට සතුටු හිතුණා වගේම පුදුමෙකුත් ආවා.

අමායා මෙතෙන්ට ආවේ කොහොමද කියලා දැනගන්න නිම්සරගේ හිතේ ලොකු ආසාවක් ඇති වුණා.

## *19 වන දිගහැරුම*

නිම්සර, ලක්ෂිත, ඉසුරි, අමායා හැමෝම ඇතුළු වුණේ හරිම ලස්සන සරල තට්ටු දෙකක නිවසකට.

දොරෙන් ඇතුල් වෙද්දිම නිම්සරගේ හිත ගැටුණු ඡායාරූප නිම්සරව පුදුමෙන් පුදුමෙට පත් කළා.

අමායා විසින් විදේශ විශ්ව විද්‍යාලයක උපාධි ප්‍රධානෝත්සවයක දී සහතිකය ලබා ගන්නා අයුරු දැක්වෙන ඡායාරූපයක් විශාල කර බිත්තියේ එල්ලා තිබුණා.

ඊට පසෙකින් තම මවගේ මල් මාලයක් දැමූ කළු සුදු ඡායාරූපයක්ද එල්ලා තිබුණා. ඊටත් එහායින් තිබුණු පින්තූරය දැකපු නිම්සරගේ ඇස් ඊටත් වඩා පුදුමෙන් ලොකු වුණා.

"සංඛ"

නිම්සරගේ හිත ගොඩක් කැළඹුණා.

"අමායා කතා කරනවා. සංඛ තමුන්ගේ කව්ද?"

අමායා සද්ද නෑ.

නිම්සර අමායාගේ උරහිස් වලින් අල්ල ගත්තේ රිදෙන තරම් හයියෙන්.

"අමායා මම තමුන්ගෙන් ප්‍රශ්නයක් ඇහුවා. සංඛ තමුන්ගේ කව්ද"

අමායාගේ ජීවිතේම වුණේ තමන්ගේ අම්මාත්, මල්ලිත්. ඉතිං මල්ලිගේ මුහුණු පොතෙන් ගත්තු ඡායාරූපයක් අමායා විශාල කරලා බිත්තියේ ගහලා තිබුණා.

තමන්ගේ මල්ලි ඇයව අතඇරලා දැම්මත් අදටත් ඇයගේ සහෝදර ප්‍රේමය නැති වෙලා නෑ.

"අමායා මාව කේන්ති කරන්න එපා. කතා කරන්න"

"එදා ඔයාලා දෙන්නා මූණෙන් මූණ බලාගෙන ඉද්දිත් මම ඇහුවා ඔයාලා අඳුරනවාද කියලා"

"ඔයා නෑම කිව්වා"

"අද ඔයාගේ ගෙදර එයාගේ ෆොටෝ එකක්"

"මට කියන්න අමායා. ප්ලීස්. මේ ඔයාගේ කව්ද"

"මගේ මල්ලි සර්"

sinhalaebooks.com

අමායා බිම බලාගෙන කියලා දැම්මා.

නිම්සර අමායාව අතඇරලා දාලා ඔළුවේ අත තියාගත්තා.

"එතකොට එදා මම එයාට බනිද්දි ඒක නැවැත්තුවේ ඒකයි"

"ඒත් එදා එයා ඔයාට...."

"ඇයි මට මේ දේවල් කිව්වේ නැත්තේ අමායා ඇයි"

නිම්සර කියවනවා.

"එදා මම හිටපු තත්වෙට මගේ මල්ලිට මාව ගැලපුණේ නෑනේ සර්"

"ඉතිං මම කොහොමද මේ මගේ මල්ලි කියලා එයාට ලැජ්ජා කරන්නේ"

"සර් මට පොරොන්දු වෙන්න කවදාවත් මල්ලිගෙන් මේ ගැන අහන්නේ නෑ කියලා"

"නිම්සර සර් කියන්නකෝ. අහන්නේ නෑ නේද"

"හරි මම අහන්නේ නෑ. ඒත්...."

"සර් දැන් මේ කතාව ඇති. උදේ ඉඳන් ඇවිත් මහන්සි නේද"

“නිම්සර සර්, ලක්ෂිත සර් ඉසුරි ඔයාලගේ කාමර පෙන්නයි. වොෂ් එකක් දාගෙන පහළට එන්න. මම ඉක්මණට කෑම ලෑස්ති කරන්නම්“

අමායාගේ හිත ඇතුලෙත් එකම කලබලයක්.

‘එයා පොඩ්ඩක්වත් වෙනස් වෙලා නෑ. මම එදා යනකොට හිටපු විදියමයි අදත්‘

‘මම එයාගේ ආසාව ඉෂ්ට කළා‘

‘නිම්සරට කෙනෙක් ඇති ද දැන්. නැතුව ඇති ඒකනේ ලක්ෂිත කිව්වේ එයාව මතක් වෙන්න මේ දේවල් කරනවා කියලා. ඔයා මට මෙච්චරටම ආදරේ කළාද නිම්සර‘

“ආහ්.....“

අමායා වෙන කල්පනාවක හිටියේ උයන ගමන්.

“අයියෝ මැඩම් මොකද්ද වුණේ“

“අත කපා ගත්තා නේද“

ඉසුරි ඉක්මණට ඇඟිල්ලට ප්ලාස්ටරයක් දැම්මා.

“මැඩම් ඒක නෙමෙයි.. මැඩම්ගේ නිම්සර නම් මාර හැන්ඩ් ආ“

"මගේ නිම්සර? කව්ද දැන් එහෙම කිව්වේ"

"වෙන කව්රුත් කිව්වේ නෑ. මැඩම්ගේ ඇස් දෙක කිව්වේ"

"අනේ මේ ඉසුරි පැහෙන්නේ නැතුව ඉක්මණට උයන්න උදව් කරනවාද?"

"හරි හරි. ඇත්ත ඉතිං තිත්තයි තමා"

"එයා නම් දැන් බැඳලත් ඇති ඉසුරි"

"නැහැ එයා බැඳලත් නෑ"

"ඔයා කොහොමද දන්නේ"

"මම අහගත්තා"

"මේ ටිකට ඒවාත් හොයලා. මෙහේ ග්‍රාම සේවකකම අරගෙන දෙන්න ඕනේ"

දෙන්නාම හිනා වුණා.

..........................................................

"සර් කෑම කමු"

"ඔයාට ගොඩක් මහන්සි වෙන්න වුණා නේද"

“අනේ මොන මහන්සියක්ද සර්. සර් මං වෙනුවෙන් කොච්චර දේවල් කරලා තියෙනවාද?“

ලක්ෂිතත් ඉසුරිත් මූණෙන් මූණ බලාගෙන හිනා වුණා.

දෙන්නාටම දැන් ස්ථිරයි හිතේ තිබුණු හැමදේම.

“සර්ලා කන්නකෝ“

“ඔයාලත් කන්න“

අමායාත් නිම්සරත් ඉසුරිත් ලක්ෂිත් හරිම සතුටින් එකට ඉඳගෙන කෑම ගත්තා.

“රසයි කෑම“

“අපේ මැඩම්ගේ අත් ගුණේ තමා ඉතිං“

නිම්සරත් ලක්ෂිතත් කෑම අරගෙන ඉවරවෙලා එළිමහනට ආවේ ටිකක් නිදහසේ වටපිටාව විඳින්න.

ඒ අතරේ අමායාත් ඉසුරිත් අස්පස් කරලා ඒ දෙන්නාත් එළියට ආවා.

...............................................

"උඹ දැන්වත් අපිට හංගන්න දෙයක් නෑ. අමායා එක්ක කතා කරපන්"

"ඇයි තවත් ඔහොම ඉන්නේ"

"මේ පාරත් පුළුවන් නම් අතඇරගෙන කොළඹ ගිහින් විරවාගෙන හිටපන්"

"මට කේන්ති බං. මට කරපු දේට ඇත්තමයි වෙලාවකට. දෙන්න හිතෙනවා..."

"කිස් එකක් ද"

නිම්සර ලක්ෂිතගේ කණට කරලා කුණුහරපයක් කිව්වේ ඊට වඩා ඒ වෙලාවේ කියන්න වචනයක් කටට ආවේ නැති නිසා"

නිම්සර අමායා ළඟට ආවා.

"අමායා"

"සර්"

"පින් සිද්ද වෙයි දැන්වත් ඔය සර් සර් කියන එක නවත්තලා දාන්න. මට දැන් ඕක අහලා ඇති වෙලා"

“පිහියෙන් අනිනවා වගේ හැමවෙලේම සර් සර් කියනවා”

නිම්සර හඩින් ඒක කියපු නිසා ඉසුරි ලක්ෂිතත් මේ දේවල් අහගෙන.

ලක්ෂිතත් ඉසුරිත් ගේ ඇතුළට ගියේ නිම්සරටත් අමායාටත් තනි වෙන්න ඉඩ දීලා.

“කියන්න මේ දේවල් වුණේ කොහොමද කියලා ආමායා. ඇයි මට මැරුණා කියලා බොරු කිව්වේ. දැන්වත් කියන්න”

“මම බොරු කිව්වේ නෑ සර්. මම ඇත්තටම එදා ඒ වගේ තීරණේක තමා හිටියේ. මොකද මම නිසා සර්ට වෙන අවනම්බුවට මම කැමති වුණේ නෑ”

“ආයේමත් සර් සර් කියනවා”

නිම්සරට කේන්තියි.

“මට ඒක නොකියා ඉන්න පුරුදු නෑ සර්”

“මම මැරෙනවා කියලා හිතාගෙන ආවත් මගේ හිත මට ඒකට ඉඩ දුන්නේ නෑ සර්”

“මම කොළඹින් බස් එකට නැග්ගේ ඒකේ බෝඩ් එකවත් බලලා නෙමෙයි”

“බස් එකේ අන්තිම තැනට මම ටිකට් ගත්තා. මම නැගලා තිබුණේ දෙහිඅත්තකණ්ඩිය බස් එකකට“

“දෙහිඅත්තකණ්ඩියෙන් බැහැලා මම කඩේකට වෙලා තේ බිව්වා. එතනින් එහාට මොනවා කරන්නද කියලා මට අදහසක් තිබුණේ නෑ සර්“

“මම තනියම කඩේ ඉද්දි කොල්ලෝ කට්ටියක් ඇවිත් මට විහිළු කරන්න ගත්තා“

“ඒත් මම මට නෙමෙයි වගේ හිටියා“

“මට එහෙම විහිළු කරනවා එතන හිටපු ඇන්ටි කෙනෙක් දැකලා එයා මාවත් එක්කගෙන පාරට ආවා“

“මගෙන් විස්තර අහලා එයා මාව එයාගේ ගෙදරට එක්කගෙන ආවා. එයායි එයාගේ මහත්තයායි විතරයි මෙහේ හිටියේ. එයාගේ පුතා හිටියේ රට“

“එයාගේ ගෙදර තමයි දැන් මේ ළමා නිවාසේ“

“එයාලට මොකද වුණේ අමායා“

"මගේ ගැන හැම විස්තරයක්ම අහලා එයාලා මං ගැන ඇත්තටම අනුකම්පා කළා. මගේ හිතේ ඒ වෙලාවේ තිබුණ පීඩනේ නිසාම මම මට වුණ හැමදෙයක්ම එයාලට කියලා දැම්මා"

"එයාලා මගෙන් ඇහුවා ඉගෙන ගන්න කැමතිද කියලා"

"මට ඕනේ වුණා කෙනෙක්ගේ ආසාව ඉෂ්ට කරන්න"

අමායා නිම්සරගේ ඇස් දිහා බැලුවා. විනාඩි ගාණක් ගත වෙන්න ඇති. අමායා ඒ ඇස් වලින් මිදිලා ආයේමත් කතාව පටන් ගත්තා.

"ඉතින් මම මාස හයකින් මහන්සි වෙලා උසස් පෙළ කළා"

"මෙහේ කැම්පස් යන්න නම් මට ලකුණු මදි වුණා"

"ඒ වුණාට මාව මෙහේ බලාගත්තු ඇන්ටිම මට පිටරට ඉගෙන ගන්න අවස්ථාවක් අරන් දුන්නා එයාගේ පුතාගේ මාර්ගෙන්. ඒක ශිෂ්‍යත්වයක් නිසා මට නොමිලේ ඉගෙන ගන්න අවස්ථාව හම්බුණා"

"අමායා ඔයයි එයයි එතකොට...."

නිම්සරට හිතුණේ අමායායි එයයි අතර සම්බන්ධයක්වත් ඇත්දෝ කියලා.

"නෑ. එයාගේම සහෝදරියකට වගේ එයා මට උදව් කළා. හරිම හොඳ මහත්තයෙක් එයා"

"ඉගෙන ගන්න වියදමක් ගියේ නැති නිසා මම එහෙදි පාර්ට් ටයිම් ජොබ්ස් දෙකක් කළා. ගොඩක් මහන්සි වෙලා සල්ලි ඉතුරු කර ගත්තා"

"ළමා නිවාසේ තියෙන ගොඩනැගිල්ල මාව බලාගත්තු ඇන්ටි මගේ නමට ලියලා තිබුණේ මම පිටරට ඉද්දිම තමා"

"මේ ඉඩම මම එයාලගෙන් සල්ලි දීලා ගත්තු එකක්. එයාලා නම් කැමති වුණේම නෑ සල්ලි දීලා ඒක ගන්නවාට. එයාට ඕනේ වුණේ මේ ඉඩමත් මගේ නමට ලියලා දෙන්න. ඒත් මම බලෙන්ම සල්ලි දීලා ඉඩම එයාලගෙන් ගත්තා"

"මේ ගෙදර, වාහනේ මමම හම්බකරපු සල්ලි වලින් ගත්ත ඒවා"

"ඒ ඇන්ටි, අංකල් එක්කම එයාගේ පුතා ළඟට ගියා"

“මගේ ජීවිතේ මම ලබපු අත්දැකීම් එක්ක මට හිතුණා මේ වගේ ළමයින්ට පිහිටක් වෙන්න පුළුවන් නම් හොඳයි කියලා“

“ඉතිං මම තනියම මේ වැඩේ කරන්න පටන් ගත්තා“

“දැන් නම් මට ඉසුරි මේකට ගොඩක් උදව් කරනවා. තව කීපදෙනෙකුත් වැඩ කරනවා“

“සර්ලාගේ ආධාර වලින් ළමයින්ට හොඳට උගන්වනවා, ගුරුවරුන්ට පඩි දෙනවා“

“මම පොඩියට ඇඳුම් ව්‍යාපාරෙකුත් කරගෙන යනවා ටවුන් එකේම. ඒකේනුත් මට සල්ලි හම්බෙනවා. ඒවත් ඉතිං මේ ළමයින්ටම තමා“

“දැන් මගේ ජීවිතේ මේ ළමයි තමා සර්“

“සර් ටිකක් ඉන්න මම තේ හදාගෙන එන්නම්“

## අවසන් දිගහැරුම

“අමායා...”

නිම්සර යන්න ගියපු අමායාගේ අතින් අල්ලගෙන නවත්තගත්තා.

“සර්....”

“දැන්වත් සර් කියන එක නවත්තන්න අමායා. මම වැදලා කියන්නම්”

“මට බෑ තවත් මේ දේවල් හිතේ හිර කරන් ඉන්න”

“ඔයා මාව දාලා ගියා කිසිම හිතක් පපුවක් නැති ගාණට”

“මම හිතුවේ ඔයා මැරුණා කියලා”

“මම කොච්චර දුක් වුණාද කියලා දන්නවාද ඔයා මැරුණා කියලා හිතාගෙන”

“මම කොහොමද හිත හදාගත්තේ කියලා හිතුවාද”

නිම්සර අමායාගේ උරහිස් රිදෙන තරමට අල්ලගෙන කියවගෙන කියවගෙන යනවා.

“ලක්ෂිතගෙන් අහනවා මම ශානුට තුවාල වෙනකම් ගැහුවා. ඒ තමුන්ව මරා ගත්තේ උඹ කියලා හිතුණ නිසා“

“ඇයි මට මෙහෙම කළේ“

අමායා බය වෙලා වගේ මේ දේවල් අහගෙන ඉන්නවා.

“කතා කරන්න අමායා. දැන්වත් කතා කරන්න. තවත් මාව පිස්සෙක් කරන්න එපා“

“මම දවල් ඉඳන්ම ඔයාව දැකපු වෙලාවේ ඉඳලාම පුදුම ඉවසීමකින් මේ ඉන්නේ ඇත්තමයි“

“මාත් මනුස්සයෙක් අමායා“

“මට මෙහෙම කරන්න එපා“

“දැන්වත් මට ආදරේ කරන්න අමායා“

“දැන්වත් ආදරේ කරන්න“

“මට අනිත් කිසි දෙයක් වැඩක් නෑ. ඒක ඔයා දන්නවා. ඒක එදත් එහෙමයි. අදත් එහෙමයි“

“නිම්සර සර් මේ අහන්...“

“ෂ්ෂ්ෂ්“

නිම්සර අමායාගේ දෙතොලට ඇඟිල්ල තියලා ඇගේ කතාව නැවැත්තුවා.

අමායාගේ සිරුර පුරා විදුලියක් යනවා වගේ අමායාට දැණුනේ නිම්සරගේ ඇස් දැක්කාහාම. ඒ ඇස් වල පිරෙන්න ආදරේ තිබුණා.

"මට මුකුත් අහන්න ඕනේ නෑ. ඔයා මට ආදරේද නැද්ද"

"ඇයි මාව තේරුම්ගන්නේ නැත්තේ. මම එදා කියපු දේම තමා අදත් කියන්නේ. මාව ඔයාට ගැලපෙන්නේ නෑ"

"ඇයි ගැලපෙන්නේ නැත්තේ. මට සල්ලි තියෙන නිසාද? මම මගේ මේ හැමදෙයක්ම අතඅරින්නම්. එතකොටවත් මට ආදරේ කරනවාද අමායා ඔයා"

අමායා හොඳටම අඬනවා.

නිම්සරට දුක හිතුණා. නිම්සර අමායාගේ ළඟටම ගියා. ගොඩක් ළඟට ගියා.

දෙන්නාගේම සුසුම්වල උණුසුම දෙන්නාටම දැණුනා.

නිම්සර අමායාගේ ඇස් දිහාම බලාගෙන හිටියත් අමායාට ඒ බැල්ම දරා ගන්න බැරි වුණා. අමායා බිම බලාගත්තා.

නිම්සර අමායාගේ නිකටින් අල්ලලා තමන්ගේ ඇස් මායිමේ රඳවගත්තා.

"ඇයි ඔයාගේ කටින්ම මට ආදරෙයි කියන්නේ නැත්තේ අමායා. ඇයි තවත් හිතේ හිර කරන් ඉන්නේ. මට ඕනේ ඔයාගේ කටින්ම ඒ වචන ටික අහගන්න"

"සමාජෙට ඕන දේවල් අපිට කරන්න බෑ. මේ සමාජෙ මිනිස්සු අපි හොඳක් කලත් නරකක් කලත් ඒකේ ඇදයක් දකිනවාමයි අමායා"

අමායාගේ අතීතේ හරි දුක්බරයි. අද අමායා මේ තත්වෙන් හිටියාත් කවදාම හරි දවසක ශානු අතින් අනාථ වුණු කෙල්ලෙක් බව මේ ලෝකෙම දැනගන්න පුළුවන්.

අදටත් අමායා හිතන්නේ නිම්සර ගැන. ඇය නිම්සරට ආදරේ කලේ කවදා කොහොමද කොතනද කියන්න ඇය දන්නේ නෑ.

ඒත් ඇය ඔහුට ආදරේ හදවතින්මයි. ලෝකෙට පෙන්නගෙන කරන ආදරේට වඩා හිත ඇතුලේ හංගගෙන කරන ආදරේ වැඩිය බලවත් කියලා කියමනකුත් තියෙනවානේ. ඉතිං අමායාත් අද වෙනතුරුත් නිම්සරට ආදරෙයි. ඒත් ඒක කියාගන්න බැරුව ලතවෙන තරම දන්නෙත් අමායා විතරමයි.

"අමායා..."

අමායාගේ කල්පනා ලෝකේ බිඳුණා.

"මට කියන්න ඇයි ඔයා මේ ළමා නිවාසෙට නිම්සර කියලා නම දැම්මේ"

අමායා කතාවක් නෑ.

"ඒ ඔයා මට ආදරේ නිසා. මාව හැමදාම ඔයාගේ හිතේ තියාගන්න ඕන නිසා. අදටත් ඔයා මට ආදරේ කරන නිසා. එහෙම නේද අමායා"

"එහෙම නෑ. මට වෙන නමක් මතක් වුණේ නෑ. ඒකයි ඒ නම දැම්මේ"

"ආ... ඇත්තද?"

නිම්සර හෙමිහිට අමායාගේ බෙල්ලේ තියෙන රන් චේන් පටට අමුණලා තියෙන පෙන්ඩන්ට් එක ඔහුගේ අත්ලේ රඳවා ගත්තා.

"මට ආදරේ නොකරන නිසාද එතකොට මගේ නම දාපු පෙන්ඩන්ට් එක දාන්නෙත්"

අමායාට කට උත්තර නෑ.

'නිම්සර කොහොමද ඒක දැනගත්තේ'

'ඉසුරි කියන්න ඇති'

නිම්සර අමායාව ඔහුගේ දෑතට මැදි කරගත්තා.

නිම්සරගේ දෙතොල් අමායාගේ දෙතොල් මානෙට එද්දි ඇගේ ඇස් ඉබේම පියවුණා.

ජීවිතේ පළවෙනි වතාවට විඳපු, කිසිම හැඟීමක් නැති රළු සිපගැනීම් වෙනුවට ආදරණීය දෙතොල් පහසක් විඳගන්න අමායාට පුළුවන් වුණා.

දෙතොල් මුදා ගත්තු අමායා බිම බලාගෙනම හිටියේ නිම්සරගේ මූණ දිහා බලන්න ලැජ්ජා හිතුණු නිසා.

"මෙයාගේ ලැජ්ජාව බලන්නකෝ"

“ලැජ්ජාව පැත්තක තියලා මාව බඳින්න ලෑස්ති වෙනවා තේරුණාද? නැත්තම් ආයේත් මාව දාලා යයි“

“බෑ මම යනවා“

අමායා නිම්සරගෙන් ගැලවිලා දුවගෙන ගියේ ඇගේ කාමරයට. නිම්සරත් ඇගේ පස්සෙන්ම කාමරය දිහාවට ඇදුණේ කාටත් හොරා.

“ආ ඇත්තද? ඉන්නවකෝ මම අද මාව ආයේ දාලා යන්න බැරි වෙන්නම වැඩක් කරන්න. එතකොට ඉදිනේ පාඩුවේ“

අමායාගෙත් නිම්සරගෙත් ආදර කතාව සම්පූර්ණ වුණේ ඔන්න ඔහොමයි...

තරු පෙළ ගැසෙන ලෝකයේ,
දෙවෝපගතව ආත්ම දෙකක් හමු විය...
ඉදින් ඔවුන්ගේ හදවත් පැටලී ගියහ...
හිරු උදාවේ සහ රාත්‍රී වර්ෂාව පුරා
ඔවුන් ඔවුන්ගේ සතුට බෙදා ගත්හ...
ඔවුන් ඔවුන්ගේ වේදනාව බෙදා ගත්හ...
සෑම සිනහවකම, සෑම ආතතියකම
ඔවුන්ගේ බැඳීම ශක්තිමත් විය...
ඔවුන්ගේ ආදරය අසමසම විය....
මෘදු ස්පර්ශයකින් සහ මෘදු හාදුවකින්
ඔවුන් ඔවුන්ගේ සතුට සොයා ගත්හ....
එකිනෙකාගේ ස්පර්ශයෙන් ඔවුන් ඔවුන්ගේ
ආශාවන් සොයා ගත්හ....
ආදරය මග හැරිය නොහැකි වූහ....
ඉතින් මේ ආදරය වැලඳගැනීමේ කතාවේ
දෙහදක් ඔවුන්ට හිමි ස්ථානය සොයා ගත්හ...
කාලය හා අවකාශය ඇති ලෝකයක
ඔවුන්ගේ නිමක් නැති ආදරය කිසිදා අඩු
නොවීය...
අඳුරුතම රාත්‍රියේ පහනක් බඳු ආදරයේ
නොනිමෙන දීප්තිමත් ආලෝක මායාව
අමායා නිම්සර...

සමාප්තයි!!!